(Dr. Colvin R. de Silva)

Perhaps she did not know of the Rs. 150!

ගරු චම්ලි ගුණවර්ධන
(கௌரவ சம்லி குணவர்தன)
(The Hon. Cholmondeley Goonewardene)

That is indirect representation. The period of disqualification is over and he is now back in the Municipal Council.

ඩඩ්ලි සේනානායක මයා.
(திரு. டட்லி சேனனுயக்க)
(Mr. Dudley Senanayake)

No.

ගරු චම්ලි ගුණවර්ධන
(கௌரவ சம்லி குணவர்தன)
(The Hon. Cholmondeley Goonewardene)

I am subject to correction there.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

No, he is not a member.

ගරු චම්ලි ගුණවර්ධන
(கௌரவ சம்லி குணவர்தன)
(The Hon. Cholmondeley Goonewardene)

The U. N. P. in its heyday had its contact men. They had their contact men round the House. I do not want to mention names. Some of them are not living now ; the leader of that gang of men is not living, and it will not be fair to mention names.

We of the L. S. S. P. had to fight against heavy odds at elections and by-elections. Actually one might say that the U. N. P. ruled not from 1947 but from 1931. The same set of people carried on from 1931. It was the same set of people, whether they called themselves Independents or members of the Ceylon National Congress. I think the hon. Member for Avissawella (Mr. D. P. R. Gunawardena) agrees with me. It was really a continuation of the same persons.

They formed the Ceylon National Congress and later there was formed the United National Party. The hon. First Member for Colombo South (Mr. J. R. Jayewardene) entered the National Congress. People thought he was progressive at that time, so much so that I invited him to a meeting at Kalutara. I do not know whether he remembers the occasion. The meeting was held at Gnanodaya College in 1940, and on that occasion he paid a tribute to the L. S. S. P. At that time our leaders were in jail—the hon. Member for Avissawella, the hon. Member for Dehiwala-Mt. Lavinia (Dr. Colvin R. de Silva), the hon. Member for Yatiyantota (Dr. N. M. Perera) and the hon. Member for Bulathsinhala (Mr. Edmund Samarakkody). They were in jail and the hon. Member for Panadura (Mr. Leslie Goonewardene) was on party orders working underground. And I can remember the hon. Member for Colombo South paid a tribute to the Lanka Sama Samaja Party as the only party that was waging the fight against British imperialism.

ජේ. ආර්. ජයවර්ධන මයා. (දකුණු කොළඹ පළමුවන මන්ත්‍රී)
(திரு. ஜே. ஆர். ஜயவர்தன—கொழும்புத் தெற்கு முதலாம் அங்கத்தவர்)
(Mr. J. R. Jayewardene—First Colombo South)

We moved for their release, and the Communist Party opposed it.

ගරු චම්ලි ගුණවර්ධන
(கௌரவ சம்லி குணவர்தன)
(The Hon. Cholmondeley Goonewardene)

That, of course, I do not know. You will have to settle it with my Friends in the Communist Party.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

The representatives in the Congress, in this House—

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)

That is right. They were for keeping us in.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

But we were for their release. We went to see them in jail. We moved Resolutions in this House and in the Congress, and it was the Communist Party who opposed it.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(டொக்டர் கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

It shows that many people have had an unregenerate past.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු චම්ලි ගුණවර්ධන
(கௌரவ சம்னி குணவர்தன)
(The Hon. Cholmondeley Goonewardene)

As the hon. Member for Avissawella mentioned, their leader, the late Mr. D. S. Senanayake, never moved for their release. I can very well remember that because in the Kalutara Urban Council, the only forum we had, every year—I do not know whether the hon. Member for Avissawella would remember it—I moved a resolution demanding the release of the detenus. Within the framework of the legislation then existing that was all we could do, for that was the only forum we had, and we passed those resolutions unanimously. I can remember how subsequently, during the latter stages of the war, there were certain Members like the hon. First Member for Colombo South, even the hon. Member for Dedigama, the then Member for Panadura—he played a very leading part and I must pay him a tribute—and also the then Member for Kandy, the late Mr. George E. de Silva, who certainly played a part in demanding the release of the detenus.

ඒ. රත්නායක මයා.
(திரு. ஏ. ரத்ஞயக்க)
(Mr. A. Ratnayake)

All of us.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(டொக்டர் கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

Not you ! Not you !

ඒ. රත්නායක මයා.
(திரு. ஏ. ரத்ஞயக்க)
(Mr. A. Ratnayake)

Why not ? I visited you in jail on more than three occasions.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(டொக்டர் கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

I do not deny that. I always welcomed those visits and I honour all hon. Members who paid us visits.

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)

Will the Hon. Minister continue his speech after lunch ?

ගරු චම්ලි ගුණවර්ධන
(கௌரவ சம்னி குணவர்தன)
(The Hon. Cholmondeley Goonewardene)

Yes, Sir.

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)

The Sitting is suspended till 2 P.M.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ. භා. 2 ට කාරක සභා නියෝජ්‍ය සභාපති තැන්පත් අයි. ඒ. කාදර් මහතාගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදි.

ගරු චම්ලි ගුණවර්ධන
(கௌரவ சம்னி குணவர்தன)
(The Hon. Cholmondeley Goonewardene)

Mr. Deputy Chairman, when we adjourned we were going into the history of some of the political parties. Before continuing on that point, I wish to refer to a matter that will concern all Members of this House. As I mentioned earlier, I have appointed a Continuing Committee of Inquiry—a one man committee—to inquire into all allegations of corruption and waste in the Public Works Department. I appeal to all hon. Members, if there are any allegations they want to make of that nature, to send them on to the Committee. I also appeal to the trade unions not to interfere in disciplinary transfers and I am happy to note that when transfers are ordered on disciplinary grounds they generally do not interfere. I am making a similar appeal to hon. Members and I am sure they will respond.

When we adjourned we were talking of the political past of hon. Members of this House. If I may be permittted, I would like to mention that I joined the Lanka Sama Samaj Party in the year 1937. Before I joined the Lanka Sama Samaj Party,

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු චම්ලි ගුණවර්ධන]

in the early thirties I was attracted by the speeches made in the first State Council by the late Mr. S. W. R. D. Bandaranaike when I was a student at St. Thomas' College, Mount Lavinia. Subsequently, with the arrival of the Sama Samaj leaders and particularly with the entry of the hon. Member for Yatiyantota (Dr. N. M. Perera), who was at that time the hon. Member for Ruwanwella, and the hon. Member for Avissawella (Mr. D. P. R. Gunawardena), I became attracted towards the Lanka Sama Samaj Party.

It will make very interesting reading and I think all hon. Members of this House should try and read the speeches which were made by the two hon. Members during that period in the second State Council. I think a good amount of even the social legislation of today is due to the foundation that was laid during that period.

I can remember the hon. Member for Yatiyantota used to come prepared on practically every subject that came up before the House. The hon. Member for Avissawella generally reserved his voice for the bigger occasions. They made a very distinct contribution not only to the debates but to the public life of this country, to the welfare of the working people and to the advancement of the socialist movement. I think all students of history and of politics and all politicians would do well to read those speeches. I can remember, during that period when the State Council was sitting, as I got up in the morning the first thing I used to do was to go through the proceedings, particularly the speeches of the two hon. Members. Later they were joined by the hon. Member for Hambantota (the late Mr. D. M. Rajapaksa) who also made, in his own way, a contribution to the socialist movement. I can remember at that time that, though the party had just been formed and the representation in the State Council was small, their influence on the country at large was quite out of proportion to their representation in the State Council. Quite comparable with the present situation.

I can remember the occasion when as a result of propaganda carried on against the second world war—which we characterized as an imperialist war—even the hon. Member for Dedigama, now the hon. Leader of the Opposition, on one occasion voted against the granting of funds for the war. He voted with the hon. Members for Yatiyantota and Avissawella. Subsequently he withdrew from that position and went on to support the imperialist war effort.

I am referring to the past because the past will help hon. Members to judge the protestations of the U.N.P. with regard to their so-called faith in and their allegiance to the democratic process. Those were times when it was difficult even to hold public meetings. Some hon. Members might recall the famous meetings at Bulathkohupitiya and Homagama where there were even stabbing incidents. The reactionaries got together and attempted to smash the L.S.S.P. and prevent it from holding meetings but the L.S.S.P. fought back and the meetings were held and the movement carried on

There is talk of interference with the course of justice. There are so many ways of interfering with the course of justice. I think the worst form of interference with the course of justice is the framing of false charges against a person. I have been "framed" on two occasions—on both occasions by supporters of the U.N.P. On the first occasion the U.N.P. had not been formed but the right-wing conservative elements were there; they were the people who subsequently formed the U.N.P.

In the course of a strike of urban council labourers there was a false charge framed against me of criminal intimidation by a former bus magnate, a wellknown personality. He specializes in framing false charges—particularly in framing false charges of criminal intimidation. Mr. Deputy Chairman, with your wide experience in the courts, you know how easy it is to prove a

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

charge of criminal intimidation. One man says something, another man corroborates, and the accused is convicted. I was fortunate and was fined only Rs. 10. Not so the hon. Member for Avissawella who got three months' rigorous imprisonment which disqualified him from standing for elections for seven years. In that charge too the same person had a hand.

In that case I was defended by no less a person than Mr. Advocate Nadesan ably assisted by the former Member for Ambalangoda, Mr. P. H. W. de Silva. They did their best but I was convicted. I really think it was a political conviction. At that time the war was on and even the fact that I was wearing a red tie was sufficient to convict me. Later on I met the judge who tried me—he had already retired—and he told me that he had grave doubts with regard to the evidence in that case and was extremely sorry that he had convicted me. The political climate was such at the time that he had no alternative but to convict me.

Again I was " framed " during the *hartal* of August 1952, to which I must refer because today we are on the eve of celebrating the eleventh anniversary of that *hartal*, which was organized by the L. S. S. P., the Communist Party and I think the V. L. S. S. P. In that case I referred to the fact that there was interference by certain officials with regard to my case. I was acquitted in the lower court but was committed again. There were other forms of interference too. Hon. Members who are not aware of the facts of that case might be surprised to hear that a person holding a very high position in this House today was the gentleman who prosecuted me in that case—I refer to Mr. Sam Wijesinha who is now being trained or groomed for the post of Clerk of the House. He was a very fair prosecutor, as Crown Counsel are expected to be , in spite of the fact that the U. N. P. was in power, and that the U. N. P. did its level best to have me convicted at all costs ; they even sent a petition against Mr. Wijesinha that he was a schoolmate of mine and should not have been allowed to prosecute.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

Must be your opponent !

ගරු චම්ලි ගුණවර්ධන
(கௌரவ சம்லி குணவர்தன)
(The Hon. Cholmondeley Goonewardene)

Yes, the petition was sent by my opponent but the charge was framed against me by the U.N.P.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

Not by the party !

ගරු චම්ලි ගුණවර්ධන
(கௌரவ சம்லி குணவர்தன)
(The Hon. Cholmondeley Goonewardene)

The charge against me was such that I could have been sentenced to death. It is very easy for the hon. First Member for Colombo South (Mr. J. R. Jayewardene) to laugh, but under the Emergency regulations I could have been sentenced to death. One of the charges was criminal house trespass.

එම්. බාලසුන්දරම් මයා. (කෝපායි)
(திரு. எம். பாலசுந்தரம்—கோப்பாய்)
(Mr. M. Balasunderam—Kopai)

There were no Emergency regulations then.

ගරු චම්ලි ගුණවර්ධන
(கௌரவ சம்லி குணவர்தன)
(The Hon. Cholmondeley Goonewardene)

Why not ?

බාලසුන්දරම් මයා.
(திரு. பாலசுந்தரம்)
(Mr. Balasunderam)

There was the Ordinance but no regulations.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු චම්ලි ගුණවර්ධන
(கௌரவ சம்லி குணவர்தன)
(The Hon. Cholmondeley Goonewardene)

I think the hon. Member has now forgotten the *hartal*. I do not blame him because we never expected any support for the *hartal* from the Federal Party then; if at all, during the *hartal* they would have been on the other side of the barricade.

An Emergency was proclaimed and along with the Emergency there were a number of regulations. I am certain that the penalty for a number of offences under the Emergency regulations was death, and one such offence was house trespass. Fortunately, the Attorney-General's Department gave a ruling in my favour in that the *Gazette* notification was proclaimed at about 2.45 p.m. and the offence I was alleged to have committed took place at about 12 noon, so it just happened that I had to be charged under the Penal Code.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

So it helped you!

ගරු චම්ලි ගුණවර්ධන
(கௌரவ சம்லி குணவர்தன)
(The Hon. Cholmondeley Goonewardene)

Quite accidentally! I was acquitted and my enemies could not have their purpose served. I do not know whether their memories are so short. They tried to pay off their political enemies not only outside this House but even inside it. In the Second Parliament they laid a charge against the hon. Member for Bulathsinhala (Mr. Edmund Samarakkody) and the hon. Member for Galle (Dr. W. Dahanayake). And what was the charge? A frivolous charge of having gone and occupied your Chair momentarily when there was no one in the House. It was occupied by Sir Albert F. Peries, the hon. Member for Nattandiya. It was a matter that could have easily been settled here by the Members of the House. If there is any remissness of the part of any Member of the House it is our duty to deal with it here and not to refer it to a third party, an outside tribunal. It was a well known fact in the Lobby that Sir John Kotelawala was boasting "I will get them two years R.I." The matter was being adjudicated by a tribunal somewhere else and Sir John was boasting that he would get them imprisonment. I will challenge any hon. Member to deny what I say.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

He is not here.

ගරු චම්ලි ගුණවර්ධන
(கௌரவ சம்லி குணவர்தன)
(The Hon. Cholmondeley Goonewardene)

But there are Members here who are aware of it.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

How do we know?

ගරු චම්ලි ගුණවර්ධන
(கௌரவ சம்லி குணவர்தன)
(The Hon. Cholmondeley Goonewardene)

Anyhow, on that occasion too they failed. I am saying all this because it is not for the United National Party and their supporters to lay the charge of interference with the course of justice, for they too did it as far as they could. My good Friend the hon. First Member for Colombo South (Mr. J. R. Jayewardene) knows it very well.

බාලසුන්දරම් මයා.
(திரு. பாலசுந்தரம்)
(Mr. Balasunderam)

If they did it are you going to do it yourselves?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු චම්ලි ගුණවර්ධන
(கௌரவ சம்ளி குணவர்தன)
(The Hon. Cholmondeley Goonewardene)

We will certainly not interfere. We only want to see that the laws passed by this Parliament are carried out. We do not want any obstruction and will not tolerate any as regards laws that are passed in the interests of the people of this country.

බාලසුන්දරම් මයා.
(திரு. பாலசுந்தரம்)
(Mr. Balasunderam)

You must know how to pass laws within the Constitution.

ගරු චම්ලි ගුණවර්ධන
(கௌரவ சம்ளி குணவர்தன)
(The Hon. Cholmondeley Goonewardene)

Maybe within the Constitution laws have to be passed, but laws must be observed in that spirit. There are some people, certain officials and others, who, even after the laws are passed, do not give the correct interpretation and who are so conservative that they are against any change, like their opposition to the Paddy Lands Act. I can say from my experience that a number of cases under the Paddy Lands Act failed because even the prosecuting Crown Counsel, I am sorry to say, had not their heart in the Paddy Lands Act. With regard to murder cases they would study their brief and come to court, but in these cases they did not prosecute with that same enthusiasm. They say that the judiciary and the legal profession are slow to change. I suppose that must be so in this country too.

Before I conclude I would like to say one word with regard to the ultra-leftists. It must be remembered that there are different roads to socialism in the world. In every country it will not take the classical turn that took place in Russia, for instance. Marxism is not a dogma, it is a guide to action. Various countries have chosen different roads but the ultimate objective is the establishment of a socialist society. You have the case of Cuba, Yugoslavia, Nigeria and Egypt. No one can say with any degree of certainty what road should be taken by a particular country. It all depends on the strength of the working class, of the peasantry in the country or the relative forces, and various other factors. Dogmatism and rigidity, are both dangerous and foolish. I would, therefore, appeal to those hon. Members ; I am sure they would soon realize that everything cannot be according to what is laid down in the books ; nor did the authors of those books ever intend to lay down a particular line of action for every country and every situation.

Sir, I have just been sent a note—I do not know the facts of the case and I do not want to refer to it—which states that the U. N. P. attempted to have a person declared a lunatic wrongfully.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

The U. N. P. ?

ගරු චම්ලි ගුණවර්ධන
(கௌரவ சம்ளி குணவர்தன)
(The Hon. Cholmondeley Goonewardene)

According to this note, the U. N. P. tried to have one Miss Maduwanwela declared a lunatic in order to get her wealth for Lady Molamure.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

He is a lunatic if he believes that.

ගරු චම්ලි ගුණවර්ධන
(கௌரவ சம்ளி குணவர்தன)
(The Hon. Cholmondeley Goonewardene)

I do not know the facts.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

So, do not read notes sent to you. You are taking part in an important Debate, not behaving like a lunatic.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු චම්ලි ගුණවර්ධන
(கௌரவ சம்ளி குணவர்தன)
(The Hon. Cholmondeley Goonewardene)

I do not know why the hon. First Member for Colombo South is so upset about this unless there is some truth in the allegation.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

What is the allegation ?

ගරු චම්ලි ගුණවර්ධන
(கௌரவ சம்ளி குணவர்தன)
(The Hon. Cholmondeley Goonewardene)

The allegation is that there was interference in the course of justice.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

Are you making the allegation ?

ගරු චම්ලි ගුණවර්ධන
(கௌரவ சம்ளி குணவர்தன)
(The Hon. Cholmondeley Goonewardene)

No, I am not making the allegation.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

Then, shut up.

ගරු චම්ලි ගුණවර්ධන
(கௌரவ சம்ளி குணவர்தன)
(The Hon. Cholmondeley Goonewardene)

I am not going to shut up for you.

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

Not for me ; but if you are not making the allegation you shut up.

ගරු චම්ලි ගුණවර්ධන
(கௌரவ சம்ளி குணவர்தன)
(The Hon. Cholmondeley Goonewardene)

I can continue as long as I want, and the only person who can ask me to shut up is the person occupying the Chair, not you.

I do not want to refer to further matters ; I can if I wish to, but I do not want to. We know the past of the U. N. P. We know their present plight. They were unable to develop the country from 1947 to 1956. They failed miserably and the masses rejected them. They tried their best to prevent the getting together of the progressive forces on every occasion since 1956 ; they tried particularly in 1960 ; they tried again before the formation of the Coalition Government. Now they are isolated from the masses. That isolation is complete.

Now they have thought of another alternative : they are trying to divide the parties in the Coalition, trying to drive a wedge into the Coalition Government by setting up the S. L. F. P. against the L. S. S. P., and the L. S. S. P. against the S. L. F. P. They are bankrupt of any other methods, any other weapons, and that is the only one they can think of, they could use. But I do not think that apart from the capitalists and their supporters, who are always with them and will continue to support them, anybody else will support them.

They always talk of their large voting strength. Naturally there are the estate owners ; there are the factory owners ; there is Ruskin Fernando of Velona fame and various people like him who compel people to vote for them—people who have no alternative but to support them for fear of dismissal. So on paper they have a fair voting strength, but that does not reflect the will of the people of this country. I can give you a classic example. In 1952 the U. N. P. was returned with a very large majority. After the formation

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

of the Government we held a meeting at the Galle Face Green. Huge crowds turned up—a mammoth crowd. It was presided over by the late Mr. S. W. R. D. Bandaranaike. In the 1952 elections it appeared to be a landslide for the U. N. P. Immediately after the elections, within a week of the formation of the Government, we had a huge meeting on Galle Face Green. Could any party that had really been rejected by the people have had such a massive meeting? I would say that that was a clear indication that other methods had prevailed.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
Hora vote.

ගරු චම්ලි ගුණවර්ධන
(கௌரவ சம்ளி குணவர்தன)
(The Hon. Cholmondeley Goonewardene)

Of course, their election was not a popular election. They cannot laugh when you say *hora* vote. That showed one thing only—that the popular will was not with them. They did not get their majority on a really popular vote. That is all I have to say against the United National Party.

In conclusion I would say that we are confident that with the formation of the Coalition Government, the forward march of the toiling people of this country towards a socialist society will have momentum, direction, and fulfilment.

අ. භා. 2.28

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මීට පෙර කථා කළ අපේ රජයේ වැඩ පිළිබඳ ගරු ඇමතිතුමා තම කථාවෙන් වැඩි කාලයක් මිඩංගු කළේ එක්සත් ජාතික පක්ෂයෙ ඉතිහාසය කියන්නටයි. එක්සත් ජාතික පක්ෂයෙ ඉතිහාසයත්, ලංකා සමසමාජ පක්ෂයෙ ඉතිහාසයත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙ ඉතිහාසයත් අපි කවුරුත් වගේ දන්නව. ඒ සම්බන්ධයෙන් මහජනයටත් දූන් හොඳ අවබෝධයක් තියෙනව. අවුරුදු 27 ක පමණ කාලයක් තිස්සෙ දේශපාලන භූමියෙ නොයෙකුත් සටන්වල යෙදී, පීඩා විඳින ජනතාව වෙනුවෙන් හිර බත් පවා කා තිබෙන එතුමා ඇතුළු අනිකුත් අයගෙන් අපි බලාපොරොත්තු වන්නෙ—ඒ අයට දූන් රජයේ බලතල ලැබී තිබෙන නිසයි, මා මෙසේ කියන්නෙ—තමතමන්ගෙ සම්පූර්ණ ශක්තිය යොදා මේ රටේ තිබෙන දූෂණ නැති කොට මහ ජනතාවට සෙතක් ලබා දීමයි. ඉදිරියේදී ඒ අන්දමට වැඩ කරන ලෙසයි, අපි එතුමන්ලගෙන් ඉල්ලා සිටින්නෙ.

මේ වර අයවැය ලේඛනය ගැන යමක් කියන්න මා අදහස් කරනව. විශාල බුද්ධියක් ඇති කෙනෙකු හැටියට, අර්ථ ශාස්ත්‍රය පිළිබඳ විශේෂඥයකු ලෙස ගෞරව ලැබූ කෙනෙකු හැටියට, ප්‍රසිද්ධියක් උසුලන යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා) කෙරෙහි, ඒ කියන්නෙ අපේ ගරු මුදල් ඇමතිතුමා කෙරෙහි මෙම අයවැය ලේඛනය ඉදිරිපත් කරන්න පෙර රටේ මහජනතාව විශාල බලාපොරොත්තු ඇති කරගෙන සිටිය. මෙම අයවැය ලේඛනය ඉදිරිපත් කරන විට වෙනදා මෙන් වෙළෙන්දන් ළඟ තිබුණු බඩු කළුකඩේට ගියෙ නැහැ. කළුකඩකාරයන් ළඟ තිබුණු බඩු බොහොමයක් එළියට ඇදී ආව. මහජනය බලාපොරොත්තු වුණු තරම් සෙතක් ඒ අයට මෙම අයවැය ලේඛනයෙන් ලැබුණේ නැහැ. ඒ බව ඉතා කණගාටුවෙන් මතක් කරන්න ඕනෑ. අමුතු ක්‍රමයකින් අයවැය ලේඛනයක් ඉදිරිපත් කළ හැටියටයි, මහජනය පිළිගෙන තියෙන්නෙ. මහජනය එතරම් දුරට තමන්ගෙ දේශපාලන අදහස්, දේශපාලන හැඟීම් මෙම අයවැය ලේඛනයට අනුව වෙනස් කරගෙන නැති බව ගම්බද කොට්ඨාශයක් නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියට මට කියන්න පුළුවනි.

ප්‍රවාහණ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා ඊයේ පැය 2 ක් පමණ වේලා මෙම සභාව අමතා කථා කළා. වරායෙ 25,000 ක් පමණ කම්කරුවන් වැඩ කරන බව කී එතුමා ඔවුන් විඳින දුක පැහැදිලි ලෙස ප්‍රකාශ කළා. ඒ කම්කරුවන්ට නිසි වේලාවට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]
ආහාර ලැබෙන්නේ නැති වගත්, ඔවුන්ට වැසිකිළි පහසුව පවා නැති බවත්, ඔවුන් ඉතා අමාරු තත්ත්වයකින් සේවය කරන බවත් අපද පිළිගන්නව. එසේම වෙනත් අංශවල කම්කරුවන්ද වැඩ කරන්නෙ ඉතා දුඃඛිත තත්ත්වයක් මධ්‍යයෙ බව එතුමා කීව. එම අදහස් අපිත් පිළිගන්නව. වරාය කම්කරුවන් ණය බරින් මිරිකී සිටිනව. එම ණය බරින් මිදීම සඳහා ඔවුන්ට ආධාර දීමේ වැඩ පිළිවෙළක් එතුමා සකස් කරගෙන යන බව කීව. විරුද්ධ පාර්ශ්වයෙ ප්‍රගතිශීලි අදහස් ඇති මන්ත්‍රීවරුන් එවැනි යෝජනාවලට සැම අතින්ම සහයෝගය දෙනව ඇති.

මා මෙම අවස්ථාවේදී එක්තරා කරුණක් රජයට මතක් කර දෙන්න කැමතියි. මේ රටේ ආර්ථික තත්ත්වය සිටුවන්නෙ කම්කරුවන් පමණක් නොවෙයි. ඔවුන්ට සහයෝගය දක්වමින් ඔවුන්ගෙ තත්ත්වයෙන්ම වැඩ කරන තවත් කොටසක් සිටිනව. එනම් ගම්බද ගොවි ජනතාවයි. මෙම අයවැය ලේඛනයෙන් ගම්බද සාමාන්‍ය ගොවි ජනතාවගෙ යහපතට, විමුක්තියට, ඉදිරිපත් කර තියෙන්නෙ මොනවද? එතුමාගෙ අයවැය ලේඛනයෙන්, සහතික මිල ක්‍රමය යටතේ නිෂ්පාදනය කරන මිරිස්, ලූණු යනාදි දේවලට ශත ගණනක් වැඩි කර තිබෙනව. ඒව වගා කරන අය සියයට හයකට, අටකට වඩා නැහැ. විශාල ගොවි සංඛ්‍යාවක් සිටින්නෙ එම අංශයෙ නොවෙයි. මෙරට ප්‍රධාන ආහාරය නිෂ්පාදනය කිරීමෙහි, එනම් වී නිෂ්පාදනය කිරීමෙහි යි විශාල ගොවීන් සංඛ්‍යාවක් නිරතව සිටින්නෙ. ගොවීන් වැඩි වැඩියෙන් වී නිෂ්පාදනය කළ විට සිදු වන්නෙ කුමක්ද? පිටරටවලින් අප රටට ගෙන්වන හාල් ප්‍රමාණය අඩු වෙනවත් සමගම විදේශීය විනිමයත් අඩු වෙනව. එම නිසා ඔවුන්ගේ තත්ත්වය උසස් කිරීම නමුන්නාන්සෙලාගෙ යුතුකමක්. ගොවීන්ගේ ආර්ථික තත්ත්වය උසස් කිරීමේ පරමාර්ථයෙන් එදා අවිස්සාවේල්ලෙ ගරු මන්ත්‍රීතුමා (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) ඉදිරිපත් කළ කුඹුරු පණත කප්පාදු කර එයින් නියම ප්‍රයෝජන ලබන්න බැරි වන ආකාරයට කටයුතු කරනව. නමුත් ඒ මගින් සුළු වශයෙන් හෝ සහනයක් ගොවීන්ට ලැබී තියෙනව. එම නිසා ගොවීන්ගෙ අයිතිය ආරක්ෂා වී තියෙනව. පසුගිය දවස්වල ඉදිරිපත් කරන ලද සංශෝධනවලින් ගොවීන්ගේ ආරක්ෂාව පෙරටත් වඩා ලැබී තිබෙනව. එහෙත් ගරු මුදල් ඇමතිතුමාගෙන් අප දැන් ඉල්ලා සිටින්නෙ තවත් දෙයක්. මොකක්ද ඒ? වයස අවුරුදු හැටක් පමණ වන තෙක් ගොවිතැනේ යෙදීමෙන් පසු ගොවියත් මහල්ලෙකු වෙනව. එතකොට ඔහුට තව දුරටත් ගොවිතැනේ යෙදෙන්න බැරි අවස්ථාවක් පැමිණෙනව. එවැනි තත්ත්වයකට පැමිණීම ස්වාභාවිකයි. අන්න එදාට එවැන්නෙකුට කොහෙන් නමුත් ආධාර වුවමනා කරනව. දැනට පවතින ක්‍රමයේ හැටියට නම් වයස්ගත වී තව දුරටත් කුඹුරු වැඩ ආදිය කරගෙන යාමට බැරි තත්ත්වයක් ඇති වුණාම ඒ ගොවියට කිසිම ආධාරයක් ලැබෙන්න මගක් නැහැ. රජයේ සේවකයට විශ්‍රාම වැටුපක් ලැබෙනව, වයස්ගත වී විශ්‍රාම ගියාම. රජයේත් පෞද්ගලික ආයතනවලත් වැඩ කරන කම්කරුවන්ට අර්ථසාධක අරමුදල් ක්‍රමයක් ඇති කර තිබෙන නිසා ඒ අයටත් යම්කිසි ආධාර මුදලක් ලැබෙන මාර්ගයක් සකස් කර තිබෙන බව අපට කියන්න පුළුවනි. එහෙත් ගොවියාට මොන විධියෙ වැඩ පිළිවෙළක්ද තිබෙන්නෙ? ගොවියාට කිසිම දෙයක් නැහැ. වැඩ කරන්න බැරි තරමට නාකි වුණාම ගොවියට මොකක්වත් ආධාරයක් ලැබෙන වැඩ පිළිවෙලක් දැනට නැහැ. පුළුවන් තාක් කල් ගොවිතැන් කර වයස හැට පැන්නම පින් පඩියක් ඉල්ලා දෙන මෙන් පළාතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරය ළඟට ඇවිත් කියන්නයි වෙලා තියෙන්නෙ. මේ තැනැත්තට ඒ විධියෙ තත්ත්වයක් ඇති වීම කනගාටුදායකයි. ඒ නිසා ඔහු ඒ තත්ත්වයෙන් මුදා ගැනීමට වැඩ කිරීම රජයේ යුතුකමක් නොවෙයිද?

ප්‍රවාහණ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා කම්කරුවන් ණය බරින් මුදවා ගැනීමට ණය සහනාධාර ක්‍රම ඇති කරනව. ඒක බොහොම හොඳයි. ඒ අනුව ගොවියාටත් සහනයක් ලැබෙන්න ඕනෑ. ගම්බද ගොවීන් අද විශාල ලෙස ණය වී සිටිනව. ලොකු මුදලාලිලාගෙනුත්, සල්ලි පොළී කාරයින් ගෙනුත් අසරණ ගොවි ජනතාව මුද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගැනීමට ණය සහන ක්‍රමයක් ඇති කරනවා නම් හොඳයි. ඒ සමගම ගොවීන්ටත් විශ්‍රාම වැටුප් ක්‍රමයක් හෝ අර්ථසාධක අරමුදල් ක්‍රමයක් හෝ ඇති කිරීමක් අවශ්‍ය බව මතක් කරන්න කැමතියි. ඒ හා සමග තවත් දෙයක් කළ හැකියි. අස්වැන්න ක්‍රමයට හෝ සහතික මිල ක්‍රමයට හෝ රජයට විකුණනු ලබන වී ප්‍රමාණය අනුව හෝ වැඩිපුර මුදලක් දී, රජයෙන් කොටසකුත් ගොවියගෙන් කොටසකුත් යන ක්‍රමයට මුදල් එකතු කර වයස්ගත වූ විට සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් ලබා ගතහැකි වන පරිදි අර්ථසාධක මුදලක් හෝ විශ්‍රාම වැටුප් ක්‍රමයක් හෝ ඇති කරන්න පුළුවන්කම තිබෙනවා. මේ අයවැය ලේඛනය ඉදිරිපත් කළ ගරු මුදල් ඇමතිතුමාගෙන් මා ඒ ඉල්ලීම කරන්න කැමතියි. අවුරුදු ගණනාවක් තිස්සේ ඉතාමත් උසස් සේවයක යෙදෙන ගොවියා දන් පවතින කනගාටු-දායක තත්ත්වය යටතේ ස්වකීය ජීවිතයේ සන්ධ්‍යා සමය ඉතා අවාසනාවන්ත ලෙසත්, දුක්ඛිත ලෙසත් ගත කර සමහරවිට හිඟන්නෙකු වෙලයි මැරෙන්නෙ. ඒ තත්ත්වයෙන් කොහොම හරි ගොවියා ආරක්ෂා කර ගැනීම ඉතා අවශ්‍යයි. ඒකයි අපට වුව මනා කරන්නෙ. කම්කරුවන්ට පමණක් නොවෙයි සහනාධාර මුදල්, අර්ථසාධක අරමුදල්, ණය සහන මුදල්, විශ්‍රාම වැටුප් මුදල් ආදිය වුවමනා කරන්නෙ. ගොවීන්ටත් ඒවා වුවමනා කරනවා. ගරු මුදල් ඇමතිවරයට පුළුවනි, ගොවියා නිෂ්පාදනය කරන වී ප්‍රමාණය අනුව බුසලකට ශත 25 බැගින් වැඩි කර හෝ ගෙවා ඒ මුදල යම් කිසි අරමුදලකට යොදවා හැට විය පැන්න ගොවියාට සැහෙන මුදලක් ලැබෙන්න විධිමත් වැඩ පිළිවෙළක් සලස්සන්න. එතකොට වයස්ගත වුණාම, රෝගාතුර වුණාම ප්‍රයෝජන ගන්න පුළුවනි. ඒ විධියේ වැඩ පිළිවෙළක් ආරම්භ කරනවා ඇතැයි බලාපොරොත්තු වෙනවා.

ගම්බදව වැඩ කරන ගොවියාට පමණක් නොවෙයි මෙවැනි සහනදායක වැඩ පිළිවෙළක් වුවමනා කරන්නෙ. ණය බරින් මිරිකී ඉන්නේ ගම්බද ගොවියා පමණක් නොවෙයි. ගොවි ජනපදවල ඉන්න අයත් ණය බරින් මිරිකී ඉන්න බව අපි දන්නවා. ඒ අය ණයකාරයින්ගෙ ග්‍රහණයෙන් මුදල් ගන්න ක්‍රියා කරන්න ඕනෑ. පොළොන්නරුව, මින්නේරිය වැනි නොයෙක් ජනපදවල ඉන්න උදවිය විශාල පොළියට මුදල් ණයට අරන් කරදරයට පත් වී සිටින බව අහන්න ලැබෙනවා. තමන් ගත් ණය මුදලවත් පොළියවත් ගෙවා ගන්නට බැරිවෙලා ඉන්නව බොහෝ දෙනෙක්. එවැන්නන්ටත් මෙවැනි සහන ක්‍රමයක් ඇති කළ යුතුව තිබෙන බව කරුණාවෙන් මතක් කරන්න කැමතියි.

ගෙවල් ප්‍රශ්නය සම්බන්ධයෙන් කරන යම්කිසි වැඩක් වෙතොත් එය නගර වැසියන්ට පමණක් සීමා කරන්න බැහැ. ගම්බද ගොවීන්ටත් සහනයක් ලැබෙන වැඩ පිළිවෙළක් අවශ්‍යයි. බොහෝ ගම්බද උදවිය අද මැටියෙන් තැනූ කුඩා ගෙවල්වලයි, ගුබ්බෑයම්වලයි ජීවත් වෙන්නෙ. ජනපද ව්‍යාපාරවල ඉන්න අයට නම් රුපියල් දාහක්වත් ගෙවනවා. ගම්බද ගොවීන්ටත් එවැන්නක් ඕනෑ කරනවා. රුපියල් දහක් ලැබුණත් අද ඒ මුදලින් ගම්බද මිනිහට පුළුවන්කමක් නැහැ, නිසි පරිදි ගෙයක් හදා ගන්න. ඒ තරමටම සිමෙන්තිවල මිලත්, උලුවල මිලත් දැන් ඉහළ ගිහිල්ලයි තිබෙන්නෙ. වෙන දෙයක් තබා ලී දඬු ආදියෙත් මිල බොහොම වැඩිවෙලයි තියෙන්නෙ. ඒ මුදල් ප්‍රමාණයත් වැඩි කරන්න කල්පනා කළොත් තමයි හොඳ. ඉඩම් සංවර්ධන ක්‍රමය යටතේ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ගම් පළල් කිරීමේ ක්‍රමයට තවම දෙන්නෙ රුපියල් දාහක් පමණයි. ගොවීන්ට සහනයක් දෙන්න බලාපොරොත්තු වෙනව නම් බොහෝ දේවල් කළ යුතුව තිබෙනවා. සභාග ආණ්ඩුවක් දැන් කර තිබෙන නිසා මේ සම්බන්ධයෙන් වෙනසක් ඇති වේය කියා ගැමි ජනතාව බලාපොරොත්තු වෙනවා. ඒ වුණත් අප කියන දේවලට ඇහුම්කන් දෙන්නවත් ඒ ඇමතිවරු මෙතන නැහැ. අවසාන දොළොස් මාසෙදිවත් වැඩ කරාවිය කියා අපට හිතන්න අමාරුයි. අප කියන දේ අහන්නවත් මෙතන ඉන්නෙ නැත්නම් කොහොමද අලුත් සැලැස්මවල් ඇති කර වැඩ කරනු ඇතැයි බලාපොරොත්තු වෙන්නෙ? දකුණු පළාතෙත් උඩරට ප්‍රදේශයේත් මන්ත්‍රීවරන් දෙතුන් දෙනෙකු නැත්නම්, ආණ්ඩු පක්ෂයේ ආසනවල කවුරුවත් නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙම අය වැය ලේඛනයෙන් ගම්බද මිනිසුන්ට ලැබී තිබෙන්නෙ මොනවාද? ගම්බද උදවියට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

රා දීල තිබෙනව. රාම බීපල්ල කියනව. ඒකෙ ඇති වරදක් නැහැ. නමුත් රාවලින් සියල්ලක්ම කරන්නට පුළුවන් කමක් නැහැ. මෙම යෝජනාව ඉදිරිපත් කළ මුදල් ඇමතිතුමාගෙන් මම ප්‍රශ්නයක් අහනව. මුදල් ඇමතිතුමා කියන්නෙ ගස් මැදීමට අවසර දෙන්න යෝජනා කළේ එයින් මුදල් ලබාගැනීමට නොවෙයිලු, කසිප්පු වසන්ගතය නැති කරන්නලු. එතුමගෙ යෝජනාවෙ හැටියට තැබෑරුමක් තියෙන ප්‍රදේශයේ සිට හැතැප්ම දහයක් ඇතුළත ගස් මදින්න ඉඩ දෙන්නෙ නැහැ. නගරබද ප්‍රදේශවල පොල්ගස් නැහැ. ඒ වාගේම උඩරට ප්‍රදේශවලත් පොල් ගස් නැහැ. එහෙම නම් ගස් මැදීමට අවසර දීමෙන් මේ ප්‍රදේශවල කසිප්පු වසංගතය නැති කරන්නෙ කොහොමද? නැති වෙන්නෙ කොහොමද? පොල් වගාව නැති පළාත්වල, උඩරට පළාත්වල කසිප්පු උවදුර නැති කිරීමට මෙයින් යහපතක් වෙන්නෙ නැත් නම් ඒ සඳහා වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවද? ඒ වාගේම තැබෑරුමක් අවට හැතැප්ම දහයක ප්‍රදේශයේ ගස් මදින්න ඉඩ දෙන්නෙ නැති නම් ඒ අය සඳහාත් අනුගමනය කරන්න අදහස් කරන්නෙ කුමන වැඩ පිළිවෙළක්ද? මෙම ප්‍රදේශවල කසිප්පු ව්‍යාපාරය නැති කරන්නට වැඩ පිළිවෙළක් සකස් කරන්නෙ නැතුව එතුමාගේ පරමාර්ථය, කසිප්පු උවදුර නැති කිරීමේ අදහස, කිසි විධියකින්වත් ඉටු වෙන්නෙ නැහැ. [බාධා කිරීමක්]

මම අහන්නෙ ගස් මදින්න දෙන පළාත්වල නොවෙයි, ගස් මදින්න දෙන්නෙ නැති, පොල් ගස් නැති පළාත්වල කසිප්පු වසංගතය නැති කරන්නෙ කොහොමද කියන එකයි. ඒකට පිළියමක් ඇමතිතුමා යොදා තිබෙනවද? ඇමතිතුමාගෙ මේ යෝජනාව නිසා කසිප්පු උවදුර නැති වෙනවාය කියල කල්පනා කරනවද? මම මේව කියන්නෙ වරදක් හැටියට නොවෙයි. මේ කාරණා ගැන කල්පනා කර බැලිය යුතු නිසයි කියන්නෙ. එම නිසා කසිප්පු වසංගතය නැති කර දැමීමද සැලකිල්ලට භාජන කළ යුතු වැදගත් ප්‍රශ්නයක් බව කියන්නට කැමතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමුපකාර තොග වෙළඳ ආයතනය ගැනත් සමුපකාර ව්‍යාපාරය ගැනත් වචනයක් කියන්න ඕනෑ. අද බොහෝ පළාත්වල සමුපකාරය විකාරය වෙලා, ඔක්කාරය වෙලා. සමුපකාර සංගම් ගැන කථා කරන විට මේවායේ නිලධාරි මණ්ඩලවල වැඩි හරියක් හොරුන්ගෙන් පිරී ඇති බව කියන්න ඕනෑ. සාමාන්‍යයෙන් සමුපකාර සමිති සියල්ලක්ම ඒකාබද්ධ කර සංගමයක් පිහිටුවා තොග වෙළඳාම ඒ සංගමයට භාර දෙනව. නමුත් එම සංගමයට දූෂණයෙන් පිරුණු නිලධාරීන් ඇතුල් වීම නිසා ඒවායෙන් කවදාවත් මහජනතාවට නියම ප්‍රයෝජනයක් ලැබෙන්නෙ නැහැ; සමුපකාර සමිතිවලින් නියම ප්‍රයෝජනයක් ලැබෙන්නෙත් නැහැ. මේවා හැමදාමත් මේ ගරු සභාවෙදි මම කියනව. ඇමතිවරුනුත් දන්නවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමුපකාර ව්‍යාපාරය රටකට ඉතාමත් අවශ්‍ය ව්‍යාපාරයක් හැටියට සෑම දේශපාලන පක්ෂයක්ම පිළිගන්නව. නමුත් මේ දක්වාම මේවායේ කෙරෙන දූෂණ නැති කිරීමට වැඩ පිළිවෙළක යොදා නැහැ.

රුපියල් එකළොස් දහසක් සමුපකාර සමිතියකින් වංචා කිරීමක් ගැන, එම මුදලට හොර චෙක්පතක් නිකුත් කිරීමක් ගැන, මෙම ගරු සභාවෙදි මම හෙළි කළා. නිකුත් කළ එම චෙක්පත ආපසු ආවා, බැංකුවෙ මුදල් නැති නිසා. නමුත් දැන් අවුරුද්දකට වැඩි කාලයක් ගත වී තිබෙනව, රුපියල් එකළොස් දහසක් වංචා කළ එම පුද්ගලයාට විරුද්ධව තවමත් නඩුවක් පවරන්න සමුපකාර දෙපාර්තමේන්තුවට බැරි වී තිබෙනව. එය එසේ වුවත් යම්කිසි පුද්ගලයකු බූරුව ගැහැව්වොත්, රා ටිකක් බීල අහුවුණොත්, පොලිසියට අරගෙන ගිහිල්ල හොඳටම ගුටි ඇනල ඕනෑ නම් හිරෙත් දානව. ඒ වුණත් රුපියල් එකළොස් දහසක් වංචා කරපු මේ පාලක ලේකම්වරයා අද කිසි කරදරයක් නැතුව හොඳින් ජීවත් වෙනව.

එල්. බී. දසනායක මයා. (ගම්පොළ)
(திரு. எல். பி. தஸநாயக்க—கம்பளை)
(Mr. L. B. Dassanayake—Gampola)
නම මොකක්ද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලක්ෂ්මන් රාජපක්ෂ මයා.
(திரு. லக்ஷ்மன் ராஜபக்ஸ)
(Mr. Lakshman Rajapaksa)
මම හිතුවෙ පස් දුන් කෝරළෙ කියලයි.

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)
මේ මන්ත්‍රීතුමා අහනව සමිතියෙ නම මොකක්ද කියා. සමිතියෙ නම කිව්වට උන්නැහෙ නඩු දමන්නයැ?

සතොස ගබඩා සෑම ඡන්ද කොට්ඨාශය කම පිහිටුවීමට රජය බලාපොරොත්තු වෙනව. ගරු ඇමතිතුමා ප්‍රකාශ කර තිබෙනව සමුපකාර සංගම් ගබඩා වෙනුවට සතොස ගබඩා පිහිටුවනවාය කියා. එහෙ නම් මෙන්න ඊට අවස්ථාව. අද සමුපකාර සංගම් ගබඩා හොර ගුහා බවට පත් වී තිබෙනව. එම නිසා ඒවා නැති කර සතොස ගබඩා විවෘත කර බඩු බාහිරාදිය සහ රෙදි පිළි ආදිය මහජනතාවට බෙදා හරින්නය කියා මම ඉල්ලා සිටිනව.

ඊළඟට මම අහන්න කැමතියි, සතොස ගබඩාව මගින් ගෙන්වනු ලබන, සතොස ගබඩාවලට පමණක් බෙදා හරිනු ලබන, චීත්ත රෙදි කොළඹ පිටකොටුවෙ වෙළෙන්දන් අතටත් ඒ වාගේම මාතර ආදී අනිකුත් නගරවල වෙළෙන්දන් අතටත් යන්නෙ කොහොමද කියා. මේ ගැන සොයා බලා මෙය නැවැත්වීමට වැඩ පිළිවෙළක් යොදවන්න බැරි ඇයි? ඒ රෙදිවල යාර යක් යාරයක් පාසා සීල් ගැසුවොත් හොර කඩකාරයන් ළඟ තිබෙන විට ඒ ගැන ප්‍රශ්න කරන්න පුළුවන්. එසේ සීල් ගසා තිබෙනවා නම් ඕනෑම නිලධාරියකුට පුළුවන් ඒ ගැන ප්‍රශ්න කරන්න.

ශ්‍රීමත් ඇල්බට් පීරිස්
(சேர் அல்பேட் பீரிஸ்)
(Sir Albert Peries)
එතකොට පගා ගන්න බැහැ නෙ.

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)
මෙය ඉතා සුළුවෙන් කරන්න පුළුවන් වැඩක්. ඉන්දියාවෙ සමුපකාර ව්‍යාපාර යෙන් බෙදා හරින රෙදි මොනම කඩයක සාප්පුවක තිබුණත් සොයා ගන්න පුළුවනි. ඒ රෙදිවල යාරයක් යාරයක් ගානෙ සීල් ගසා තිබෙනව.

ජී. ජේ. පාරිස් පෙරේරා මයා. (ජාඇළ)
(திரு. ஜீ. ஜே. பாரிஸ் பெரேரா—ஜா-எல)
(Mr. G. J. Paris Perera—Ja-Ela)
කාටද ඔව කියන්නෙ? ඇමතිවරු කවුරුත් නැහැ.

ශ්‍රීමත් ඇල්බට් පීරිස්
(சேர் அல்பேட் பீரிஸ்)
(Sir Albert Peries)
හිස් බංකුවලටයි කියන්නෙ.

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)
එසේ නැතිව නියෝජ්‍ය සභාපතිතුමනි, සතොස සහ සමුපකාර සංගම්වල කෙරෙන හොරකම් නවත්වන්න බැහැ. අපේ සෑම මන්ත්‍රීවරුන්ටම වුවමනායි මේ සොරකම් නවත්වන්න. මම දන්නව ආණ්ඩු පක්ෂයේ සිටින මන්ත්‍රීවරු සෑම අවස්ථාවකදීම දූෂණ හා හොරකම් නැවැත්වීමට වැඩ කරන බව. කොත්මලේ මන්ත්‍රීතුමාත් (ජේ. ඩී. වීරසේකර මයා.) සැමදාම සටන් කරනව. නමුත් මේවා නැවැත්වීමට වැඩ පිළිවෙළක් යොදන්නෙ නැහැ.

ජේ. ඩී. වීරසේකර මයා.
(திரு. ஜே. டீ. வீரசேக்கர)
(Mr. J. D. Weerasekera)
මොකක්ද, මොකක්ද?

ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பீ. ஆர். குணவர்தன)
(Mr. D. P. R. Gunawardena)
සමුපකාර හොරුන්ට විරුද්ධව වැඩ කිරීම.

ජේ. ඩී. වීරසේකර මයා.
(திரு. ஜே. டீ. வீரசேக்கர)
(Mr. J. D. Weerasekera)
මට බලයක් නැහැ නෙ.

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)
ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක වුණත් මේවා ගැන යම් කිසි වැඩ පිළිවෙළක් යෙදීමට කටයුතු කර නැහැ. අපි කියා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

සිටින්නේ වැඩ පිළිවෙළක් යෙදීමටයි. ඉතා සුළු පියවරවලින් ඒ දූෂණ සහ හොරකම් නවත්වන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගම්බද මහජනතාව තදින් මුහුණ පා ඇති ඉඩම් නැති ප්‍රශ්නය සම්බන්ධයෙන් මේ අයවැය ලේඛනයේ සඳහන් වී තිබෙනවද? මීට අවුරුදු 10 කට 15 කට උඩදී ඉඩම් කච්චේරි පවත්වා එක පුද්ගලයකුට අක්කර දෙක බැගින් දුන්න. නමුත් අද දෙන්නෙ අක්කරෙන් අටෙන් පංගුවයි. ඉඩම් දීමේ ප්‍රමාණය ක්‍රම ක්‍රමයෙන් අඩු වී ගොස් දැන් එය අටෙන් පංගුවට බැස තිබෙනව. මම බොහොම කනගාටු වෙනව මෙම අයවැය ලේඛන විවාදවලදී අපි කරුණු සොයාගෙන ඇවිත් කථා කරන විට ඒවාට ඇහුම්කන් දීමට ඇමතිවරු මෙහි නොසිටීම ගැන. මම කථා කරන්නෙ කොමියුනිස්ට් පක්ෂය වෙනුවෙනුයි. මන්ත්‍රීවරු වශයෙන් මෙහි සිටින්නේ අප තුන් දෙනෙක් පමණක් වුවත්, මෙය ලෝකයේ බලගතු පක්ෂයක්. එවැනි පක්ෂයකින් කථා කරන විට ඇමතිවරු නො සිටීම ගැන කනගාටුයි. මම බොහොම සන්තෝෂ වෙනව ඉඩම් ඇමතිතුමා පිටු පස ආසනයකටවත් වී මෙහි සිටීම ගැන. ගරු ඇමතිතුමාට මම දන්වන්න කැමතියි, අද බෙදා දෙන අක්කර අටෙන් පංගුව පදිංචි වීමටවත් මදි බව. ඒ ටික දෙන්නවත් අද ඉඩම් නැහැ. විශාල ධනපතීන්ගේ වතු යායවල් අරගෙන බෙදා දෙන්නය කිව්වම රජයට මුදල් නැත කියනව. රජයේ කැලෑ බෙදා දෙන්නය කිව්වම ඒවා තහනම් කැලෑය කියනව. එහෙම නම් කරුණා කර උඩ වලවේ වැනි යෝජනා ක්‍රමවලින් මාතර දිස්ත්‍රික්කයේ ඉඩම් නැති ජනයාට ඉඩම් දීමට සලස්වන මෙන් මම ඇමතිතුමාගෙන් ඉල්ලනව. අද මේ ඉඩම් අක්කරයකින් 8න් එක පංගුවක් දෙන්නෙ මොනවටද? ඒ ඉඩමේ පදිංචි වෙන්න ඕනැ; ගෙයක් සාදා ගන්න ඕනැ. ගෙයක් සාදන්න මුදල් දෙන්න ඕනැ. අද සිමෙන්ති ඇතුළු ගෙවල් සෑදීමට ගන්න අනෙක් ද්‍රව්‍යවල මිළ ඉහළ නැග තිබෙනවාලු. නමුත් ගෙවල් සාදන්න මුදල් දෙන්නෙ එදා දුන් ප්‍රමාණයටමයි. මේ නිසා මහජනයා ගෙවල් සෑදීමට පෙළඹෙන්නෙ නැහැ. පසුගිය කාලයේ පළාත් පාලන ඇමති හැටියට මාතර ගරු මන්ත්‍රීතුමා (එම්. සමරවීර මයා.) සිටියා. මේ පොල් අතු ගෙවල් උළු ගෙවල් බවට පරිවර්තනය කරනවාය, පැල්පත් මාළිගාවලට පරිවර්තනය කරනවාය කියා එතුමා මහ විශාල ප්‍රකාශයක් කළා. නමුත් අපේ පළාත්වල නම් එක පොල් අතු ගේකටවත් උළු ලැබුණෙ නැහැ. ඔය විධියට මහජනතාව මුළා කළා නම් අද තමුන්නාන්සේලා ඒවා හරිගස්සන්න. ඉඩම් අමාත්‍යාංශයෙන් ගේකට ලැබුණු රුපියල් 1,000 පමණයි තියෙන්නෙ; වෙන එකම අමාත්‍යාංශයකින්වත් ලැබුණෙ නැහැ.

ඊළඟට තවත් වැදගත් ප්‍රශ්නයකට අය වැය ලේඛනයෙන් දී තිබෙන පිළිතුර ගැන අපට සෑහීමට පත් වෙන්න බැහැ. රැකී රක්ෂා ප්‍රශ්නය නිරාකරණය කිරීමට යොදා තිබෙන පිළිවෙළ මොකක්ද? සංඛ්‍යා ලේඛන අරන් බැලුවොත් අද වැඩ කරන සෑම අට දෙනෙකුගෙන්ම එක්කෙනෙකුට රක්ෂාව නැති බව පෙනෙනව. මේ අනුව කොයි තරම් සංඛ්‍යාවක් රක්ෂාවක් නැතිව සිටිනවද? ඒ වගේම අවුරුදුපතා තවත් කොපමණ සංඛ්‍යාවක් රැකීරක්ෂා නැති ගණයට වැටෙනවාද? අයවැය ලේඛනයෙන් රක්ෂාවල් පොරොන්දු වී තිබෙන්නෙ 39,000 කටයි. 39,000 කට රක්ෂා දීමෙන් රැකීරක්ෂා ප්‍රශ්නය විසඳෙනවද? ඒ නිසා මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් සැල කිය යුතු පිළියමක් කරන්ට සිද්ධ වී තිබෙනව. අද රැකීරක්ෂා ප්‍රශ්නය කොයි තරම් උග්‍ර වී තිබෙනවාද කියනවා නම්, කිසිම මන්ත්‍රීවරයකුට අද සති අන්තයේ තමන්ගෙ කොට්ඨාශයට ගිහින් බේරෙන්න පුළුවන්කමක් නැහැ. ජ්‍යෙෂ්ඨය සමත් වී තිබුණොත් ඒ සෑම දෙනාම රක්ෂාවක් ඉල්ලනව. සතොසේ ගබඩාවක් විවෘත කර දහ දෙනා නම් ගන්නෙ, දාහක් ඉල්ලනව. දහ දෙනෙකුටයි රක්ෂා ලැබෙන්නෙ; නව සියයක් විරුද්ධ වෙනව. එපමණක් නොවෙයි. විශේෂයෙන්ම ජනගහනය වැඩි ප්‍රදේශවල මන්ත්‍රීන්ට ඉතාමත් අමාරුයි. ජනගහනය දවසින් දවස වැඩි වෙනව. ඒ නිසා විශේෂයෙන්ම ගම්බද ප්‍රදේශවල රැකීරක්ෂා නැති අයගේ සංඛ්‍යාවත් වැඩි වීම නිසා අද අපට විශාල ප්‍රශ්නයකට මුහුණ පාන්ට සිද්ධ වී තිබෙනව. මගේ පළාතෙ රට උළු කර්මාන්ත ශාලාවක් විවෘත කළා. මහජනයා ලොකුවට බලාපොරොත්තුව සිටිය දෙදාහකට පමණ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රක්ෂාව ලැබේවිය කියා. නමුත් රක්ෂා ලැබුණේ 74 දෙනෙකුටයි. රට කර්මාන්ත මය කිරීමේදී එය බහුල වශයෙන් කරන තුරු රැකිරක්ෂා ප්‍රශ්නය විසදන්ට පුළුවන්කමක් නැති බව මෙයින් පෙනෙනවා. [බාධා කිරීමක්]

කොට්ටාවේ ගරු මන්ත්‍රීවරයා පමණක් නොවෙයි ප්‍රගතිශීලීව ඉන්නෙ. තවත් ඉන්නවා. තමුන්නාන්සෙ සිතනව මේ තමුන්නාන්සෙගෙ තමයි ඔක්කොම කෙරුම් කියා. නැහැ, තවත් මිනිසුන් ඉන්නවා. තමුන්නාන්සෙ පොඩ්ඩක් අපි කියන ඒවත් අහගෙන ඉන්න. අපි නැහැනෙ තමුන්නාන්සෙ කථා කරන කොට හරස් කපන්නෙ. [බාධා කිරීමක්]

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා. (කොට්ටාව)
(திரு. டீ. பி. ஆர். குணவர்தன—கொட்டாவ)
(Mr. D. B. R. Gunawardena—Kottawa)
නැහැ, නැහැ.

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)
ඡන්දය දෙන එක මගේ පක්ෂයේ නියමයේ හැටියටයි කරන්නෙ. පක්ෂයේ සිටින තුරු මා පක්ෂයට ගරු කරනවා. මා නියම දේශපාලන පක්ෂයක් අනුගමනය කරන කෙනෙක්; ලෝකයේ පිළිගත් දේශපාලන පක්ෂයක්.

ගරු මුදල් ඇමතිතුමනි, තමුන්නාන්සෙගෙ අයවැය ලේඛනයෙන් මධ්‍යම පන්තියට සහනයක් දී තිබෙනවා. ඊළඟට ගුරුවරුන්ටත් සහනයක් දුන්නාය කියා තමුන්නාන්සේ සෑහීමකට පත් වී ඉන්නවා. නමුත් ගරු මුදල් ඇමතිතුමා තමාගේ යෝජනා ගැන තව ටිකක් දුරට කල්පනා කරන්ට ඕනෑය කියා මා මතක් කරනවා. ශ්‍රී ලංකා ජාතික ගුරු සංගමයෙන් ඇසුවොත් තමුන්නාන්සෙට මේ ප්‍රශ්නය ගැන කරුණු පැහැදිලි කර දෙනවා ඇති. මේ යෝජනාව නිසා ගුරුවරුන් අනික් රජයේ සේවකයන්ගේ ගණයට වැටෙන්නෙ නැහැ. මේ යෝජනාව ක්‍රියාත්මක වීමෙන් පසුත්, ගුරුවරයෙක් රජයේ වෙනත් සේවයකට පත්වීමේදී ගුරුවරයකු වශයෙන් ඔහු කළ සේවය එම සේවයට එකතු කරන්නෙ නැහැ. එම නිසා මේ යෝජනාව ක්‍රියාත්මක කිරීමේදී තවත් ටිකක් කල්පනා කර අනිකුත් රජයේ සේවකයන්ගේ ගණයට ගුරුවරුන් ඇතුළත් වන ආකාරයට වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

රජයේ සේවකයන් කොටසකගේ පඩි වැඩිවීම් ඇති කර තිබෙනවා, මේ අයවැය ලේඛනයෙන්. ඒ ගැන සතුටු වෙනවා. එහෙත් පුද්ගලික අංශයේ වැඩ කරන සේවකයන්ට ලැබී තිබෙන සහනය කුමක්ද? මේ එකම සහනයක්වත් පුද්ගලික අංශයේ කම්කරුවන්ට ලැබී නැහැ. එම නිසා මුළු මහත් කම්කරු ජනතාවට මේ යෝජනාවලින් සහනයක් ලැබුණායයි මට නම් පිළිගන්ට පුළුවන්කමක් නැහැ.

ගුරුවරුන් බලාපොරොත්තුව සිටින්නෙ තමන්ගේ විශ්‍රාම වැටුප් ක්‍රමය සකස් කර ගැනීමට පමණක් නොවෙයි. දේශපාලන අයිතිවාසිකම් ලබා ගැනීම සඳහාත් ඔවුන් විශාල සටනක් ගෙන යනවා. රජයේ සේවකයන්ට දේශපාලන අයිතිවාසිකම් දිය යුතුද, යන්න පිළිබඳව සොයා බැලීමට පත් කළ තෙන්නකෝන් කමිටුවේ වාර්තාව දැන් ඉදිරිපත් වී තිබෙන නමුත් ඒ සම්බන්ධයෙන් අපට යමක් තවම දැනගන්ට ලැබුණෙ නැහැ. ගුරුවරුන්ට දේශපාලන අයිතිවාසිකම් දෙනවද? නැද්ද? පාසැල් රජයට ගැනීමෙන් දේශපාලන නිදහස මෙතෙක් භුක්ති විඳගෙන ආ පිරිස කටත් ඒ අයිතිවාසිකම නැතිව ගියා. ඒ උදවියටවත් අඩු වශයෙන් මේ අයිතිවාසිකම ලැබෙන්ට සළස්වනවාදැයි මා දැනගන්ට කැමතියි. මුදල් ඇමතිතුමාගේ පිළිතුරු කථාවේදී මේ සම්බන්ධයෙන් පැහැදිලි පිළිතුරක් ලැබෙනවා ඇතැයි මා විශ්වාස කරනවා.

මේ අයවැය ලේඛනයෙන් සාමාන්‍ය මහ ජනයා පිට අමුතු බදු බරක් පටවා නැහැ. එහෙත් එයින් අපට සෑහීමකට පත්වන්ට පුළුවන්ද? වැඩිපුර බදු බර ජනතාවගේ කරපිට නොදැම්මාට මේ රටේ පවතින ඇවෙන ප්‍රශ්න විසඳන්න යම්කිසි වැඩ පිළිවෙළක් අයවැය ලේඛනයෙන් ඉදිරිපත් වී තිබෙනවාද? වෙනදා මෙන් අද මහ ජනයා කියන්නෙ නැහැ, අපේ පිටි රාත්තලේ මිළ වැඩි කළාය, සීනි රාත්තලේ මිළ වැඩි කළාය කියා. එහෙත් ඉදිරි අනා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

ගතයේ ඇතිවන ප්‍රශ්න විසඳීමට ඉදිරිපත් කර තිබෙන වැඩ පිළිවෙළ කුමක්දැයි මට පෙනී යන්නෙ නැහැ. මුදල් ඇමතිතුමා අය වැය කථාවෙදි ප්‍රකාශ කළා, සැලැස්මකට අනුව අයවැය ලේඛනය සකස් කරනවා වෙනුවට, අය වැය ලේඛනය අනුව සැලැස්ම සකස් කරන්ට සිදු වුණා කියා. කාලය මදිවූ නිසා, සකස්කර තිබුණු ඇස්තමේන්තුවලට අනුව ප්ලෑනය සකස් කළා යයි එතුමා සඳහන් කළා. ඊයේ මේ විවාදයට සහභාගි වුණු ගමනාගමන ඇමතිවරයා ප්‍රකාශ කළා, ලබන ජූනි මාසයේදී තවත් අයවැය ලේඛනයක් ඉදිරිපත් කරනවා කියා. ඒ අවස්ථාවෙදිවත් ප්ලෑනයේ හැටියට ඇස්තමේන්තු සකස් කර ඉදිරිපත් කරයි කියා මා බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගමනාගමන මණ්ඩලය සම්බන්ධයෙන් වචනයක් කියන්ට ඕනෑ. ඊයේ ගමනාගමන ඇමතිතුමා පැය දෙකක් පමණ තිස්සේ හොඳ කථාවක් පැවැත්තුවා. එයින් පැය 1/2 ක් විතර දේශපාලනය පිළිබඳව වෙන් වුණා. අපිත් පක්ෂයට බැඳුණු කාලයෙ අපටත් එවැනි දේශපාලන පන්ති පැවැත්තුවා. එවැනි දේශනයක් ගමනාගමන ඇමතිතුමා පැය 1/2 ක් පමණ වෙලා පැවැත්තුවා. ශාස්ත්‍රීය පන්තියක් දුන්න. ඊළඟට අමාත්‍යාංශය පිළිබඳව පැහැදිලි විස්තරයක් ඉදිරිපත් කළා. දේශපාලනය ගැන යමක් නොදන්න එක්සත් ජාතික පක්ෂයේ උදවිය වුණත් ටිකක් පැහැදෙන්ට ඇති උන්නැහේගේ කථාවට. මා තමුන්නාන්සේලාට කියන්නෙ ලංගමයේ තිබෙන දූෂණ ගැනයි. එතුමාත් පිළිගත්ත, ලංගමයේ දූෂණ පවතින බව. වේර හැර ප්‍රධාන ඉන්ජිනේරු අංශයේ—ගරාජයේ—අයථා වැඩ කටයුතු කෙරෙන බව එතුමා පිළිගත්ත.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම බොහොම කනගාටුවෙනුයි කියන්නෙ—මා දන්නෙ නැහැ ඇත්තද කියා—ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන් දැනගන්න ලැබුණු දෙයක් මා කියන්නෙ. ඇමතිවරයකු සමග වැඩ කරන්න බැරිය කියා සංයුක්ත මණ්ඩලයක සභාපතියි අනිකුත් සාමාජික මහත්වරුයි අරලිය ගහ මන්දිරයට ගිහින් අගමැතිනියට පැමිණිලි කළාය කියා පත්‍ර මාර්ගයෙන් දැන ගන්න ලැබී තිබෙනවා. මේ විධියට ඇමතිවරුන්ට ඉදිරියට වැඩ කරන්න පුළුවන්ද කියායි මා අහන්නෙ. එසේ පැමිණිලි කිරීමට හේතු වෙනවා නොවේද, ඒ සභාපතිවරයාත් සංයුක්ත මණ්ඩලයේ අනික් සාමාජිකයනුත් වහම දෙරට දමන්න? ඇමතිවරයාට විරුද්ධව පැමිණිලි කරනව නම් ඇමතිවරයා අමාත්‍යාංශයේ වැඩ ගෙන යන්නෙ කොහොමද? ගමනාගමන ඇමතිවරයා සමග වැඩ කරන්න බැරිය කියා ගමනාගමන මණ්ඩලයේ සභාපති ජේ. එල්. ඊ. ප්‍රනාන්දු මහත්මයයි, අනිකුත් අධ්‍යක්ෂවරුයි ගමනාගමන ඇමතිවරයාට විරුද්ධව පැමිණිලි කර තියෙනව. ගමනාගමන ඇමතිවරයා, සභාපති ඇතුළු ඒ අධ්‍යක්ෂ මණ්ඩලය වහම පන්නනවද, එසේ නැත්නම් ඇමතිවරයා නම්බු පිටින් ඉල්ලා අස් වෙනවද කියා මම අහන්න කැමතියි. නිලධාරීන් තමාගේ අණට අකීකරුව වැඩ කරනව නම් මම නම් මොහොතක්වත් ඒ තනතුර දරන්නෙ නැහැ. ඇමතිවරයාට පක්ෂපාතව වැඩ කරන්නෙ නැත්නම්, ඇමතිවරයාගෙ නියෝග පිළිගන්නෙ නැත්නම්, මණ්ඩලයක් තියෙන්නෙ මොකටද? "ටයිම්ස්" පත්‍රයේ තිබුණු වාර්තාවක් මා මේ කියන්නෙ. ඇත්තද කියා මම හරිහැටි දන්නෙ නැහැ. මණ්ඩලය කියන දේ අගමැතිනිය පිළිගත්තලු.

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
(கௌரவ கலாநிதி என். எம். பெரேரா)
(The Hon. Dr. N. M. Perera)
That is wrong.

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்ஸி விக்கிரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)
ඒක බොරුය කියා ගරු මුදල් ඇමතිතුමා කියනවා.

කේ. එච්. ජී. ඇල්බට් මයා. (බෙන්තර-ඇල්පිටිය)
(திரு. கே. எச். ஜீ. அல்பேட்—பெந்தற-எல்பிட்டிய)
(Mr. K. H. G. Albert—Bentara-Elpitiya)
තව පත්‍රයක තියෙන්නෙ, අගමැතිනිය තීරණය කළාය කියා මණ්ඩලයේ සභාපති අස්කරන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)

ගරු මුදල් ඇමතිතුමාගෙ ප්‍රකාශය අපි පිළිගන්නව. පත්‍රයේ වාර්තාව බොරුයු. ඒක ගැන තවත් කථාවක් වුවමනා නැහැ. නමුත් සංවිධානය තියෙනව. ඇමතිතුමා සමග අර්බුදය තියෙනව. ඒක විසඳුනේ නැහැ. මම අහනව, මුදල් ඇමතිතුමාගෙන්——

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
(கௌரவ கலாநிதி என். எம். பெரேரா)
(The Hon. Dr. N. M. Perera)

ඒ වාර්තාව සම්පූර්ණයෙන් වැරදියි. පැමිණිල්ලක් කළේ නැහැ.

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)

අරලිය ගහ මන්දිරයට ගියේ නැද්ද ?

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
(கௌரவ கலாநிதி என். எம். பெரேரா)
(The Hon. Dr. N. M. Perera)

ගියා. ඇමතිවරයට විරුද්ධව පැමිණිල්ලක් කළේ නැහැ. පැමිණිල්ල කළේ සාමාන්‍යාධිකාරීට විරුද්ධවයි.

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)

ආණ්ඩුවෙන් දෙන පිළිතුර අපි දැන ගන්න ඕනෑ. මා මේ ප්‍රශ්නය ගොතල ගත්තේ ඒක දැන ගන්නයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ කථාව අවසාන කරන්න ප්‍රථම රජයේ නිලධාරීන් මාරු කිරීම සම්බන්ධව වචනයක් කියන්න ඕනෑ. මාතර කච්චේරියේ ෂ්රොෆ් දෙපාර්තමේන්තුවේ අවුරුදු 9 8, 7, 6 වැඩ කළ නිලධාරීන් ඉන්නව. කිසිම හේතුවක් නැතිව වර්ෂයේ මැද හරි යේදී ඒ එක නිලධාරියකු මාරු කළාය කියා මට පැමිණිල්ලක් ආවේ. ඊට වඩා වැඩි කාලයක් සේවය කළ අය සිටිද්දී එක නිලධාරියකු මාරු කරනව. මම මේ ගැන පරීක්ෂා කළා. පරීක්ෂා කර බැලුවම ඇමතිවරයගෙන් දැනගන්න ලැබුණේ, අරලිය ගහ මන්දිරයෙන් ආ නියෝගයක් ලබා එසේ මාරු කළ බවයි. අරලිය ගහ මන්දිරයෙන් නියෝගයක් ආවලු, අර දුප්පත් අහිංසක ෂ්රොෆ් නිලධාරියා මාරු කරන්නය කියා. උන්නැහේ විවාහක කෙනෙක්. දරුවා රාහුල විද්‍යාලයට යනව. වර්ෂය මැද මාරු කළාට ළමයා අස් කර ගන්න බැහැ. අධ්‍යාපන ඇමතිතුමාගෙ නියෝගය අනුව භාෂාව මාරු කරන්නත් බැහැ.

ගරු මන්ත්‍රීවරයෙක්
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)

අරලිය ගහ මන්දිරයෙන්ද නියෝගය දී තියෙන්නෙ ?

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)

අරලිය ගහ මන්දිරයෙන් නියෝගය කර තිබෙන බව මම දැනගත්තේ ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාගෙන්. "මම මොනවා කරන්නද, අරලිය ගහ මන්දිරයෙන් ආ නියෝගයක්" ය කියා උන්නැහේ මට කීව. අඩු වශයෙන් වර්ෂය අවසාන වන තෙක්වත් මාරුව නවත්වන්නය කියා මම කීව. උන්නැහේ ඒක පිළිගෙන වර්ෂය අවසාන වන තෙක් මාරුව නැවැත්තුවා.

මීට ඉහතින් අවුරුදු ගණනක් සේවය කළ නිලධාරීන් සිටියදී මේ නිලධාරියා මාරු කළේ මන්දැයි ඇහුවාම පිළිතුරු නැහැ. මේ පිළිබඳව සොයා බලන්න යයි මම ගරු මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මුදල් ඇමතිතුමා මේ පැත්තේ සිටියදී ඔය විදියේ වැඩවලට දිගට හරහට පහර දුන් කෙනෙක්. ඔය විදියේ වැඩවලට විරුද්ධව නායකත්වය ගෙන සටන් කර තිබෙනවා. ඒ නිසා මම මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඇමතිවරයකුගෙන් හෝ මන්ත්‍රීවරයකුගෙන් හෝ වෙනත් පුද්ගලයකුගෙන් හෝ රජයේ සේවකයින්ට ඒ විදියේ වැරැද්දක් වෙන්නට නොදී ඔවුන් ආරක්ෂා කරගන්නටය කියා. රජයේ සේවකයින් පිළිබඳ මූලික වගකීම ඇත්තේ මුදල් ඇමතිතුමාටයි. මුදල් ඇමතිතුමා රජයේ සේවකයින්ගේ පියායි. [බාධා කිරීමක්.]

අපි හැම වෙලේම මුදල් ඇමතිතුමාට ආධාර දෙනවා. මුදල් ඇමතිතුමාත් අපේ හොඳ අදහස් පිළිගැනීමට සූදානම්. උන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

නැගේ ඉතා දක්ෂ පක්ෂ ලෝකයම පිළිගත් අර්ථ ශාස්ත්‍රඥයෙක්. උන්නැහේ ඉරට්ටාචාර්යවරයෙක්. දැන් විද්‍යාලංකාර විශ්ව විද්‍යාලයෙන් ලැබුණු උපාධියක් සමග තුන්වරක් ආචාර්ය වරයෙක්. ඒ නිසා උන්නැහේට උපදෙස් දෙනවා නම් බොහොම කල්පනාවෙන් එසේ කරන්න ඕන. මම එතුමාගෙන් ඉල්ලා සිටිනවා, රජයේ සේවකයින් ආරක්ෂා කරගන්නය කියා ; මේ විදියේ පහත් කෑත වැඩ කරන්නට ඉඩ දෙන්න එපාය කියා. රජයේ සේවකයින්ට සුළු සහන දීම ගැන ඔවුන් සතුටු වෙනවා. ඔවුන්ට පිටස්තර බැට විදින්නට ඉඩ නොදී ආරක්ෂා කර ගැනීමත් ගරු මුදල් ඇමතිතුමාට අපි බාර කරනවා. ගරු මුදල් ඇමතිතුමා මෙහි සිටින නිසා රා මැදීම පිළිබඳව නැවතත් වචනයන් කියන්න ඕන. [බාධා කිරීමක්] එතුමා මගේ කථාව සම්පූර්ණයෙන්ම කියවා බලනවාලු.

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
(கௌரவ கலாநிதி என். எம். பெரேரா)
(The Hon. Dr. N. M. Perera)

මම මෙතැන නොසිටියදී සෑම මන්ත්‍රී වරයකු විසින්ම කියන ලද දේ මම කියවා බලනවා.

පර්සි වික්‍රමසිංහ මයා.
(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)
(Mr. Percy Wickremasinghe)

බොහොම හොඳයි. කියවලාවත් බලනවා නම් ඇති, අපට. රා මැදීමට ඉඩ දී තිබෙන වාය කියා අද රටේ විශාල උද්ඝෝෂණයක් තිබෙනවා. රා මැදීමට අවසර දීම වැරදිය කියනවා. ඒ කියන අයට මම එක කාරණයක් කියන්නම්. නියම බෞද්ධ ලංකාවක් ගොඩනංවන්නට නම් කෘෂිකර්ම, ආහාර හා ධීවර කටයුතු පිළිබඳ ඇමතිතුමා යටතේ තිබෙන ධීවර දෙපාර්තමේන්තුව සම්පූර්ණයෙන්ම වසා දමන්න ඕන ; මේ ලංකාව වටේ ඇති මුහුදේ මාළු ඇල්ලීම බෞද්ධ විරෝධී ක්‍රියාවක් නිසා. පිටරටින් එන විස්කි, බ්‍රැන්ඩි ආදී ධනපති බීම සියල්ලම නවත්වන්න ඕන. හරක් මැරීම වහාම නවත්වන්න ඕන. [බාධා කිරීමක්] මම කොමියුනිස්ට් වාදය පිළිගෙන තිබෙන්නේ නියම බෞද්ධයෙක් නිසයි. මාක්ස්වාදයේ තමයි, නියම බෞද්ධ ධර්මය තිබෙන්නේ. මාක්ස්වාදයට යම් කෙනෙක් විරුද්ධ නම් ඔහු නියම බෞද්ධයෙක් නොවෙයි. හොඳයි අද බුදුරජාණන් වහන්සේ අවුත් නිවණට යන්නට කථා කළොත් කී දෙනෙක් යාවිද ? කවුරුත් යන්නට කැමති වෙන එකක් නැහැ. ඉඩකඩම් වස්තුව දාල යන්න බැරි නිසා. මිනිසුන්ගේ තෘෂ්ණාව නැති කොට ආර්යෂ්ඨාංගික මාර්ගයේ ගමන් කොට චතුරාර්ය සත්‍යය අවබෝධ කරගෙන නිවන් දකින්නට නම් මේ රටේ නියම මාක්ස්වාදී රජයක් ඇති වෙන්න ඕන. ඒ නිසයි, අපි මාක්ස්වාදීන් හැටියට කටයුතු කරන්නේ. බෞද්ධ ලංකාවක් ගොඩ නැංවීමට හරක් මැරීම, මාළු ඇල්ලීම, විස්කි බ්‍රැන්ඩි ගෙන්වීම නවත්වනවා වාගේම ගල්ඔය සීනි කර්මාන්තශාලා වෙන් ලාභ උපයමින් අරක්කු බ්‍රැන්ඩි ජින් පෙරීමත් නවත්වන්න ඕන. ඒ සියල්ලම නවත්වා තිබියදී මුදල් ඇමතිතුමා රා මැදීමට අවසර දෙනවා නම් ඒක බලවත් වරදක්. දැන් මුදල් ඇමතිතුමා මොකක්ද කර තිබෙන්නේ ? හලාවත සිට මාතර දක්වා මුදුබඩ ඇති පොල්ගස් මැදීමට අවසර දී තිබෙනවා. දැනටමත් ඉන් කොටසක් මදිනවා. මේ රටේ තවත් ඉතාම සුළු කොටසක් තමයි මේ අනුව මේ නීතියට ඇතුළත් වෙන්නෙ. එම නිසා ඔය තරම් විශාල ව්‍යාපාරයක් කරගෙන යන්න, මෙය දේශපාලන ආයුධයක් හැටියට අරගෙන දේශපාලන ජයග්‍රහණයක් ලබා ගන්න නම් කවදාවත්ම බැරිය කියා මා කියනව.

මා මුලින් මුදල් ඇමතිතුමාට කිව්වා වගේ ගස් මදින්නේ නැති පළාත්වල කසිප්පු ව්‍යාපාරය මැඩලීමට කටයුතු කරන්නෙ කොහොමද කියන එක ගැනත් මුදල් ඇමතිතුමා කල්පනා කරන්න ඕන. මීට වඩා යමක් ඒ සම්බන්ධව කියන්න මා බලාපොරොත්තු වෙන්නෙ නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තමුන්නාන්සේ මට මිනිත්තු 40 ක් පමණ කථා කිරීමට අවස්ථාව දුන්නා. ඒ ගැන මා තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනව. ගොවීන් සඳහා මා ගරු මුදල් ඇමතිතුමාට ඉදිරිපත් කළ අදහස් අනුව ගොවීන්ට විශ්‍රාම වැටුපක් ලැබෙන්නට සලස්වනවා ඇතැයි විශ්වාස කරමින් මගේ කථාව අවසාන කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 3.9

ජේ. ඩී. වීරසේකර මයා.
(திரு. ஜே. டீ. வீரசேக்கர)
(Mr. J. D. Weerasekera)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු මුදල් ඇමතිතුමාගේ අයවැය කථාව ගැනත්, එතුමාගේ උනන්දුව හා දක්‍ෂතාවය ගැනත් ප්‍රථමයෙන්ම මගෙ ස්තුතිය පුද කරන්න සතුටුයි. මේ රටේ අවුරුදු 28 ක පමණ කාල යක දේශපාලන ඉතිහාසයක් ඇති එතුමා මෙපමණ කලක් විරුද්ධ පාර්ශ්වයේ සිට නොයෙකුත් අයවැය විවාදවලට ඇහුම්කන් දෙමින් නොයෙකුත් වැදගත් තර්ක ඉදිරිපත් කළා. මේවා ගැන සිතීමෙන් පමණක් කෙනෙකුට සන්තෝෂ වෙන්නට අමාරුයි. යම්කිසි පුද්ගලයකුගේ ජීවිත කාලයේදී, විශෙෂයෙන්ම දේශපාලඥයකුගේ ජීවිත කාලයේදී, යම්කිසි ප්‍රීතියක් නැත්නම් සතුටක් ලැබෙන්නේ, රටේ ජනතාවට තමන්ගෙන් යම්කිසි වැඩ කොටසක් නැත්නම් යහපතක් කෙරුණොත් පමණයි. එම නිසා ජනතාවට සේවයක් කිරීමේ බැරෑරුම් වගකීම අද මේ මුදල් ඇමතිතුමා පිට පැට වී තිබෙනව. එතුමා නොයෙකුත් දුක් ගැහැට වින්දත් ජනතාව වෙනුවෙන් ඉටු කරන්නට බලාපොරොත්තු වන සේවය කිරීමට දැන් පුළුවන් වේය කියා අපි කල්පනා කරනව. එමෙන්ම ජනතාව බලාපොරොත්තු වන දේ ඉටු කර දීමට වුවමනා ධෛර්යයත් නුවණත් එතුමාට තිබෙනවාය කියාත් මා හිතනව.

කවුරු කෙසේ කීවත් නොයෙකුත් දුෂ්කරතා මධ්‍යයේ එතුමා මේ අයවැය ලේඛනය සකස් කළ බව අපි දන්නව. එතුමා ඒ කළ වැඩවලින් ප්‍රතිඵල ලබා ගන්නා හැටි එතුමා දන්නා බවත් අපි දන්නව. එමෙන්ම අයවැය ලේඛනය සකස් කිරීම සඳහා වේලාවක් නොලැබුණු බව එතුමා කීවා. එහෙත් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වන එක් අවුරුදු සැලැස්මෙන් වැඩිපුර ක්‍රියා කිරීමටයි බලාපොරොත්තු වන්නෙ. දස අවුරුදු සැලැස්මවල් හය අවුරුදු සැලැස්මවල් මේ රටේ ඉදිරිපත් වුණා. නමුත් ඒ කිසිවකින් ජනතාව බලාපොරොත්තු වුණු සේවය ඉටු වුණේ නැහැ. ජනතාව බලාපොරොත්තු වන්නේ සැලැස්මවල් නොවෙයි; ප්‍රශ්න විසඳීමයි. එම නිසා මා ඇමතිතුමාට ස්තුති කරන අතරම, ජනතාව බලාපොරොත්තු වන සේවය මේ වර්ෂය තුළ ලැබේවායි කියාත් ප්‍රාර්ථනා කරනව.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වැදගත් කරුණු රාශියක් මේ අයවැය ලේඛනයෙන් සකස් කර තිබෙනව. විශෙෂයෙන්ම මේ රටේ නිපදවන අමු ද්‍රව්‍ය ගැන ගරු මුදල් ඇමතිතුමා විශෙෂ උනන්දුවක් දක්වන බව මා හොඳාකාර දන්නව. ඒ වගේම මේ රටේ අමු ද්‍රව්‍යවලට, විශෙෂයෙන්ම තේ සහ රබර්වලට, නියම මිළක් ගැනීම සඳහා එතුමා විශාල උනන්දුවක් ගන්නව. එතුමා පමණක් නොවෙයි, ළඟදී ජිනීවා නුවර තිබුණු සාකච්ඡාවේදී කර්මාන්ත ඇමතිතුමාත් මේ ගැන කරුණු ඉදිරිපත් කළා. පොදුරාජ්‍ය මණ්ඩලීය රැස්වීමේදී අපේ ගරු අගමැතිනියත් මේ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළා. නමුත් මේ ආකාර යට කරුණු ඉදිරිපත් කිරීමෙන් පමණක් නම් අපේ බලාපොරොත්තු ඉෂ්ට වන්නේ නැහැ. අමු ද්‍රව්‍ය නිපදවන අනික් ආසියා-අප්‍රිකා රටවල් සමග සාකච්ඡා පවත්වා ශක්තිමත් වැඩ පිළිවෙළක් ඇති කොට ඒ මඟින් බලපෑමක් ඇති නොකළහොත් අපේ බලාපොරොත්තු ඉෂ්ට වේයයි හිතන්ට අමාරුයි. බටහිර රටවල් හැමදාම බලාගෙන ඉන්නේ ආසියා-අප්‍රිකා රටවල මහජනතාවගේ ශ්‍රමයෙන් ජීවත් වන්නටයි. නමුත් හැමදාම ඒ වැඩේ කරගෙන යන්නට ලැබේද කියන එක සැක සහිතයි. දැන් ආසියා-අප්‍රිකා රටවල ජනතාව තුළ වේගවත් නැඟිටීමක් තිබෙනවා. ඒ රටවල් විසින් නිපදවනු ලබන අමු ද්‍රව්‍යවලට සෑහෙන මිළක් ඒ රටවල් බලාපොරොත්තු වෙනවා. දැනට ලැබෙන මිළ නම් ඉතාමත්ම අසාධාරණයයි.

1956 සිට මේ දක්වා තේ මිළ පහළ බැස ගිය ආකාරය ගැන ගරු මුදල් ඇමතිතුමාගෙ අයවැය කථාවේදී කියැවුණා. 1956 දී අපේ තේ රාත්තලකට රුපියල් 3 ක් ලැබුණා; නමුත් 1957 දී ලැබුණේ රුපියල් 2.78 යි; 1958 දී රුපියල් 2.75 යි; 1959 දී රුපියල් 2.72 යි; 1960 දී රුපියල් 2.67 යි; 1961 දී රුපියල් 2.62 යි; 1962 දී රුපියල් 2.52 යි; 1963 දී රුපියල් 2.50 යි. සංඛ්‍යා ලේඛන ගෙන බලන විට 1956 සිට මේ දක්වා තේ රාත්තලකට ශත 50 ක් මිළ අඩු වී තිබෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජේ. ඩී. වීරසේකර මයා.]

නවා. මේ විධියට අපේ අමු ද්‍රව්‍යවලට ලැබෙන මිළ අඩු වී ඇති අතර, ලෝකයේ වෙනත් රටවලින් අප ගෙන්වා ගන්න ද්‍රව්‍යවල මිළ වැඩි වී තිබෙනවා. සමහර ද්‍රව්‍ය සඳහා අපට උසුලන්නට බැරි තරම් මුදල් ප්‍රමාණයක් ගෙවන්නට සිදු වී තිබෙනවා. මෙහි කිසිම සාධාරණයක් නැහැ. එම නිසා ආසියා-අප්‍රිකා රටවල් මේ පිළිබඳව සාකච්ඡා කොට එකඟත්වයකට පැමිණ කිසියම් ශක්තිමත් වැඩ පිළිවෙළක් ඇති කර ගත යුතුයි. එසේ ඇති කොට නියම තතු ලෝකයට පෙන්වා දිය යුතුයි. අපේ ද්‍රව්‍යවලට නියම මිළක් ලැබිය යුතු බව ලෝකයට පෙන්වා දිය යුතුයි. ලංකාව තනියම මේ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමෙන් නම් සෑහෙන ප්‍රතිඵල ලැබේයයි කියන්නට බැහැ.

ලංකාව ගැන සලකන විට තේ මිළ පහළ බැසීම බැරෑරුම් ප්‍රශ්නයක් බව කවුරුනුත් දන්නවා. අපේ තේ රාත්තලකට තව වැඩිපුර රුපියලක් ලැබෙනවා නම් අපේ රටේ තිබෙන ප්‍රශ්න බොහොමයක් විසඳා ගන්නට පුළුවන් වෙනවා. ලංකාවේ ආදායමින් සියයට 80 ක් පමණම ලැබෙන්නේ තේ සහ රබර් යන දෙවර්ගයෙනුයි. එම නිසා අප මේ ව්‍යාපාර දෙකට ලොකු ආදරයක් දැක්විය යුතුයි. මේ ව්‍යාපාර දෙක අපේ දරුවන් දෙදෙනකු සේ සැලකිය යුතුයි. අපේ රටේ දියුණුව තකා අපේ අමු ද්‍රව්‍යවලට සෑහෙන මිළක් ලබා ගැනීම සඳහා ගරු මුදල් ඇමතිතුමා ප්‍රබල සටනක් ගෙන යනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා. කොළඹ වෙළඳ පොළෙත්, ලන්ඩන් වෙළඳ පොළෙත් තේ සඳහා සාධාරණ මිළක් නොලැබෙන බව ගරු මුදල් ඇමතිතුමා අයවැය කථාවේදී ප්‍රකාශ කළා. හැබැයි, තේ මිළ අඩු වීම නිසා තේ පානය කරන රටවල උදවියට සහනයක් ලැබිලත් නැහැ. තේ මිළ ක්‍රමක්‍රමයෙන් අඩු වී ගියත් තේ පානය කරන අයට ඉන් කිසිම ප්‍රයෝජනයක් ලැබී නැහැ. යුරෝපීය පොදු වෙළඳපොළේ තේ තීරු බද්ද තාවකාලික නවත්වා තියෙනවා. ඒ වගේම එංගලන්තය ඔස්ට්‍රේලියාව වැනි රටවල එහෙම පිටින්ම තේ බද්ද නවත්වා තියෙනවා. තේ මිළ අඩු වීමෙන් හෝ මෙම බද්ද ඉවත් කිරීමෙන් හෝ තේ පානය කරන්නන්ටවත් තේ නිෂ්පාදනය කරන්නන්ටවත් ප්‍රයෝජනයක් ලැබෙන්නෙ නැහැ. එසේ නම් එයින් වාසියක් ලැබෙන්නෙ කාටද? අපට ජාත්‍යන්තර වෙළඳපොළේ එතරම් බලයක් නැහැ. අපට එහි බලයක් පාන්න ක්‍රමයක් ඇත්තෙත් නැහැ. එම නිසා අපි මෙම සටනේදී ඉතා ඥානාන්විතව ක්‍රියාකරන්න ඕනෑ. ඒ අය මේ වෙළඳපොළට ඇවිත් අවුරුදු සිය ගණනක් තිස්සෙ අපේ වරප්‍රසාද උදුරා ගෙන අපේ අමු ද්‍රව්‍යවලට නියම මිළක් නොදී ක්‍රියා කළා. එම වැඩ පිළිවෙළ වෙනස් කිරීම ලෙහෙසි නැහැ. ඒ අයගෙ සිත් නොරිදවා අපේ ස්වාධීනත්වයත් ආරක්ෂාකරගෙන අපේ පරමාර්ථ ඉටු කර ගන්න ඕනෑ. මේ භාරදූර කාර්‍ය්‍යය ක්‍රියාවෙ යෙදීමට ගරු මුදල් ඇමතිතුමාට නුවණ තියෙනව. එම නිසා අපට හානියක් කරදරයක් නොවන ආකාරයෙන් අපේ පරමාර්ථ ඉටු කර ගන්න උත්සාහ ගන්න මෙන් මා ඉල්ලා සිටිනව.

විශාල ලංකා තේ වෙළඳපොළක් ඉරාකයෙ තියෙනව. එය සහමුලින්ම තාවකාලිකව නවත්වන්නට සිදු වී තිබෙනවාය කියන ආරංචිය අද පත්‍රයෙන් තමුන්නාන්සෙල දකින්න ඇති. එම රටේ තේ ව්‍යාපාරය ජනසතු කර තියෙනව. එම නිසයි ලංකාවට තාවකාලික අමාරුවකට මුහුණ පාන්න වන්නෙ. මේ කාරණය ගැන අද අදම ක්‍රියා කරන්න ඕනෑ. මේ පිළිබඳව ඉරාක රජයත් සමග සාකච්ඡා පැවැත්වීමෙන් ඒ කියන්නෙ ලංකාවෙන් නියෝජිත පිරිසක් හෝ යවා ඒ රජයත් සමග සාකච්ඡා පැවැත්වීමෙන්—ඒ කියන්නෙ ලංකාවෙන් නියෝජිත පිරිසක් හෝ යවා ඒ රජයත් සමග සාකච්ඡා පැවැත්වීමෙන්——

ලක්ෂ්මන් රාජපක්ෂ මයා.
(திரு. லக்ஷ்மன் ராஜபக்ஸ)
(Mr. Lakshman Rajapaksa)

තමුන්නාන්සෙ නායකය හැටියට යන්න.

ජේ. ඩී. වීරසේකර මයා.
(திரு. ஜே. டீ. வீரசேக்கர)
(Mr. J. D. Weerasekera)

තමුන්නාන්සේ යන්න. මේ අමාරු තත්ත්වයෙන් මිදෙන්න උත්සාහ ගන්න ඕනෑ. මේ රටේ තේවලින් වැඩි කොටසක් ගන්නෙ ඉරාකයයි. එම නිසා එම ප්‍රශ්නය විසඳන්න වහාම ක්‍රියා කරනු ඇත කියා මා කල්පනා කරනව.

අවිස්සාවේල්ලෙ ගරු මන්ත්‍රීතුමාට (ඩී. පී. ආර්. ගුණවර්ධන මයා.) මා ස්තුතිවන්ත වෙනව, එතුමා ඇමතිවරයකු වශයෙන් සිටියදී තේවතු හිමියන්ට ආධාර දීමේ

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

ක්‍රමයක් ඇති කළාට. මේ රටේ ලොකු තේ වතු හිමියන්ට මෙන්ම කුඩා තේවතු හිමියන්ටත් එමගින් විශාල ප්‍රයෝජනයක් අයත් වී තිබෙනව. නමුත් මේ ආධාර දීම්වල ලොකු අසාධාරණයක් සිදු වෙනව. ඉස්සර ලොකු තේවතුකාරයින්ගෙ ආධාරය රුපියල් 2,750 යි. එය රුපියල් 1,000 කින් වැඩි කළ නමුත් කුඩා තේවතු හිමියන්ට ලැබුණු රුපියල් 750 මුදල එහෙමමයි. එම ආධාර දීම අවුරුදු 5 කට පස්සෙ එහෙම පිටින්ම නවත්වනව. මේ මුදල් දෙන්නෙ පෝර දැමීම, කානු කැපීම, යනාදී වැඩ කටයුතු කිරීම සඳහායි. වැඩ කළ පසුයි, ඒ මුදල් දෙන්නෙ. මේ දෙන මුදල් ප්‍රමාණය මදි බව කියන්න ඕනෑ. මේ ආධාර දීමෙන් ආණ්ඩුවට පාඩු වෙන්නෙත් නැහැ. මේ මුදල් ගෙවන්නෙ අමුතු ආධාර ක්‍රමයක් අනුවයි. එම මුදල් එකතු කරන්නෙත් තේ ව්‍යාපාරයෙන්මයි. එම නිසා කුඩා තේ වතු හිමියන්ට දෙන ආධාර මුදල රුපියල් 750 සිට 1,500 දක්වා වැඩි කළ යුතුය කියා මා යෝජනා කරනව. විශෙෂයෙන්ම පෝර අවශ්‍ය වන්නෙ තේ ගස් ලොකු වූ විටයි. තේ ගස් පැළ කාලෙදී එතරම් පෝර වුවමනා කරන්නෙ නැහැ. ලොකු වුණාට පසු පෝර දැම්මාම තමයි නියම ප්‍රයෝජනයක් ලැබෙන්නෙ. මේ නිසා එම ආධාර ක්‍රමය ගැන කල්පනා කර බලා සුදුසු වැඩ පිළිවෙළක් ක්‍රියාවෙ යොදවාවිය කියා මා විශ්වාස කරනව.

විශෙෂයෙන් මේ දිනවල කුඩා තේ වතු හිමියන් විශාල අමාරු තත්ත්වයකට මුහුණ පා සිටිනව. ඒ අයගේ තේ දළුවලට නියම මිලක් ලැබෙන්නෙ නැහැ. තේ දළු විකුණන්න හරියාකාර කර්මාන්ත ශාලා ඇත්තෙ නැහැ. මේ පිළිබඳව අපි නොයෙකුත් අවස්ථාවලදි කරුණු ඉදිරිපත් කර තියෙනව. එම නිසා ගරු ඇමතිතුමා දුක් විඳින පංක්තිය ගැන කල්පනා කර ඇත්වත් ඒ උදවියට සහනයක් දෙනවා ඇතැයි කල්පනා කරනව.

මේ රටේ සංවර්ධන වැඩවලට විදේශීය රටවලින් ලැබෙන ආධාර ගැන මේ අයවැය ලේඛනයේ සඳහන් වෙනව. අපට ආධාර දෙන සෑම රටකටම ප්‍රශංසා කරන අතරම වැඩි වැඩියෙන් ආධාර ලබාගෙන මේ රට දියුණු කිරීමට වේගවත් සැලැස්මක් ඇතිව වැඩ කරනවා ඇතැයි බලාපොරොත්තු වෙනව. අපට ආධාර දෙන සමහර රටවල නම් මා විසින් සටහන් කරගෙන තිබෙනව. කැනඩාවෙන් අපට ආධාර ලැබෙනව. කිසිම ශබ්දයක් නැතිව, කිසිම කරදරයක් නැතිව කිසිම ප්‍රචාරයක් නැතිව විශාල ආධාර තොගයක්ම ඒ රටෙන් අපට දී තිබෙනව. ඒ අතර ඕස්ට්‍රේලියාව, චීනය, චෙකෝස්ලෝවේකියාව, පෝලන්තය, යූ. එස්. එස්. ආර්., යූ. එස්. ඒ., බටහිර ජර්මනිය සහ එංගලන්තය ආදි නොයෙක් රටවලින් අපට නොයෙක් විධියේ ආධාර ලැබෙනව. ඒ සෑම රටකටම ලංකාවේ ජනතාව වෙනුවෙන් අපේ ගෞරවය සහ ප්‍රසංශාව පිරිනමන්ට කැමතියි. මේ රටවලින් අපට තව තවත් ආධාර ලබා ගන්න පුළුවන් බව මා දන්නව. මෙවැනි ආධාර ගැනීමේදී නොයෙක් දේශපාලන පක්ෂ ආධාර කර ගැනීම, සහභාගි කර ගැනීම, අවශ්‍යයි. අපේ විදේශ ප්‍රතිපත්තිය සකස් කර ගැනීමේදී අපට බැහැ කිසිම රටක් සමග විරුද්ධත්වයක් ඇති කර ගන්න. විරුද්ධ වී වැඩ කිරීමෙන් අපට අපේ පරමාර්ථයන් ඉෂ්ට කර ගන්න බැහැ. ලංකාව නිදහස් රටක්. අපේ රට කිසිම රටකට නොදෙවැනි රටක්. ඒ නිසා අපට බැහැ බලවත් කණ්ඩායම්වලට බැඳී සටන් කරන්න. එසේ කරන්න අපට ශක්තියක් නැහැ. සෑම රටකින්ම සහයෝගය ලබාගෙන වැඩ කළොත් අපට හුඟක් ප්‍රයෝජනයි.

වියට්නාමයේ ඇති වී තිබෙන තර්ජන ගැන නමුත්නාන්සෙ දන්නව. සමහර අය තානාපති කාර්යාලවලට ගිහිල්ලා සටන් පාඨ කියමින් කෑකෝ ගහන්න පුළුවනි. හිත් රිදෙන විධියට හැසිරෙන්න පුළුවනි. එහෙම දේ කිරීම අපට කිසි සේත් ඔබින්නෙ නැහැ. පහත් උද්ඝෝෂණ සටන් පාඨ කියමින් නින්දා සහගත ලෙස ඇතැම් අය ක්‍රියා කර තිබෙනවා නම් අපි ඒවා හෙළා දකින්න ඕනෑ. අපේ ස්වාධීනත්වය තබා ගන්න අතර කිසිම රටකට නින්දා අපහාස කරන්න හොඳ නැහැ. එයින් පාඩුවෙන්නෙ ලංකාවටයි. ඒ නිසා අප එවැනි අවස්ථාවක ඉතාම ඥානවන්තව ක්‍රියා කළ යුතුයි. එසේ කිරීමෙන් පමණයි, අපේ දියුණුවට අදාළ වන ලෙස වැඩ කරගෙන යන්න ලැබෙන්නෙ. සෝවියට් බල කණ්ඩායමට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජේ. ඕ. වීරසේකර මයා.]

හෝ ඇමෙරිකන් බල කණ්ඩායමට හෝ එකතු වෙන්න අවශ්‍යතාවක් අපට නැහැ. අපි අපේ ස්වාධීනත්වය තබාගෙන ආධාරත් ලබාගෙන අපේ මූලික පරමාර්ථ ඉෂ්ට කර ගැනීමට උනන්දු වෙමු. එයින් ලංකාවාසී සියලු දෙනාටම යහපතක් වෙන වා ඇති. කලින් ඇතැම් අවස්ථාවල ඇති වූ සිද්ධීන් වැනි දේවල් ලංකාවේ මින් මත්තට ඇති නොවේවායි මා ප්‍රාර්ථනා කරනව.

ලංකාවේ කර්මාන්ත ප්‍රතිපත්තිය ගැන වචනයක් දෙකක් නොකියා බැහැ. ලංකා වේ කර්මාන්ත ප්‍රතිපත්තිය ගැන මට නම් ඒ තරම් සන්තෝෂ වෙන්න බැහැ. අපේ රටේ විශාල කර්මාන්ත රාශියක් පටන් අරන් තියෙනව. කර්මාන්ත පටන් ගන්න වට වඩා අප කල්පනා කරන්න ඕනෑ ඒ සඳහා වුවමනා කරන අමු ද්‍රව්‍යයන් ගැනයි. සෑම අමු ද්‍රව්‍යයක්ම පිටරටින් ගෙන්වා කර්මාන්ත පටන් ගැනීමෙන් අපට නියම ප්‍රයෝජනය ලබා ගන්න බැහැ. විශේෂ යෙන්ම අපේ විදේශ වත්කම් අඩු වී තිබෙන අවස්ථාවක සෑම ශතයක්ම මේ රටේ ඉතිරි කර ගැනීමටයි සිද්ධ වෙලා තියෙන්නෙ. ජාතික සංවර්ධන වැඩවලට ඒ මුදල් යෙදිය යුතුව තිබෙනව. එම නිසා කර්මාන්ත සැලැස්මක් ඉදිරිපත් කරන අවස්ථාවේදී ඒ ඒ අමු ද්‍රව්‍ය තිබෙන ස්ථාන ගැන පරීක්ෂා කර බලා, ඒ පිළිබඳව අවශ්‍ය පර්යේෂණ පවත්වා කටයුතු කිරීමෙන් පමණක් අපට ඒවායින් ප්‍රයෝජනය ලබා ගන්නට පුළුවන් වෙනව. එසේ නැතුව ලෝකයේ වෙනත් රටවල තිබෙන හැම කර්මාන්තයක්ම අප ආරම්භ කරන්නට ගියහොත් එය සාර්ථක කර ගන්නට කොහොත්ම ලැබෙන්නෙ නැහැ. එයින් ප්‍රයෝජනයක් රටට ලැබෙන්නෙත් නැහැ. තවත් කිව යුතු වැදගත් කාරණයක් නම්, ඇතැම් කර්මාන්ත ලංකාවටම පමණක් සීමා නොකළ යුතු බවයි. යම්කිසි පුළුල් සැලැස්මක් යටතේ ලංකාවට කිට්ටු රට වල්, ඉන්දියාව, පකිස්ථානය, බුරුමය, ඉන්දුනීසියාව වැනි රටවල් සමග එක්කාසු වී—වඩාත්ම හොඳයි ආසියා අප්‍රිකා රටවල් සම්බන්ධ කර ගන්නට පුළුවන් නම්—ඒ රටවල සහයෝගය ඇතුව සාමූහිකව ඒ කර්මාන්ත අන්දමට කර්මාන්ත දියුණු කිරීමට වැඩ පිළිවෙළක් යොදනවා නම් වඩාත් හොඳ බව කියන්න පුළුවනි. ඒ වාගේම, අපට නුවුමනා කර්මාන්ත ආරම්භ කිරීමෙන් අප බලාපොරොත්තු වන ප්‍රතිඵල ලබා ගන්නට බැරි වෙන බව මතක් කරන්න ඕනෑ. එමෙන්ම පුළුල් සැලැස්මක් යටතේ කර්මාන්ත ආරම්භ කළොත්, ඒවා දියුණු කර අපේ රටට අවශ්‍ය ප්‍රමාණයට වඩා බඩු භාණ්ඩ නිපදවීමට හැකි වීමෙන් කිට්ටු රට වලට පවා ඒවා යවන්නට හැකි වෙනව. එම නිසා රටට ඔබින, රටට ගැළපෙන, රටේ අමු ද්‍රව්‍යවල ප්‍රමාණය අනුව සැලැස්මක් සකස් කළොත් එය ඉතාමත්ම හොඳය කියා අප කල්පනා කරනව. මම දන්නව, ඇතැම් කර්මාන්ත ආරම්භ කර ඇති නමුත් ඒවා ආරම්භ කිරීමට පෙර වැඩි දුර කල්පනා කර නැති බව. යම්කිසි පුද්ගලයකු යම් දෙයක් කියනවා නම්, ඒ ගැන සෝදිසියක් කරන්නෙ නැතුව, පරීක්ෂණ පවත්වන්නෙ නැතුව, පටන් ගත් කර්මාන්ත තිබෙනව. නමුත් මේවායින් කොයි අන්දමටද අපේ රටේ කර්මාන්ත සංවර්ධනයක් ඇති කරන්න පුළුවන් වෙන්නෙ? එම නිසා කර්මාන්ත යක් ආරම්භ කරන කොට එය රටට ගැළපෙනවාද, එය දියුණු කළ හැකිද කියා පරීක්ෂා කර බැලිය යුතු අතරම ඒ පිළිබඳව කලින් පරීක්ෂණ පැවැත්විය යුතු බවත් මතක් කරන්න කැමතියි.

ඊළඟට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ධීවර කර්මාන්තය ගැනත් මේ අවස්ථා වෙදි යමක් සඳහන් නොකර බැහැ. අපේ රට වටේම තියෙන්නෙ මහ මුහුද. අපේ මුහුදේ තිබෙන මාලු ජපන් රට අල්ලගෙන යනව. නොයෙකුත් අවස්ථාවලදී මේ පිළිබඳව කරුණු ඇමතිවරුන්ට ඉදිරිපත් කර තිබෙනව; මේ පිළිබඳව ඉක්මණින් පියවරක් ගන්නා ලෙස ඉල්ලා තිබෙනව. මන්ද? තවත් අවුරුදු 5 ක් 6 ක් බලා සිටින්නට අපට පුළුවන් කමක් නැහැ. අද ඒ සඳහා මුදල් වැය කළොත් අදම එයින් ප්‍රතිඵල ලබාගන්නට පුළුවනි. එවැනි කර්මාන්තවලට ප්‍රමුඛත්වය දී ඒ මාර්ගයෙන් මෙරට කර්මාන්ත දියුණු කරන්නට කල්පනා කළොත් එය හොඳ බව කියන්න පුළුවනි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඊළඟට මම සන්තෝෂ වෙනව, මේ රට විශේෂයෙන්ම කෘෂිකාර්මික රටක් නිසා කෘෂිකර්මය දියුණු කිරීම සඳහා ඇමති තුමා ආධාර දීම ගැන. මිරිස්, රතුලූනු බොම්බයි ලූනු, අල, ඉරිඟු ආදී ද්‍රව්‍යවලට වැඩි මිලක් දීමට ඇමතිතුමා තීරණය කර තිබෙනව. මෙයද අපේ සතුටට හේතුවක්. තවත් ලංකාවේ නිපදවිය හැකි දේවල් රාශියක් තිබෙනව. විශේෂයෙන්ම අපේ වියලි කලාපයේ දැනට ඉන්දියාවෙන් ගෙන්වන බොහෝ දේවල් වගා කරන්නට පුළුවන. කෘෂිකර්මය ගැනත් අප වැඩි උනන්දුවක් දක්වුවොත් සාර්ථක ප්‍රතිඵල ඉතාමත් ඉක්මණින් ලබා ගන්නට පුළුවන් වෙනවාට කිසිම සැකයක් නැහැ. අපේ ජනතාව කැමති නැහැ ප්‍රතිඵල ලබා ගැනීමට හුඟක් කල් බලාගෙන ඉන්න. ඒ අය බලාපොරොත්තු වෙන්නෙ පුළුවන් තරම් ඉක්මණින් ප්‍රශ්න විසඳනවා දකින්නටයි. මන්ද? අපේ ජනතාව වේගවත් ලෙස ගමන් කරනව. අපේ ආණ්ඩුව හිමින් ගමන් කළොත්, ජනතාව ගමන් කරන වේගයෙන් ගමන් කිරීමට කල්පනා කළේ නැතිනම්, සමහර විට අමාරුකම්වලට මුහුණ පාන්නට සිද්ධ වේවි. එම නිසා මම සන්තෝෂ වෙනව, ද්‍රව්‍ය කීපයකටවත් ස්ථිර මිලක් ගෙවීමට ආණ්ඩුව තීරණය කිරීම ගැන.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම අඩු තරමින් පෝර, ඇට වර්ග ආදී කෘෂිකර්මය දියුණු කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය බෙදා දීමට වැඩ පිළිවෙළක් සකස් කිරීම සුබ ලකුණක් හැටියට පෙනී යනව. නමුත් මෙය පමණක් ප්‍රමාණවත් මදි. මේවා පුළුල් ලෙස සංවිධානය කරන්න ඕනෑ. මේ පිළිබඳ පරීක්ෂණ පවත්වා, නවීන ක්‍රම උපයෝගි කර ගැනීමට ආධාර දෙන්න ඕනෑ. පරණ තාලයට ගොවිතැන් කිරීමෙන් වැඩි ප්‍රයෝජනයක් ලබා ගන්න බැහැ. නවීන යන්ත්‍ර සූත්‍ර පාවිච්චි කරන්න ජනතාව උනන්දු කරවන්න ඕනෑ. ඒ ඒ අංශ පිළිබඳ පර්යේෂණාගාර රාශියක් ඇති කරන්න ඕනෑ. එසේ කළොත් රටට වුවමනා කෘෂිකාර්මික ද්‍රව්‍ය මෙරටේම නිපදවා ගන්න පුළුවනි. මෙහිදී තවත් සැලකිය යුතු කාරණයක් නම් අපට අවශ්‍ය බොහෝ කෘෂිකාර්මික ද්‍රව්‍ය ඉන්දියාවෙන්, බුරුමයෙන් ගෙන්වන බවයි. නමුත් අප ඒ රටවලින් ගෙන්වන ප්‍රමාණයටම බඩු අපේ රටින් ඒ රටවල් ලබා ගන්නෙ නැහැ. ඒක අසාධාරණ වැඩක්. ලංකාවෙ තිබෙන බොහෝ දේ ගැනීමට ඉන්දියාවට පුළුවනි. අපි ඒ රටෙන් යම් කිසි බඩු කොටසක් ගන්නවා නම් අපෙනුත් ඒ ප්‍රමාණයට බඩු කොටසක් ගැනීමට ඒ රටවල් සූදානම් වෙන්න ඕනෑ. අද අපි එවැනි ලෝකයකයි ජීවත් වෙන්නෙ. අපට තනියම ජීවත් වෙන්න බැහැ. අන්‍යොන්‍ය සම්බන්ධතාවය සහ අන්‍යොන්‍ය විශ්වාසය ඇති කර ගෙන වැඩ කළොත් පමණයි අපට ජීවත් වෙන්න පුළුවන් වන්නෙ. එම නිසා අපි ඒ රටවලින් යම් කිසි බඩු ප්‍රමාණයක් ගන්නවා නම් අපි බලාපොරොත්තු වෙනව ඒ රටවල් විසිනුත් අපෙන් ඒ ප්‍රමාණයේ බඩු කොටසක් ගනීවිය කියා. විශෙෂයෙන් පුවක් වැනි දේවල මිල ලංකාවේ ඉතාමත් පහත වැටිලයි තිබෙන්නෙ. ඉන්දියාවෙ මදුරාසිය, බොම්බාය ආදී ප්‍රදේශවල පුවක් මිල ඉතා ඉහළයි. හොණ්ඩරයක් රුපියල් 200 ක් පමණ වෙනව. නමුත් ලංකාවෙ මිල ඉතාමත් අඩුයි. එම නිසා ඒ බඩු එහාට යැවීමෙන් අපට වැඩි පුර මුදලක් ලබා ගන්න පුළුවන් වෙනව. මේ කාරණය සම්බන්ධයෙන් අයවැය ලේඛනයෙන් කරුණු ඉදිරිපත් කර තිබීම ගැන මම සන්තෝෂ වෙනව. ඒ ගැන විශෙෂයෙන් සැලකිල්ල යොමු කරනු ඇත කියා මම බලාපොරොත්තු වෙනව.

ඊ ළඟට මේ රටෙන් විදේශ රටවලට යන ලාභ තාවකාලිකව නවත්වා තිබීම ගැනත් වචනයක් කියන්න ඕනෑ. මේ සම්බන්ධව මම හිතනව අපි ඉතාමත් ඥාණවන්තව සහ කල්පනාකාරීව ක්‍රියා කළ යුතුය කියා. මම මුලින් කිව්වා වාගේ ලංකාවට තනියම මේ ලෝකයේ ජීවත් වෙන්න බැරි බව අපි දන්නව. ඒ රටවල් අවුරුදු ගණනක් තිස්සෙ මේ රට සමග සම්බන්ධකම් පවත්වා, මේ රට සමග ගනුදෙනු කර තිබෙනව. විශෙෂයෙන් එංගලන්තය අමනාප කරගන්නෙ නැතිව අපේ පරමාර්ථ ඉටු කර ගන්න ඕනෑ. නමුත්නාන් සේලාට පේනව ඇති තේ මිල සම්බන්ධයෙන් ලංකාවට එක පාරටම පහර ගහන්නෙ නැතිව, ක්‍රම ක්‍රමයෙන් පහර ගසා තිබෙන බව. අවුරුදු ගණනක් තිස්සේ ක්‍රම ක්‍රමයෙන් මිල අඩු කිරීම නිසා අද ශත 50 කින් තේ මිල අඩු වී තිබෙනව. ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජේ. ඩී. වීරසේකර මයා.]

නිසා අපි කල්පනාකාරීව කටයුතු කරන්න ඕනෑ. විශෙෂයෙන් ආර්ථික අතින් ඉතා දුබල තත්ත්වයක සිටින අපි ඤාණවන්තව සහ කල්පනාකාරීව කටයුතු නොකළොත් සමහර විට අපට බොහෝ අමාරු කම්වලට මුහුණ පාන්නට සිද්ධ වේවි. මුදල් ඇමතිතුමා දක්ෂ ඇමතිවරයෙක්. ටිකක් පෙන්වා දුන්නම හුඟක් තේරුම් ගන්නව. දැනට මේ රටේ තිබෙන එංගලන්තයට අයත් ලාභ කොටස් ගෙන යාම තාවකාලිකව නතර කර තිබෙන නිසයි මේ ගැන කරුණු සඳහන් කළේ. විශෙෂයෙන් තේ මිල අඩු කර දුන් අපේ බෙල්ලට තොණ්ඩුව ද තිබෙන නිසා මේ ලාභ කොටස් ගෙන යාම නතර කිරීම ගැනත් අපි නුවණින් සහ කල්පනාවෙන් ක්‍රියා කරන්න ඕනෑ. මේ ගැන මම හිතනව මුදල් ඇමතිතුමත් කල්පනා කර ඇත කියා. ඒ නිසා අමුතුවෙන් අවවාද දීමට මම බලාපොරොත්තු වෙන්නෙ නැහැ.

මීට වඩා දීර්ඝ වශයෙන් මම කථා කරන්න බලාපොරොත්තු වන්නෙ නැහැ. මුදල් ඇමතිතුමාගේ අයවැය කථාව ගැන ප්‍රශංසා කරන අතර, ලංකා මාතාව බලාපොරොත්තු වන සෑම ප්‍රශ්නයක් විසඳී, විශෙෂයෙන් ආර්ථික ප්‍රශ්නය සහ රැකී රක්ෂා ප්‍රශ්නය ආදි ජනතාවට බල පාන සෑම ප්‍රශ්නයක්ම නුදුරු අනාගතයේදී විසඳී, ලංකාවට සෞභාග්‍යය උදා වේවායි ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසාන කරනව.

අ. භා. 3.37

වී. නවරත්නම් මයා. (කයිට්ස්)
(திரு. வீ. நவரத்னம்—ஊர்காவற்றுறை)
(Mr. V. Navaratnam—Kayts)

கௌரவ உப தலைவரவர்களே, சில நிமிஷ நேரம் தமிழில் பேசி, பின் எனது பேச்சை ஆங்கிலத்தில் தொடர விரும்புகின்றேன். கௌரவ நிதி அமைச்சரவர்கள் வரவு செலவுத் திட்டத்தைச் சமர்ப்பித்து நிகழ்த்திய மகத்தான பேச்சை நாங்கள் பரிசீலனை செய்து அதிலுள்ள சில விஷயங்களை ஓரளவுக்கு வரவேற்கின்றோம். அதிலுள்ள சில விஷயங்களைத் தான் நாங்கள் ஆதரிக்கிறோமென்று சொல்கின்றோமேயன்றி முழு விஷயங்களையும் ஆதரிப்பதாகச் சொல்லவில்லை. இவ் வரவு செலவுத் திட்டத்தில் வரவேற்க முடியாத வேறு சில விஷயங்களும் இடம்பெற்றிருக்கின்றன. அவற்றை எங்களால் வரவேற்க முடியாது.

ஆசிரியர்களது நிவேதனச் சம்பளம் பற்றியுள்ள விஷயத்தை நாங்கள் வரவேற்கும் அதே நேரத்தில், அவர்களது சம்பள விஷயத்திலிருக்கின்ற ஒரு வித்தியாசத்தை—தாரதம்மியத்தை—நிவர்த்திப்பதற்காக கௌரவ நிதி அமைச்சர் எந்தவிதமான நடவடிக்கையும் எடுக்க முன்வராதது குறித்து வருந்துகின்றோம். இவ்விஷயம்பற்றி இன்று நேற்று அல்ல, வில்மட் பெரேரா சம்பளக் கொமிஷன் அறிக்கை வெளியான காலத்திலேயே ஏற்ற நடவடிக்கைகள் எடுக்கப்பட்டிருக்க வேண்டும். வில்மட் பெரேரா சம்பள கொமிஷன் சுயபாஷா ஆசிரியர்களுடைய கோரிக்கையை ஏற்று ஆங்கில ஆசிரியர்களுக்கும் சுயபாஷா ஆசிரியர்களுக்கும் சம்பள விஷயத்தில் எத்தகைய வித்தியாசமும் இருக்கக் கூடாது என்று அரசாங்கத்துக்குச் சிபார்சு செய்திருந்தது. பயிற்சி விஷயத்திலே—போதனை விஷயத்திலே—ஆங்கில ஆசிரியர்களுக்கும் சுயபாஷை ஆசிரியர்களுக்குமிடையில் எந்தவிதமான வித்தியாசமும் இல்லாமலிருக்கின்ற நேரத்திலே, சம்பள விஷயத்தில் மிகவும் பாரதூரமான வித்தியாசங்கள் இருக்கின்றது. இது மிகவும் அநீதியானது. இந்த அநியாயத்தை நீக்க வேண்டுமென்று ஆசிரியர்களுடைய சங்கங்கள் கேட்டிருந்தன. இலங்கை முழுவதிலுமுள்ள ஆசிரிய சங்கங்கள் அத்தனையும் ஒரேமுகமாக சம்பள உயர்வு கோரியிருந்தன. வில்மட் பெரேரா சம்பளக் கொமிஷனின் சிபார்சுக்கிணங்க, இந்த நேரத்திலாவது ஆங்கில ஆசிரியர்களுக்கு ஒரு விதமான சலுகையும், சுயபாஷை ஆசிரியர்களுக்கு இன்னொரு விதமான சம்பளமும் என்ற நிலையை நீடிக்க விடாமல், சம சம்பள விகிதத்தில் சுயபாஷை ஆசிரியர்களை நியமிப்பதற்கு வேண்டிய நடவடிக்கைகளை எடுக்க வேண்டியது அவசியம். "இரு தரப்பு ஆசிரியர்களும் ஒரு விதமான பயிற்சியைத் தான் பெறுகின்றார்கள். ஆதலால் அவர்களுக்கு சம சம்பளம் அளிக்கப்பட வேண்டும்" என்று தான் வில்மட் பெரேரா கொமிஷன் சிபார்சு செய்திருக்கின்றது. இரு பகுதி ஆசிரியர்களது கல்வித் திட்டத்திலோ, பயிற்சியிலோ எத்தகைய வித்தியாசமுமின்றி சரிசமமாக இருக்க வேண்டும் என்றும் அதற்குத் தேவையான நடவடிக்கைகளை அரசாங்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

கம் எடுக்கும் வரையில் சம்பளத்தைச் சமமாக்கி இரு தரப்பு ஆசிரியர்களுக்கும் ஒரே சம்பளம் கொடுக்க வேண்டும் என்றும் கொமிஷன் சிபார்சு செய்திருந்தது. அரசாங்கம் அவர்களுக்கிடையில் எந்தவிதமான வித்தியாசமுமில்லாமல் ஒரே விதமான பயிற்சியைத் தான் அளித்து வருகின்றது. கல்வித் தரத்தையும் ஒரே நிலையில் வைத்திருப்பதற்கு வேண்டிய நடவடிக்கைகளையும் எடுத்து விட்டார்கள். ஆனால் சம்பளத்தைத் தான் இன்னமும் சமமாக்கவில்லை. இது பெரிய அநியாயம். இதைத் திருத்தி ஆங்கில ஆசிரியர்களுக்கும் சுயபாஷை ஆசிரியர்களுக்கும் இடையில் எந்த விதமான வித்தியாசமுமில்லாமல் சம சம்பளம் கொடுக்கும் விஷயத்தை கௌரவ நிதி அமைச்சரவர்கள் கவனிக்க வேண்டும் என்று கேட்டுக் கொள்கின்றேன். இச் சம்பள முரண்பாட்டை நிவர்த்திப்பது பற்றிய விஷயமெதுவும் இந்த வரவு செலவுத் திட்டத்தில் இடம்பெறுமல் போய்விட்டது எங்களுக்குப் பெரிய குறையாக இருக்கின்றது.

இன்று நாட்டிலுள்ள குழந்தைகள் அனைவருக்கும் கல்வி புகட்டும் பெரிய பொறுப்பு சுயபாஷை ஆசிரியர்கள் கைகளிலேதான் தங்கியிருக்கின்றது. அப்படி ஒரு முக்கியமான தொழிலில் ஈடுபட்டிருப்பவர்களில் ஒரு சாராருக்கு ஒருவிதமான சலுகையும் இன்னொரு சாராருக்கு வேறொருவிதமான சலுகையும் அளிப்பது கல்வியின் முன்னேற்றத்துக்கு உதவி செய்யுமென்று நான் கருதவில்லை.

இன்னொரு விஷயத்தில் இந்த வரவு செலவுத் திட்டத்தை நாம் ஆராய்ந்தபோது தமிழ்ப் பிரதேசங்களிலிருந்து பிரதிநிதிகளாக வந்துள்ள எங்களுக்கு பெரும் ஏமாற்றம் ஏற்பட்டிருக்கிறது. தமிழ்ப் பிரதேசங்களின் பொருளாதார அபிவிருத்தியை மேம்படுத்த எவ்வளவோ வசதிகள் அங்கே இருக்கின்றன. அப்படியிருந்தும்கூட இந்த வரவு செலவுத் திட்டத்திலே வடக்குக் கிழக்கு மாகாணங்களுக்கு அதிக முக்கியத்துவம் கொடுக்கப்படவில்லை. முக்கியமாக வடக்குக் கிழக்கு மாகாணங்களிலுள்ள விவசாயிகள் நாட்டிற்குத் தேவையான உணவு வகைகளை உற்பத்தி செய்ய அவாக் கொண்டிருக்கிறார்கள். அதற்கான பயிற்சி மாத்திரமன்றி விருப்பமும் கூட அவர்களிடம் இருக்கிறது. ஆனால் விவசாயம் செய்வதற்குத் தேவையான காணிகள் அவர்களிடம் இல்லை. அவர்களுக்குத் தேவையான காணிகளைக் கொடுத்து இந்த அரசாங்கம் அவர்களை உணவு உற்பத்தியில் ஊக்கப்படுத்த வேண்டும். ஆனால் அரசாங்கமோ இது விஷயத்தில் எதுவித நடவடிக்கையையும் எடுப்பதாகத் தெரியவில்லை. அதற்குமாறாக இந்த அரசாங்கம் என்ன செய்கிறது? யாழ்ப்பாணத்திலுள்ளவர்களுக்குக் காணிகளை வழங்கச் சமீப காலத்தில் சில நடவடிக்கைகள் எடுக்கப்பட்டன. தகுதியானவர்கள் பலர் காணிக்கச்சேரி மூலம் தேர்ந்தெடுக்கப்பட்டார்கள். ஒரு திகதியில் காணிகளைப் பாரம் எடுக்கும்படி கூட அவர்கள் கேட்கப்பட்டிருந்தார்கள். ஆனால் அதற்கிடையில் மேலிடத்து உத்தரவுப்படி இந்தக் குடியேற்ற நடவடிக்கை நிறுத்தி வைக்கப்பட்டிருக்கிறது. அரசாங்கத்தின் இந்த நடவடிக்கை அப்பகுதி மக்களுக்குப் பெரும் ஏமாற்றத்தை உண்டுபண்ணியிருக்கிறது. இந்த விஷயத்தை இச்சந்தர்ப்பத்திலே காணி நீர்ப்பாசன மின்விசை அமைச்சரின் கவனத்திற்குக் கொண்டுவர விரும்புகிறேன். குறித்த காணிக் கச்சேரி மூலமாகத் தெரிந்தெடுக்கப்பட்டவர்களுக்கு உடனடியாக காணிகளை வழங்கி அவர்களைக் குடியேறச் செய்வதற்கான நடவடிக்கைகளை அரசாங்கம் எடுக்க வேண்டுமென்று கேட்டுக் கொள்ளுகிறேன். நேற்றைய தினம் பேசிய கௌரவ உடுப்பிட்டிப் பிரதிநிதி (திரு. எம். சிவசிதம்பரம்) அவர்கள் காங்கேசந்துறைத் துறைமுக அபிவிருத்தி பற்றி விரிவாகக் குறிப்பிட்டார். அதைப் பற்றி மீண்டும் இங்கே குறிப்பிட நான் விரும்பவில்லை. ஆனால் வடக்குக் கிழக்கு மாகாணங்களினது முக்கியத்துவத்தை அரசாங்கம் இன்னும் உணரவில்லை என்பதுதான் எனது குறையாகும். வடக்குக் கிழக்கு மாகாணங்களில் மீன்பிடித் தொழிலுக்கு அதிக வசதியிருக்கிறது. அங்கே மீன்பிடித் தொழிலுக்கு வாய்ப்பான எத்தனையோ சிறிய சிறிய துறைகள் இருக்கின்றன. இலங்கையில் கிடைக்கும் மீனில் அறுபதுசத விகிதமான மீன் தமிழ்ப்பிரதேசங்களிலிருந்தே கிடைக்கின்றது. அப்படியிருந்தும் மீன்பிடித் தொழில் சம்பந்தமாக எந்த விதமான சலுகையையும் வடக்குக் கிழக்கு மாகாணங்களுக்கு அரசாங்கம் செய்யவில்லை. இப்பகுதியில் பிடிக்கப்படும் மீன்களின் விகிதாசாரத்திற்கேற்ப ஆக்கபூர்வமான நடவடிக்கைகளை அரசாங்கம் எடுக்க வேண்டுமென்றும் கேட்டுக் கொள்ளுகிறேன்.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[නවරත්නම් මයා.]

I will now turn to English. I should like to congratulate the Hon. Minister of Finance on the marathon speech that he delivered in introducing the Budget—a speech that runs into some 76 pages of closely printed matter. For sheer erudition and marshalling of facts, for the patient and laborious survey of the vast field of the economic situation of the country, it could hardly be surpassed by any other living economist in Ceylon today. Though some of us on this side of the House may not agree with him on everything he has said, I do not think there is any one who would grudge him the tribute that he richly deserves. To what extent the Hon. Minister is going to succeed in implementing the various measures and policies he has propounded, I do not know. But I do know that he has succeeded in bringing out to the open pavement all the hoarded textiles, foodstuffs and other consumer articles. I do not think it was the Budget speech and the proposals contained therein that did the trick. The process had started even long before that. When the Coalition Government was formed and it was known that the eminent doctor had been given the portfolio of Finance, the process started. That shows the holy horror and awe in which anti-social elements among businessmen held the Hon. Minister of Finance. I hope he will not disillusion them.

This is one way in which people reacted to the Budget proposals. There are others who think that this is only a temporary scare and that the traders know best how to deal with the Finance Minister. There are some others who take the view that this is more a vote-catching device and a political stunt than a genuine attempt to pull the country out of the economic rut into which it has fallen. These are some of the normal reactions to an annual Budget Speech. But what I am most concerned about, what the Party to which I have the honour to belong is concerned about, is to find the answers to the questions, "To what extent will these Budget proposals relieve the burdens of the ten million people who elected us and sent us here as their representatives in this august Assembly to govern and look after their affairs"? "How far will this scheme fulfil the hopes and aspirations of the ten million people as a whole, not merely the insignificant minority of urban workers"? "What attention is proposed to be paid to the Tamil-speaking section of the country"? We of the Federal Party, though we are very much interested in the affairs of the country as a whole, are naturally here as watch dogs of the particular interests of the Tamil-speaking people. I am afraid the answers to these questions cannot enthuse us. The Budget is what it should not be. It is an instrument intended to further the cause of parties and politics rather than to take the country on the road to planned development, economic progress, peace and prosperity and all that goes to make a welfare state. It perpetuates class warfare, pitching one class against another. Apart from pampering and molly-coddling the vociferous trade union representatives and urban working classes by a few gimmicks like the increase of wages of the lowest paid category of Government servants, a five-day week for Government servants, income tax relief, and so on, the Budget does not touch the fringe of the problems of the vast majority of the population of this country, the problems of the high cost of living and unemployment under the weight of which the vast majority of the population is being ground.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

I certainly do not grudge these benefits to the working class. On the contrary, I welcome them. But then they cannot constitute more than a million at the most. But what about the balance nine million and more? What are the plans that the Government have to alleviate the sufferings and hardship of these nine million odd people? The Budget does not enlighten us except for a few pious hopes and guesses.

Various speakers before me have spoken on the Government's failure to plan for a solution of the problems of unemployment and the spiralling cost of living and I do not wish to dwell on them except to state that according to the Government's own figures the back-log of unemployment in 1964 is 469,000. Of these I do not know how many are the educated unemployed. But I am certain that there cannot be a single Sinhala graduate among them.

Every Sinhala youth who graduates from the University or otherwise is straightway absorbed into the Public Service or the teaching profession. But, alas, there are about 150 to 200 graduates in the Tamil areas who are rusting in their homes for want of employment. When they ask for appointments as teachers they are told by the Government, "Go to Ghana." I challenge the Government to tell that to the Sinhala educated youth.

A number of schools in the Tamil-speaking areas are crying for graduate teachers in order to give the children a better education. And here are about 200 graduates eager and anxious to take up the work, but the Government says that there are no funds. In the same breath the Government plans to recruit 2,000 Sinhala teachers to be sent to the Tamil areas. Actually, there must be a limit to hypocrisy.

There are a million Tamil workers on the plantations who are the backbone of the country's economy. What does the Coalition Government of which the L. S. S. P. is a partner propose to do to solve the problems of those workers? The L. S. S. P. in opposition have been good enough to participate in the formulation and presentation of the 21 demands and to buttress these demands with their strengthened position. But when it comes to a question of formulating policies from the Treasury Benches, the L. S. S. P. has no qualms about sacrificing these people on the altar of expediency. They just do not count.

I take this opportunity to mention to my friends, the leaders of the great trade unions of these Tamil workers, the D. W. C. and the C. W. C., that the stage has been set in the Budget proposals which will eventually result in the wholesale ejectment of the Tamil workers from the plantation areas, for that will be one of the sure results of the proposed tax on tea estates and of the control of managing or agency houses. I do hope that the leaders of the D. W. C. and the C. W. C. who have been used to hanging on to the coat-tails of the L.S.S.P. will not be taken unawares.

The Department of National Planning recently issued a brochure entitled, "The Development Programme, 1964-65." The contents of this book show that it has to be treated either as an introduction or as a supplement to the Budget Speech of the Minister of Finance, perhaps as an introduction since it was released earlier than the Budget speech. I

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

wish to invite the attention of the honourable House to a certain passage in the book at page 22. While dealing with the question of the population and employment, the author, namely the Government, says:

"But the high fertility and low mortality which characterize the population growth in Ceylon has resulted in an age-structure in which there is a large proportion of children who are dependants and consequently a small proportion of adults who are earners. Nearly 42 per cent of the population is below 14 years of age. A heavy youth dependancy means——"

This is most important:

"that a substantial portion of the national income goes to maintain young persons with no immediate benefit to the community."

I repeat, "with no immediate benefit to the community." I held my breath when I first read this passage. I am not an economist and I do not know, and I do not care to know, the mathematics of abstract economic propositions. But I do know that hon. Members will not subscribe to this astounding proposition that expenditure of our income to maintain our children is of no immediate benefit to the community. In any other country the children and youth are considered to be the greatest and priceless national wealth, but our bookworm author-economist, whoever he may be, who may probably be consuming a large slice of our national income, tells us that investment on our children is only of remote benefit. Perhaps the sadistic attitude of the Government explains the chaotic conditions prevailing in the field of education. Having compulsorily nationalized the schools, you are today ruining the children's education by economizing and being stingy. It is certainly because of the rupees and cents involved and not on any educational ground that you have adopted the system of admitting a child to school only when the child has completed six years of age, thereafter taking this child from class to class, without any regard or proper appraisal of the progress made in studies, allowing the child to sit for the school leaving examination twice and then pushing it out into the world. So, you have marvellously fulfilled your obligations. What type of people our future citizens are going to be with this type of education, I really do not know. I presume that the Government's White Paper on education will come up shortly for discussion in this House and I shall then deal with this subject more fully.

Certainly credit must go to the Hon. Minister of Finance for having removed the anomaly in regard to teachers' pensions, but there is a greater anomaly in regard to their salaries which is yet being perpetuated. I regret that the Hon. Minister has not yet thought it fit to remove this anomaly. The Wilmot Perera Commission in their report pinpointed and drew attention to the inequality that exists between the salaries of the Sinhala-trained teachers and the English-trained teachers. They felt that there was not the slightest justification for the perpetuation of this inequality.

The Commission recommended that the Government should take immediate steps to standardize the level and content of the professional qualifications so that the quality of the teachers would be the same irrespective of the medium through which the qualifications were obtained.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

The Commission recommended further that in the meanwhile the two categories of teachers should be placed on the same salary scale. But what the Government did was rather curious. They ignored the payment of the salary part of the recommendation and adopted the standardization.

කාරකසභා නියෝජ්‍ය සභාපති
(குழுக்களின் பிரதி அக்கிராசனர்)
(Mr. Deputy Chairman of Committees)

Order, please! The Sitting is suspended till 4.30 P.M.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ. භා. 4.30 ට නියෝජ්‍ය කථානායක තැන් පත් ඩී. ඒ. රාජපක්ෂ මහතාගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

නවරත්නම් මයා.
(திரு. நவரத்னம்)
(Mr. Navaratnam)

Mr. Deputy Speaker, I was on the question of teachers' salaries just before the interval. I was dealing with the report of the Wilmot Perera Commission. I said that what the Government did was rather curious. The Government ignored the salaries part of the recommendation and adopted the recommendation regarding the standardizing of teachers' qualifications with the result that today all teachers go through the same two year course, follow the identical syllabus in one of the three languages—Sinhala, Tamil or English—and answer the identical examination papers in one of the three languages. But, still the Swabasha trained teacher continues to start with Rs. 88 per mensem, whereas his English counterpart starts with Rs. 155 per mensem. This is an injustice, Sir, that the Hon. Minister of Finance must strain every nerve to remove. When efforts are being made to standardize the teaching imparted in the rural schools where the vast majority of Swabasha teachers are employed today, and the distinction between the English and Swabasha schools is being sought to be eliminated, it is incongruous that the old anomaly should continue. It is also difficult to expect the teachers to put in hard work or give of their best.

Admittedly, this country is going through a difficult period both politically and economically. It is not enough merely to be conscious of that. Ever since the S.L.F.P. took over there has been no peace in this country. With the Sinhala-Tamil problem remaining a running sore there can be no peace. During the lifetime of this Parliament alone more than two years have been spent under Emergency laws. Even now the country is haunted by the spectre of political instability, totalitarianism and dictatorship. Let me say in all sincerity, and with the best interest at heart of the country as a whole that unless and until you solve the Tamil-Sinhala problem, unless and until you get the willing co-operation of the Tamil-speaking people, who constitute a third of this country, both in terms of population and the territory they occupy, you will not be able to take one step forward on the road to development and progress. I would like to take the example of a bullock cart. Both the bulls must be in line and pull the cart in unison. If one is crippled and deliberately made to lag behind the cart cannot progress. The crippled animal would be a drag on the other.

I think it is agreed on all sides that the paramount need of the country today is to industrialize as far as we could, but the trouble is that we are not agreed as to the best way in which that can be achieved.

The fight between socialism and capitalism has become a fashion in many of the underdeveloped countries and the resultant tussle for power holds up development and industrialization. The Budget Speech of the Hon. Minister of Finance and the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Debate thereon have clearly brought that out. The interests of the country demand that we eschew both extremes and strike a balance—the middle path as you call it.

The middle path of the S.L.F.P. has not succeeded not because of any intrinsic defect in the middle path but because of the chauvinistic Sinhala-imperialist outlook of the Government.

The S.L.F.P. Government sat on everything; it monopolized everything—industries, land, capital—all the resources that can and should be tapped for better production and more production.

With the new orientation that has now been given to the Government, I would appeal to the Hon. Minister of Land, Irrigation and Power and to the Hon. Minister of Rural and Industrial Development to look upon the Tamil-speaking areas of the north and east as an equally important part of our common motherland and to see that equal opportunities are given to the Tamil-speaking people, particularly their youth, to work, develop and exploit the resources of those areas.

The people are there, anxious to work and to contribute their share to the general weal; the resources are there to be exploited. What is wanted are opportunities and Government encouragement. Given the encouragement and the opportunities, I make bold to say that the Tamil-speaking people alone will see to it that Ceylon becomes self-sufficient at least in the matter of the staple food of the country within a very short period of time.

But, unfortunately, the curse of discrimination stands in the way—discrimination in giving land, discrimination in granting licences for new industries, discrimination in employment. If you genuinely feel that Ceylon as a whole should make progress, for heaven's sake, give up this outlook once and for all. This attitude may get you votes but it will not help you to develop the country.

We know of cases where Tamil citizens who applied for licences for the import of machinery or to start new industries were told, not in writing but verbally, "If you site the factory in south Ceylon we will grant you the necessary licences." When the applicants expressed their difficulties, the officials shrugged their shoulders and said, "Then there is nothing we can do about it." Such statements were made verbally, not in writing.

That sort of outlook, that sort of officialdom, must disappear if the Tamil speaking people also are to contribute their mite for the common development of this country. Whatever the language they speak, they must be treated as equals; they must be treated as citizens of this country; they must be encouraged to put in capital, to put in hard work and develop the country, as fast as possible. If you are going to look into the race, the community or the language of the people who want to set up industries, it would be a sad day for Ceylon. That is why I say this discrimination must go.

The Hon. Minister of Finance in his Budget proposals suggested that by levying the house property tax, he proposes to divert the capital that is blocked in houses into national industries and ventures. I hope he will succeed in that measure of his. I am a bit sceptical that the people who will be selling their houses would divert the monies collected therefrom into national industries, but I do wish the Hon. Minister would succeed in that measure of his because it is unproductive capital that is blocked.

I would suggest to the Government that one way of attracting this private capital would be by offering shares in the present State-owned industrial ventures so that private capital also might participate in their management and control. Certainly the Government must preserve to itself the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

control by retaining, say, 51 per cent of the shares. If shares are offered to private capital, I am sure a large number of people would like to come into these industrial ventures, because of the sense of security born of the Government being the major shareholder, and for various other reasons. Perhaps the Government may even be able to recover a portion of the capital that it has invested in these industrial ventures and divert it to new industries. I would earnestly suggest this proposition for serious consideration by the Government.

I have analyzed the Budget proposals and the national development programme. but I am sadly disappointed that the Tamil-speaking areas have not been given due weight in the programmes that have been propounded. We do not see any new ventures proposed to be started in those areas.

Take, for instance, the fishing industry. The Tamil-speaking areas produce more than 60 per cent of the total amount of fish caught in Ceylon. Still, very, very step-motherly attention is paid to the fishing industry in the Northern and Eastern Provinces. The other day, at the Jaffna District Coordinating Committee meeting, we deplored the fact that in spite of the Department having informed the northern office of the Fisheries Department and the Government Agent that Russian experts were visiting Ceylon and that they would probably be visiting Jaffna, these experts had already visited the Island and left without an opportunity of visiting the north. No attempts had been made to take these experts to the northern and eastern areas and show them the fishing industry there. Such discriminatory attitudes must be given up.

There is the Paranthan Chemical Works at Paranthan. Ever since it was established it has been running at a loss for the simple reason that it is not in full production, and it can never be in full production so long as the present set-up continues.

The Government has made no efforts to find markets for certain products of the factory. The only product that is marketed is caustic soda, which is supplied to Lever Bros. in Colombo, the one and only customer who purchases the entire output. Hundreds of tons of chlorine on the other hand are just let out into the air because there is no market. The Government is not exploring the possibilities of finding markets. I think some people had even suggested that the Government should endeavour to negotiate with some of the countries which supply us with various goods, for example Burma, for a barter agreement. Burma could give us rice and we could give them chlorine or some other product of the Paranthan Chemical Works. There is a precedent in the pact with China, the rice-rubber deal. Why not emulate that example and explore the possibility of marketing chlorine as well. There are various other products we just let into the drain. The factory is not being made use of to the fullest extent that would benefit the national economy. All these things, I suggest, would disappear probably if private capital is also invited so that the management too may be handed over to private investors while the Government owns a controlling share. They may work the factories and industries on a commercial basis.

These are matters which I commend to the Government for serious consideration.

අ. භා. 4.46

ශ්‍රීමත් ඇල්බට් පීරිස්
(சேர் அல்பேட் பீரிஸ்)
(Sir Albert Peries)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අය වැය ලේඛනය ගැන කථා කරන්ට ප්‍රථම යෙන් මුළු ලංකාවේම ජනතාවට පහර වදින අන්දමේ ප්‍රශ්නයක් ගැන ගරු මුදල් ඇමතිතුමාගෙන් දැනගන්ට තිබෙනව. මේ ප්‍රශ්නයට මුදල් ඇමතිතුමාගෙන් උත්තර යක් ගන්න මා බලාපොරොත්තු වෙනව. ප්‍රශ්නය මේකයි. ලංකාවේ පත්‍ර එහෙම නැත්නම් "ප්‍රෙස්" එක ආණ්ඩුවට භාර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ශ්‍රීමත් ඇල්බට් පීරිස්]

ගන්න අද රැ කැබිනට් මණ්ඩලය රැස් වෙනවාය කියා මට ආරංචියක් ලැබී තිබෙනව. පත්‍ර සම්බන්ධව කොමිෂන් සභාවක් පත් කළා. ඒ කොමිෂන් සභාවේ වාර්තා වත් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකර, ඒ වාගේම වෙනත් නීති මාලාවක් වත් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකර, හදිසියේම පත්‍ර රජයට ගන්න අද කැබිනට් මණ්ඩලය රැස්වෙනවාලු. ඒ විධියට පත්‍ර රජයට ගත්තොත් මේ රටේ තත්ත්වය කුමක්ද කියා ඔබතුමාට කියන්න වුවමනා නැහැ. එසේ කළොත් ප්‍රජාතන්ත්‍රවාදය මේ රටින් සම්පූර්ණයෙන්ම ඉවත් වී යෑම පුදුමයක් නොවෙයි. අද දවසේ අපේ නිදහස ආරක්ෂා කරගෙන තිබෙන්නෙ අපට වුවමනා හැටියට කථා කර ඒවා පත්‍ර මාර්ගයෙන් මහජනතාවට දැනුම් දී මහජනයා තීරණය කරන අන්දමට වැඩ කිරීමෙනුයි. මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය රැඳී තිබෙන්නෙ ඒ විධියටයි.

අද මේ ආණ්ඩුවෙන් සහ මේ ආණ්ඩුවට ආධාර දෙන උදවියගෙනුත් නොයෙක් දූෂණ කෙරීගෙන යන බව බොහෝ දෙනෙක් දන්නව. විරුද්ධ පාර්ශ්වය ඒවා සම්බන්ධයෙන් ප්‍රශ්න අසන්ට ලෑස්ති කර තිබෙනව. ඉතින් ඒ දූෂණ මහජනතාවට ආරංචි වේය යන භයට මේ විධියට පත්‍ර රජයට ගන්න ලෑස්ති වෙනවාය කියා අපට දැනගන්නට ලැබී තිබෙනව. එම නිසා ගරු මුදල් ඇමතිතුමා මගේ ප්‍රශ්නට උත්තරයක් දෙනවද? මා ඇමතිතුමාගෙන් ඉතාමත් ගෞරවයෙන් සහ කරුණාවෙන් ඉල්ලා සිටිනව.

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
(கௌரவ கலாநிதி என். எம். பெரேரா)
(The Hon. Dr. N. M. Perera)

කැබිනට් රැස්වීම පවත්වන්නත් පෙර මගෙන් ප්‍රශ්න ඇසුවාම කොහොමද උත්තරයක් දෙන්නෙ?

ශ්‍රීමත් ඇල්බට් පීරිස්
(சேர் அல்பேட் பீரிஸ்)
(Sir Albert Peries)

එහෙම ආරංචියක් තිබෙනව.

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
(கௌரவ கலாநிதி என். எம். பெரேரா)
(The Hon. Dr. N. M. Perera)

කැබිනට් රැස්වීමක් තිබෙන බව නම් මා දන්නව. නමුත් මොනවා කරන්ට යනවාද කියා මට කියන්ට බැහැ.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(டொக்டர் கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

කථික ගරු මන්ත්‍රීතුමාට මේ ආරංචිය ලැබුණේ කාගෙන්ද කියා මා අසන්ට කැමතියි. මොකද? කැබිනට් මණ්ඩලයේ රහස් ඇමතිවරයකුගෙන් කලින් පිට කරන ලෙස ඉල්ලීමක් කරන විට ඒ ආරංචිය දුන්නෙ කව්ද කියා මේ ගරු සභාවට කියන්න යුතු කමක් තිබෙනව.

ශ්‍රීමත් ඇල්බට් පීරිස්
(சேர் அல்பேட் பீரிஸ்)
(Sir Albert Peries)

කව්ද කියා කියන්න මා බැඳී නැහැ.

ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා
(டொக்டர் கொல்வின் ஆர். டி சில்வா)
(Dr. Colvin R. de Silva)

එහෙම නම් ඒ ආරංචිය අපි පිළිගන්නෙ කොහොමද?

ශ්‍රීමත් ඇල්බට් පීරිස්
(சேர் அல்பேட் பீரிஸ்)
(Sir Albert Peries)

ඊළඟට මේ අයවැය ලේඛනය සම්බන්ධයෙන් මට නියම කර තිබෙන කාලය තුළ වචනයක් දෙකක් කියන්ට අදහස් කරනව. මේ අයවැය ලේඛනය ඉතාමත්ම අලංකාර අයවැය ලේඛනයක්ය, මහජනතාව බොහොම සන්තෝෂයෙන් පිළිගත් අයවැය ලේඛනයක්ය කියා ටික දෙනෙක් කියන්ට යෙදුණා. මේ ආණ්ඩුවේ මුදල් ඇමතිවරුන් 5 දෙනා ඉදිරිපත් කළ අයවැය ලේඛන අතුරෙන් ඉතාම නරක අයවැය ලේඛනය මෙය බව මගේ වැටහීමයි. එහෙත් කථාවෙන් නම් එය ඉතා ලස්සණට පෙන්නුම් කර දුන්න. වචන, වචන, වචන! පැය 4 ක් තිස්සෙ වතුර ගලන්නා වගේ වචන ගැලුව. වචන ජනතාවට කන්ට පුළුවන් දෙයක් නම් මගේ කල්පනාවෙ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

හැටියට මේ අයවැය ලේඛනය ඉතා හොඳ එකක් යයි කියන්ට පුළුවන්. එහෙත් වචන කන්ට පුළුවන්කමක් නැහැ.

අපි පදිංචිව සිටින්නෙ ගම්බද කොට්ඨාශ වලයි. මේ අයවැය ලේඛනය පිළිබඳව ඔබේ අදහස් කොහොමද කියා ගම්බද කීප දෙනකුගෙන් මා අසා බැලුව. ඒ උදවිය කියා සිටියේ කුමක්ද? මේ මුදල් ඇමති තුමා—ආචාර්ය එන්. එම්. පෙරේරා මැති තුමා—මේ රටේ ආර්ථික තත්ත්වය දියුණු කරන්ට පුළුවන්කම ඇති දක්ෂ කෙනෙක් නිසා එතුමා ඉතා හොඳ අයවැය ලේඛන යක් අපේ ජනතාවට—විශෙෂයෙන්ම ගම් බද ජනතාවට—ප්‍රයෝජනවත් වන අන්ද මට ඉදිරිපත් කරාවි යයි ඔවුන් බලා පොරොත්තු වුණු බවත්, එහෙත් ගම්බද ජනතාවට ප්‍රයෝජනවත් වන අයවැය ලේඛනයක් එතුමා ඉදිරිපත් කර නැති බවත් ඔවුන් ප්‍රකාශ කළා. ගම්බද ජනතා වගේ කිසිම ප්‍රශ්නයක් විසඳන්න මේ අය වැය ලේඛනයෙන් යෝජනා ඉදිරිපත් කර නැහැ. විශේෂයෙන් ජීවන වියදම පහළ දමයි කියා ඒ උදවිය බලාපොරොත්තුව සිටිය. සීනිවල මිළ, පිටිවල මිළ හෝ වෙනත් එදිනෙදා පාවිච්චියට ගන්න බඩු වල මිළ අඩු කරාවි යයි ඔවුන් අදහස් කළා. ඒ කිසිවක් කර නැති බව මෙයින් පෙනී යනව.

මෙයින් බහුල ජනතාවගේ ප්‍රශ්න විසඳා නැහැ. අද දවසේ ජ්‍යෙෂ්ඨ සමතුන් විශාල සංඛ්‍යාවක් රක්ෂා නැතිව සිටිනවා. උපාධි ලැබූ රක්ෂාව නැති උදවියත් විශාල ගණනක් සිටිනවා. එතරම් උගත්කමක් නොලැබූ රක්ෂා නැති උදවියත් විශාල පිරිසක් සිටි නවා. ඒ උදවිය ගැන මුදල් ඇමතිතුමා එක වචනයක්වත් කිව්වේ නැහැ. ඒ උදවියට රක්ෂා දෙන පිළිවෙළක් යෝජනා කළේ නැහැ. අද රටේ 5,50,000 ක් පමණ රක්ෂා නොමැති උදවිය සිටින බව ලංකාවේ කාට වුවත් පෙනී යනවා. මෙයින් 39,000 කට පමණ රක්ෂා ලබා දෙන බව අයවැය ලේඛනයේ සඳහන් වී ඇතත්, ඒ සංඛ්‍යා වටවත් රක්ෂා ලැබේයයි සිතන්ට අමාරුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අය වැය කථාවෙන් පෙනී ගියා ශ්‍රී ලංකා නිද හස් පක්ෂයේ තිබෙන දුර්වලකම්. අපි වැඩිදුරට කථා නොකළාට ඒ අයවැය කථාව හොඳ හැටි කල්පනාවෙන් කියවන කෙනෙකුට පෙනී යනවා ඇති, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දුර්වලකම්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුව අවුරුදු 4ක් තිස්සේ කරගෙන ගිය මුදල් නාස්තිය මේ අයවැය කථාවෙන් පෙනී යනව. සංයුක්ත මණ්ඩලවලින් සිදු වී තිබෙන මුදල් නාස්තිය මෙයින් පෙනී යනව. රජයේ වැඩ දෙපාර්තමේන්තුව වැනි දෙපාර්තමේන්තුවල සිදු වූ මුදල් නාස් තිය මෙයින් පෙන්වා දී තිබෙනව.

මේ අයවැය ලේඛනයෙන් ඉතා සුළු පිරි සකට ප්‍රයෝජනයක් සැලසී තිබෙනව. මේ අයවැය ලේඛනය අනුව සුළු සේවකයින් ට මාසයකට සිලිං 5 ක් පමණ පඩි වැඩි වී තිබෙනව. පහළ ආදායම් බදු ගෙවන කොටසට බද්ද රුපියල් 100 ක් පමණ අඩු වී තිබෙනව.

ඒ අතර නියම අන්දමට විසඳා නැති ප්‍රශ්න කීපයකුත් තිබෙනව. මට කලින් කථා කළ මහත්වරු කීප දෙනෙකුත් ධීවර කර්මාන්තය ගැන සඳහන් කළා. අපේ ලංකාව වටේම තිබෙන්නෙ මුහුද. මීට පෙර අවස්ථාවලදිත් මම බොහෝ දුරට මේ ගැන ප්‍රශ්න කළා. අයවැය ලේඛනය දෙස බැලුවම පෙනෙනව, මේ වර ධීවර කර්මාන්තය දියුණු කිරීම සඳහා වෙන් කර තිබෙන්නේ ඉතා සුළු මුදලක් බව. ඒ ගැන මම කනගාටු වෙනව. ධීවර කර්මාන්තයේ යෙදෙන අයගේ පදිංචිය සඳහා ගෙවල් විශාල වශයෙන් වුවමනා කරනව. නමුත් ඒ ගෙවල් සෑදීම සම් බන්ධ මුදල් ප්‍රමාණය බොහෝ දුරට අඩු කරල තියෙනව. ඒ ගෙවල් ප්‍රමාණය සම් පූර්ණයෙන්ම හැදීමට රුපියල් ලක්ෂ 600 ක් පමණ වුවමනා කරන නමුත් ඒ සඳහා වෙන් කර තියෙන්නෙ ලක්ෂ 70 ක් පමණයි. ඒ මිනිසුන්ගේ ගෙවල් සෑදීම සඳහා වෙන් කර තිබෙන්නේ වුව මනා තරමට වඩා කොයි තරම් අඩු ප්‍රමා ණයක්ද කියා එයින් තමුන්නාන්සෙලට පෙනෙනවා. ඒ මිනිසුන්ගේ ගෙවලට ගිහින් බැලුවොත් තමුන්නාන්සෙලා කන ගාටු වෙනව ඇති. බොහොම පොඩි පැල් පත්වල බොහොම අමාරුවෙන් ජීවත් වෙමින් ඉඳගෙනයි, පාන්දර දෙකට, තුනට මුහුදට ගිහින් ඒ අය අපට කෑමට මාළු හොයාගෙන එන්නෙ. සමහර විට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මසුන් මරන්න යාමේදී ඔවුන්ගේ ජීවිතය පවා හානි වෙලා තියෙනව. ඔපමණ මහන්සි වී අප ගැන වැඩ කරන අය සම්බන්ධයෙන් අපි අනුකම්පාවෙන් කටයුතු කරන්න ඕනෑ. නමුත් ඒ අයට වුවමනා ගෙවල් ප්‍රමාණයෙන් ඉතා ස්වල්පයයි, මේ වර හදන්න බලාපොරොත්තු වන්නෙ. ඒ අනුව බොහෝ කාලයක් යන තෙක් ඒ ප්‍රශ්නය විසඳන්න බැහැ.

ධීවර කර්මාන්තයේ යෙදෙන අයට යන්ත්‍ර බෝට්ටු වුවමනා කරනව. සෑම පැතිවලම අය යන්ත්‍ර බෝට්ටු ඉල්ලගෙන අප ළඟට එනව. යන්ත්‍ර බෝට්ටු මාර්ගයෙන් මාළු විශාල ප්‍රමාණයක් අල්ලා ගන්න පුළුවන්. ඒ සඳහා වෙන් කරන මුදලත් විශාල ප්‍රමාණයකින් අඩු කරල තියෙනව. ඉතා සුළු මුදලයි, මේ වර වෙන් කර තිබෙන්නෙ. ගිය අවුරුද්දේ රුපියල් ලක්ෂ 610 ක මාළු ලංකාවට පිටරටින් ගෙන්නුව. අපේ රටට මාළු ටොන් ලක්ෂ 200 ක් අවුරුද්දකට වුවමනා කරනව. නමුත් අපේ රටේ අවුරුද්දකට ලැබෙන්නෙ මාළු ටොන් ලක්ෂ 80 ක් පමණයි. ඒ නිසා අපට මේ ධීවර කර්මාන්තය තව හුඟක් දුරට දියුණු කරන්න ඉඩ තියෙනව. මේ කර්මාන්තය හොඳින් දියුණු කරනව නම් තව බොහෝ දෙනකුට රක්ෂාව දෙන්න පුළුවන් වන අතරම අපේ මාළු ප්‍රශ්නයත් විසඳා ගන්න පුළුවන් වෙනව.

ධීවර සංයුක්ත මණ්ඩලයක් ඇති කරන්න යන බව අයවැය කථාවෙ කියා තිබෙනව. හොඳ ක්‍රමයකට ඒක ඇති කළොත් එයින් විශාල ප්‍රයෝජනයක් සැලසෙනව. විශ්වාසවන්තව වැඩ කරන, පගා ගන්නෙ නැති හොඳ අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කරල ඒ සංයුක්ත මණ්ඩලයේ වැඩ හොඳ පිළිවෙළට සකස් කළොත් එයින් විශාල ප්‍රයෝජනයක් ලබා ගන්න පුළුවන් වෙනවට කිසිම සැකයක් නැහැ. එසේ නැතිව සුදුස්සන් පත් කරන්නෙ නැතිව තමන්ගේම නෑයන්, සහෝදරවරුන්, යහළුවන්, මැතිවරණවලදි තමන්ට වැඩ කළ අය ඒවාට පත් කළොත් ඒකත් පගා මඩුවක් වෙනවට කිසිම සැකයක් නැහැ. ධීවර කර්මාන්තය සම්බන්ධ කොමිෂන් සභා නොයෙක් අවස්ථාවලදි පත් කරල තියෙනව. ඒ එක කොමිෂන් සභාවක් යෝජනා කර තියෙන විධියකටවත් මේ රටේ වැඩ කරල නැහැ. ඒ නිසා තමයි, මෙපමණ කාලයක් මුළුල්ලෙ මේ ධීවර කර්මාන්තය දියුණු වෙලා නැත්තෙ. ඒ කොමිෂන් සභාකී අන්දමට වැඩ කළා නම් අපට මාළු සම්බන්ධයෙන් කිසි කරදරයක් ඇති වන්නෙ නැහැ. මාළු පිටරටින් ගෙන්වීමට සිදු වන්නෙ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට ආරෝග්‍යශාලා ගැන කල්පනා කර බලමු. අපේ රටේ සෞඛ්‍ය තත්ත්වය දවසින් දවස පිරිහීගෙන යන බව තමුන්නාන්සෙල දන්නව. ආරෝග්‍යශාලාවල බෙහෙත් නැත කියා මට නම් පැමිණිලි විශාල ගණනක් ලැබෙනව. ආරෝග්‍යශාලාවල බෙහෙත් නැතිව හුඟක් දෙනෙක් දුක් විඳිනව. ඒ වගේම ආරෝග්‍යශාලාවල ඉඩ නැහැ. එසේම ආරෝග්‍යශාලාවලට වුවමනා උපකරණ නැහැ. මොනවා නැති වුණත් බෙහෙත් වුවමනා කරන බව තමුන්නාන්සෙල දන්නව. වෙන මොනවා නැති වුවත් බෙහෙත් වුවමනා බව තමුන්නාන්සෙත් පිළිගන්නවා ඇති. නමුත් එම වැය ශීර්ෂයත් අඩු කර තිබෙනවා, රුපියල් 6,85,000 කින් පමණ.

අපි සමාජ සේවා දෙපාර්තමේන්තුව ගැන බලමු. අපේ පළාත්වල කාස රෝගයෙන් පෙළෙන්නවුන් රාශියක් සිටිනවා, ආධාර ලබාගැනීමට. ඔවුන්ට ආධාර මුදල් දිය යුතුය කියා තීරණය කරලත් තිබෙනවා. නමුත් මුදල් නැත කියා ඔවුන්ට මුදල් දෙන්නෙ නැහැ. ඒ අයත් බලාගෙන සිටිනවා කවදා මුදල් ලැබේද කියා. ඒ සඳහා වුවමනා කරන මුදල් ප්‍රමාණය මේ අවුරුද්දේ තවත් අඩු කර තිබෙනවා. ඇත්ත වශයෙන්ම ඒ කටයුතු සඳහා මුදල් වැඩි වැඩියෙන් වෙන් කළ යුතුවා මිස තවත් අඩු කිරීම කිසිසේත්ම වටින්නේ නැහැ. එයින් දුප්පත් ජනතාවට මහත් කරදර රාශියක් ඇති වෙනවා.

අපි අධ්‍යාපනය ගැන බලමු. ඊයෙ පෙරෙයිදා ගරු මන්ත්‍රීවරයකු විසින් අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් ගරු අධ්‍යාපන ඇමතිතුමා කිව්වා, පාසල්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වලට වුවමනා බංකු පුටු ආදිය දීමට සූදානම්ය, වෙනත් අවශ්‍ය උපකරණ දෙන්නට සූදානම්ය, ගොඩනැගිලි දෙන්නට සූදානම්ය, සියල්ලම සම්පූර්ණ කරන්නට සූදානම්ය කියා. අද පාසලකට ගිහින් බැලුවොත් පෙනේවි ළමුන්ගෙන් බාගයකට පමණ වාඩි වීමට බංකු පුටු ආදිය නොමැති බව. වෙන එකක් තබා කළුලෑලි රටහුණු ආදියවත් ගැනීමට මුදල් නැතිලු. අපේ පාසල්වල තත්ත්වය එසේ තිබියදී—ගරු අධ්‍යාපන ඇමතිතුමා අර විදියට ප්‍රකාශ කර තිබියදී—එම වැය ශීර්ෂයද අඩු කර තිබෙනවා. නමුත් සෑම තැනම වාගේ මහා විද්‍යාල නම් විවෘත කරගෙන යනවා. ඒ මහා විද්‍යාලවලට ගිහින් බැලුවොත් බෝඩ්ලෑලි පමණයි, දකින්නට ලැබෙන්නේ. ගුරුවරුවත් ඇත්තෙ නැහැ, වෙනත් උපකරණ ඇත්තෙත් නැහැ. මම හිතන්නේ මහජනයා මුළා කරන්නට වෙන්න ඇති ඒවා මෙසේ විවෘත කරන්නේ.

ජාතික අධ්‍යාපන ක්‍රමයක් ඇති කරන්නටය කියා කොමිෂන් සභා කීපයක් පත් කර තිබෙනවා. කොමිෂන් සභා තුනක්ම පත් කර තිබෙනවා. ඒවායින් වාර්තාත් ඉදිරිපත් කර තිබෙනවා. නමුත් අද වන තුරුත් ඒවා පිළිගෙන තිබෙන වාය කියා නැහැ. ඒවා පිළිබඳව සාකච්ඡා කිරීමට අපට අවස්ථාවක් දී නැහැ. අපට දැනගන්නට තිබෙන හැටියට ඒ වාර්තාවලින් ඉදිරිපත් කර ඇති යෝජනා පවා වෙනස් කර බොහොම දුර්වල තත්ත්වයකට අධ්‍යාපනය ගෙනීමට බලාපොරොත්තු වෙනවාලු. ඒ වාර්තා වැඩි කල් යන්නට පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන මෙන් අපි ඉල්ලා සිටිනවා.

අද අපේ පාරවල් ඉතා අබලන් තත්ත්වයක තිබෙනවා. සෑම පාරක වාගේම විශාල වළවල් තිබෙනවා. වළින් වළට වැටෙන කොට මිනිසුන්ගේ කොන්දත් කැඩෙන්න පුළුවනි. ගර්භණී මවක් කාර් එකකින් එක්ක ගියොත් සමහර විට මේ වළවල වැටෙන විට කාර් එකේදීම ප්‍රසූත කරන්නත් පුළුවනි. පාරවල් සෑදීම සඳහා ලක්ෂ 75 ක් වුවමනා වෙතත්, මේ අයවැය ලේඛනයෙන් වෙන් කර තිබෙන්නේ ලක්ෂ 40 ක් පමණයි. ඒ පාරවල් අළුත් වැඩියා නොකළොත් තව ටික කලක් යන විට පයින්වත් යන්න බැරි තත්ත්වයක් ඇති වෙන්න පුළුවනි.

බස් ධාවනය ගැන බලමු. ඊයේ ගමනාගමන ඇමතිතුමා බොහොම දිග කථාවක් කළා. මම එය හොඳින් අසා සිටියා. හරියට චිත්‍රපටියක් ඇන්දා වාගෙයි. කරන්නට බලාපොරොත්තු වන වැඩ ගැන දීර්ඝ කථාවක් කළා. නමුත් ඒ කිසිවක් කෙරෙන්නෙ නැති බව අපට පෙනී යනවා. අවුරුද්දකට බස් 500 කට වැඩි ගණනක් ගන්න යනවා. එනකොට ඒ සඳහා සල්ලි සොයන්නෙ කොහොමද ? ඒ සඳහා මාර්ගයක් පෙන්වා නැහැ. එයින් පෙනෙන්නෙ බස්වල යන අයට පහසුවක් ලැබෙන්නෙ නැති බවයි. බස්වල ගමන් කිරීම සඳහා විශාල පිරිසක් රස්තියාදු වන බව තමුන්නාන්සේලාට පෙනෙනවා ඇති. සමහරුන් ළමයින් පවා වඩාගෙන අව්වෙ වේලෙමින් වැස්සට තෙමෙමින් බස් නැතිව රස්තියාදු වෙනවා. එය කණගාටුවට කාරණයක්. සමහර අවස්ථාවල කාර්එකේ ගෙනියන්න පුළුවන් තරම් අය අපි කාර්වල දමාගෙන යනවා. මේ බස් හිඟය ගැන මහජනයා මේ ආණ්ඩුවට දොස් කියනවා. නමුත් මේ අළුත් ඇමතිවරයා මේ ගැන සෑහෙන තරමකින්වත් සහනයක් සලසා දේවි කියා අපි බලාපොරොත්තු වෙනවා.

එමෙන්ම පේෂ කර්මාන්තය සම්බන්ධවත් කියන්න ඕනෑ. අද ලංකාවේ පේෂ කර්මාන්තයේ 60,000 කට වැඩි පිරිසක් යෙදී සිටිනවා. අද හුඟ දෙනෙක් නූල් නැතිව ලොකු කරදරයකින් සිටිනවා. ඊටත් වඩා පේෂ කර්මාන්ත මධ්‍යස්ථාන සඳහා වූ මුදලෙන් රුපියල් 50,000 ක් පමණ මේ අය වැය ලේඛනයෙන් අඩු කර තිබෙනවා. වැඩි කරන්න ඕනෑ එක අඩු කරලයි තිබෙන්නෙ. විශාල පිරිසක් පේෂ කර්මාන්තය ඉගෙන ගෙන යමක් හම්බකරගෙන ජීවත් වන්න හදන මේ අවධියේ තව හුඟක් පේෂ කර්මාන්ත මධ්‍යස්ථාන අපට ඕනෑ කරනවා. නමුත් ඒ සඳහා මුදල් අඩු කිරීමෙන් පෙනෙනවා ඒ ප්‍රශ්නය විසඳෙන්නෙ නැති බව. එමෙන්ම පේෂ කර්මාන්තය අතින් හුඟ දෙනෙකුට රක්ෂාව සපයන්න පුළුවන් බව මා දන්නවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ශ්‍රීමත් ඇල්බට් පීරිස්]

නාත්තන්ඩියේ සමුපකාර පේෂ සංගමයෙන් හාර දහස් ගණනකට රක්ෂාව දීගෙන යනව. තවත් ඕනෑ නම් පනස් දහසකට නොවෙයි ලක්ෂයකට වුණත් රක්ෂාව දෙන්න පුළුවන්. නමුත් දැන් ටික දිනකට කලින් එය ආණ්ඩුව බාරගෙන ආණ්ඩුවෙන් නිලධාරීන් පත් කර තිබෙනව. එය කරගෙන ගිය අය තමන්ගේම මුදලින් හුඟක් වැඩ කරමින් දවසින් දවස දියුණු කරගෙන ගිය නිසා විශාල පිරිසකට රක්ෂාව දෙන්න පුළුවන් වුණා. එය අද ආණ්ඩුවට බාරගෙන නිලධාරීන්ට දී තිබෙනව. එය කොයි විධියට කෙරේද කියා මා දන්නෙ නැහැ. එය හොඳින් ගෙන යන්නත් පේෂ කර්මය සම්බන්ධව හොඳ වැඩ පිළිවෙළක් ඇති කරන්නත් කටයුතු කළොත් මා සතුටු වෙනව. එය විශාල පිරිසකට ප්‍රයෝජනවත් වෙනව. විශේෂයෙන් සරොන් පමණක් නොවෙයි, සේද සාරි, කපු සාරි ආදී හුඟක් අද නිපදවන නිසා ඒ ගැන විශේෂ සැලකිල්ලක් දක්වන්නට ඕනෑ බව මේ අවස්ථාවේදී කියන්න ඕනෑ.

එමෙන්ම රා මැදීම ගැනත් මන්ත්‍රීවරුන් හුඟ දෙනෙක් සඳහන් කරන්න යෙදුණා. මාත් ඒ ගැන වචනයක් දෙකක් කියන්න සතුටුයි. ගම්බද උදවියට තෑගගක් හැටියට දී තිබෙන්නෙ එපමණයි. ඒ ගැන ගම්වල සිටින හුඟ දෙනෙක් විරුද්ධ බව කියන්න ඕනෑ. එයට සතුටු කීපදෙනෙකුත් සිටිනව. නමුත් හුඟ දෙනෙක් විරුද්ධයි. ඒ අය අදත් මා සමග කීවා මෙයින් සිදු වන්නේ ගම් විනාශවීමයි කියල. එසේ වන්නෙ මොකද? පොල් ගසක් නැත්නම් 2 ක් 3 ක් මැද ගෙන පියා රා බොනව. ඊට පසුව තැබෑරුමක් වගේ විකුණන්නත් පටන් ගන්නව. එතකොට ඒ ගෙදර ගෑණු එක් කෙනත් බොන්න පටන් ගන්නව. ඊළඟට දරුවනුත් බොන්න පටන් ගන්නව. ඒ විධියට බීම පැතිරී යනව. ඒ නිසා මේ ගැන ගම්බද අය ලොකු බයකින් සිටින බව කියන්න ඕනෑ. කසිප්පු නැති කිරීම පිණිස රා සඳහා ගස් මැද ගැනීමට ඉඩ දෙන බවයි, ගරු මුදල් ඇමතිතුමා ප්‍රකාශ කෙළේ. නමුත් මේ මාර්ගයෙන් කසිප්පු නැති කරන්නට පුළුවන් වේයයි මා නම් හිතන්නේ නැහැ. කොළඹ සිට පුත්තලමට යන තෙක්ම තැබෑරුම් තිබෙතත් විශාල වශයෙන් කසිප්පු තිබෙන්නේ ඒ ප්‍රදේශයේයි. තැබෑරුම් තිබෙන නිසා ඒ ප්‍රදේශයේ අලුතින් ගස් මදින්නට ඉඩ ලැබෙන්නෙත් නැහැ. තැබෑරුම් තිබෙද්දීත් මේ තරම් කසිප්පු තිබෙනවා නම් ගරු මුදල් ඇමතිතුමාගේ අලුත් යෝජනාවෙන් කසිප්පු මැඩ පැවැත්විය හැකියයි හිතන්නට බැහැ. බීමත්කමට ඉඩ දෙන්නට ඕනෑ කරනවා නම් දැනට තිබෙන කසිප්පු සඳහා අවසර දීම වඩා හොඳයි. එතකොට එයින් ආණ්ඩුවට ලොකු ආදායමකුත් ලැබෙනවා.

දැනට තිබෙන ආණ්ඩුවේ ඉස්කාගාර වසා දමා කසිප්පු ව්‍යාපාරය සඳහා බලපත්‍ර නිකුත් කරන්න. එවිට ඒ කසිප්පුකාරයන් විසින් වඩා හොඳ අරක්කු නිපදවා මහජනයාට බෙදා හරිනවා ඇති. කිසිම බියක් නැතිව තරඟයට හොඳ අරක්කු පෙරීමට එවිට ඔවුන්ට අවස්ථාව ලැබෙනවා. හොඳ අරක්කු ලැබෙන විට කසිප්පු නිකම්ම නවතිවි. ඉස්සර "ආරියස්" නමින් හොඳ අරක්කු වර්ගයක් තිබුණා. ඒ කාලයේ මිනිසුන් පාවිච්චි කෙළේ ඒ හොඳ අරක්කුයි. නරක අරක්කු පාවිච්චි කෙළේ නැහැ. ඉතින් ගරු මුදල් ඇමතිතුමාගේ බලාපොරොත්තුව මහජනයා අතර බීමත්කම ඇති කිරීම නම් ඒ විධියට දැනට සිටින කසිප්පුකාරයන්ට අරක්කු පෙරීම සඳහා ලයිසන් දෙන්න. පෞද්ගලිකව මා නම් මේ රා වරමට විරුද්ධයි. බේබද්දන් නිසා අපේ සමහර ගම්වල අහිංසකයන්ට අද ජීවත් වන්නට පවා බැරි තත්ත්වයක් තිබෙනවා. එහෙම නම් තව තවත් මත්පැන් බොන අය වැඩි වුණොත් කොයි තරම් නරක තත්ත්වයක් ඇති වෙයිද? අපේ බාල පරම්පරාවට බේබදුකම පුරුදු කළොත් අවුරුදු ගණනක් යන විට තත්ත්වය කෙසේ වේදැයි කල්පනා කර බලන්න. පෞද්ගලික වශයෙන් මෙයින් තමන්ට ලැබෙන වාසි ලේසි ගැන කල්පනා නොකර මහජනයා නියම මාර්ගයෙහි ගමන් කරවීම සඳහා, මහජනයා හැඩ ගසා ගැනීම සඳහා ක්‍රියා කළොත් බොහොම හොඳයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගෙවල් පිළිබඳව ඇති කරන්නට යන බදු ක්‍රමය ගැන ගරු මන්ත්‍රීවරුන් කීප දෙනකුම කථා කළා. අලුත් අයවැය ලේඛනය අනුව පුද්ගලයකුට තමන්ගේ ගෙය හැර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රුපියල් ලක්ෂයකට වඩා වටිනා ගේ දොරින් සියයට 10 ක බද්දක් අය කරන්නට යන බව පේනවා. ඇත්තෙන්ම අයුතු අන්දමින් ගෙවල් කුලී අය කරන ගෙවල් හිමියන් සිටින බව අප දන්නවා. විශාල වශයෙන් "කී මනි" ආදිය අය කරන සමහර ගෙවල් හිමියන් ලේ බොන මකුණන් වගෙයි. ඉතින් එක මකුණකු කෑවාම මකුණන් සියල්ලටම උණු වතුර වත්කරන්නා වගේ වැඩක් කිරීම සුදුසුද කියා කල්පනා කර බලන ලෙස මා ගරු මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලනවා. නමුත් මුදල් අය කිරීම නතර කරන්න කියා මා කියන්නේ නැහැ. එසේ වුවත් යෝජනා කර ඇති ක්‍රමය දැනට වඩා ලිහිල් කිරීම ගැන කරුණාවෙන් සලකා බැලිය යුතුයි. මේ යෝජනාව ගැන නොයෙකුත් දෙනා ලියවිලි මගින් මට කරුණු දන්වා තිබෙනවා. සමහර අය දීර්ඝ කාලයක් තිස්සේ, සමහර විට නිසි පරිදි කන්නෙ බොන්නෙවත් නැතිව, බොහොම දුක් විඳ සෑහෙන ධනයක් හම්බ කරගෙන ඉන්නවා. තමන්ගේ දරුවන් වෙනුවෙනුයි, ඔවුන් ඒ ධනය හම්බ කර තිබෙන්නේ. දරුවන්ගේ සුභසිද්ධිය නිසා ගෙවල් කීපයක් සාදා තිබෙනවා. එම නිසා දරුවන්ගේ ගණන අනුව ගෙවල් අතහැර ගණන් බැලීම හොඳ සාධාරණ පිළිවෙළක් බව ගරු මුදල් ඇමතිතුමාට මතක් කරන්නට කැමතියි.

එක මහතකු මා වෙත එවා තිබෙන ලියවිල්ලක කොටසක් මෙසේයි :

"To enable you to visualize the situation let me state that I am a small businessman who did not inherit wealth of any kind from my parents. I am now 54 years of age. During 32 years of my career through sheer hard work and without any assistance from relations or friends I had to go through many difficulties and trials. Nevertheless if I prospered unaided it was due to my perseverance and integrity alone. Hence I was able to build several houses on which I invested my entire life's savings hoping some day my children will reap the benefit of my incessant labour. This hope I fear is now going to be dashed to pieces."

ඔය ආකාරයට නොයෙකුත් දුක් ගැනවිලි ඉදිරිපත් කර තිබෙනවා. බලය තිබුණු පලියට එම බලය පාවිච්චි කරන්න හොඳ නැහැ. බොහොම කල්පනාවෙන් එම බලය පාවිච්චි කරන්න ඕනෑ. එක පාරටම තමන් අතේ තියෙන පෑනෙන් ඉරි ඇඳ දාල කටයුතු කරන එක තර්කානුකූල වන්නේවත්, ප්‍රජාතන්ත්‍රවාදී වන්නෙවත් නැහැ. එම නිසා මෙම කරුණු ගැන ඉතා ඕනෑකමින් කල්පනා කරන ලෙස මා ගරු මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ ගෙවල් තියෙන අයටත් ළමයි ඉන්නවා. ඒ ළමයි ලොකු මිනිසුන් වෙනවා. ඊළඟට ඔවුන් කසාද බඳිනවා. එයින් පසුව ඔවුන්ටත් දූ දරුවන් ලැබෙනවා. එම දරුවන්ගෙ පදිංචියටත් නිවාස වුවමනා කරනවා. ගෙවල කුලියට සිටින අය වුණත් මෙම කාරණය පිළිගන්නව ඇති. මේ අදහසට ඒ අය වුණත් විරුද්ධ වන එකක් නැහැ. එම නිසා මේ ගැන සැලකිලිමත්ව ක්‍රියා කරන ලෙස මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. මගෙ නම් කුලියට දුන් එක ගෙයක්වත් නැහැ. මේ අදහස් මගෙ පෞද්ගලික අදහස් නොවෙයි. මේව මහ ජනයගේ අදහස් බව මට කිසි බියක් නැතිව කියන්න පුළුවනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තේ වතු, රබර් වතු යනාදියත් නැහැ. නුවරඑළිය වැනි පළාත්වල තියෙන තේ වතුවලින් රුපියල් 300ක විතර බද්දක් ගන්න යනව. මධ්‍යම පළාතෙ එහෙම තේ වතුවලිනුත් රුපියල් 60 කද කොහේද බද්දක් අය කරන්න යනව. මෙසේ වූ විට හුඟක් තේ වතු වසා දමන්න සිදු වේවි. එසේ වුණොත්, රටට විශාල පාඩුවක් සිදු වෙනව. ලංකාවේ සංවර්ධනයට වියදම් කරන්න තියෙන ධනයෙන් වැඩි කොටසක් උපයා ගන්න වෙන්නෙ තේ රබර් යනාදියෙන් තමයි. ඒ බව ගරු මුදල් ඇමතිතුමත් සිය කතාවෙ සඳහන් කර තියෙනවා. මහජනයා සඳහා වියදම් කරන මුදල්වලින් සියයට 82 ක් විතර උපයා ගන්න වෙන්නෙ තේ සහ රබර් යනාදියෙනුයි. ඉතින්, මේ තේ වතු යනාදිය වසා දැම්මොත් අපේ රටේ සංවර්ධනය සඳහා අපට මුදල් නැති වෙනව. ඒ ගැනත් ගරු මුදල් ඇමතිතුමා කල්පනා කර බලා සහනයක් දෙනව නම් හොඳයි. යම් යම් අමාරුකම් තියෙන අය ගැන කල්පනාකර බලන බව ගරු මුදල් ඇමතිතුමා කියා තිබුණා. ඒ බව පත්‍රවලින් අපි දුටුව. ඒ නිසා මා විශ්වාස කරනව මේ කරුණු ගැන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එතුමා කල්පනා කර බලා විශේෂයක් කර දේවිය කියා. ගරු නියෝජ්‍ය කථානායක තුමනි, මේ ආකාරයට කල්පනා කර බලන විට මෙම අයවැය ලේඛනයෙ අපට සන් තොෂ වෙන්න තරම් කරුණු ඇතුළත් වී නැති බව කියන්න ඕනැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ක්‍රම ක්‍රමයෙන් ලංකා සමසමාජ පක්ෂය විසින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගිල ගන්න යන බව අපට පේනවා. ටිකින් ටික, අඩියෙන් අඩිය ඉදිරියට ඇවිත්, බොහොම හිමින් මෙය සිදු කරාවි. තමුන්නාන්සෙලා ප්‍රවේ සම් වෙන්න ඕන. දැන් ඒ අය ගමන් කරන මාර්ගය තමුන්නාන්සේලාටම පේනවා ඇති. අඩියෙන් අඩිය ළං වෙලා, දැන් ටිකක් ලෙව කාල තියෙනවා. ඊළඟට ගනී, කටට. ඊට පස්සෙ, බෙල්ල හරියට ආවාම හදිසියෙන්ම ගිල ගන්නවට කිසිම අනු මානයක් නැහැ. මම තමුන්නාන්සේලට නැවතත් කියන්නෙ පුළුවන් තරම් ප්‍රවේශ මින් ඉන්න කියලයි. ටික කලක් ගත වන විට තමුන්නාන්සේලව ගිලගන්න ඉඩ තියෙනවා. බඩ ඇතුළට එහෙම ගියොත්—[බාධා කිරීමක්]—තමුන්නාන්සෙ වැනි ටිකක් හම හයිය තියෙන කෙනෙකුට නම් බඩ ඇතුළට ගියත් දිරවන්න ටිකක් වෙලා යන්න පුළුවනි. ඒ කෙසේ වෙතත් පරිස් සමින් වැඩ කරනවා හොඳයි.

ඇල්බට් මයා.
(තිරු. අල්පෙට්)
(Mr. Albert)

ගිල ගත්තොත් තමුන්නාන්සෙලා සන් තෝෂ වෙනව ඇති නේද?

ශ්‍රීමත් ඇල්බට් පීරිස්
(சேர் அல்பேட் பீரிஸ்)
(Sir Albert Peries)

අපොයි නැහැ, ගිලගත්තොත් අපි බො හොම කනගාටු වෙනවා. එහෙම කියන්නෙ තමුන්නාන්සෙලා ගැන මාත් හොඳට දන්න නිසයි. ඔය පැත්තෙ ඉන්නව ප්‍රජා තන්ත්‍රවාදයට ගරු කරන, ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයකට හිතවත්කම් දක්වන ගරු මන්ත්‍රීවරු. ඒ නිසා තමයි ප්‍රවේසම් වෙන් නය කියන්නෙ. ප්‍රමාද වෙන්න ඉස්සර වෙලා අවවාදයක් හැටියට නොවෙයි කල් පනාවට ගන්න හැටියටයි ඉතාම කරුණා වෙන් මේ කාරණය ඉදිරිපත් කරන්නෙ. තමුන්නාන්සෙලා කෙරෙහි මා තුළ බොහොම ලොකු කරුණාවක් සහ ආදර යක් තිබෙනවා. ඒ නිසයි ඔය විධියට මා ඉල්ලා සිටින්නෙ.

ඇල්බට් මයා.
(திரு. அல்பேட்)
(Mr. Albert)

අප ගැන ආදරයක් තියෙන නිසා වෙන්න ඇති අපේ එකතුවීම ගැන විරුද්ධ වුණේ ඒ දවස්වල.

ශ්‍රීමත් ඇල්බට් පීරිස්
(சேர் அல்பேட் பீரிஸ்)
(Sir Albert Peries)

ඔව්, අපි හැම අවස්ථාවකදීම කිව්වා ඒ ගැන. අපි කවදාවත් හිතුවෙ නැහැ, තමුන් නාන්සේලා ඔය විධියට එකතු වේය කියල. මින් ඉදිරියට වෙන්න පුළුවන් දෙයක් ගැනයි කිව්වේ. තවම පරක්කු නැහැ. තවම ගිලගත්තෙ නැහැ. ඒ නිසයි මම කියන් නෙ තවම ප්‍රමාද වුණා වැඩි නැහැ කියල. තවත් ප්‍රමාද වී කල්පනා කරන්න වුණොත් වල්ගයෙන් අල්ලන්නයි වෙන් නෙ. එතකොට වල්ගයත් ලිස්සලා යන්න ඉඩ තියෙනවා. එතෙක් ප්‍රමාද වීම නුවණට හුරු නැහැ. වැඩි දුර යන්න ඉස්සර වෙලා ගත යුතු පියවර ඉක්මණින් ගන්න අපේ රට වාමාංශික රටක් කරන්නෙ නැතිව ඉදිරිපත් වෙලා කොහොම හරි තිරිංග දමල නවත්තගෙන ප්‍රජාතන්ත්‍රවාදය පැත්තට හරවගෙන වැඩ කරගෙන යන්න බලා පොරොත්තු වෙනව නම් හොඳයි. ඒ ගැන උත්සාහ කරන්න. ඒ සම්බන්ධයෙන් තමුන්නාන්සේලා යම් උත්සාහයක් ගන් නව නම් ඒ උත්සාහය සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 5.23

බී. එච්. බණ්ඩාර මයා. (බදුල්ල)
(திரு. பி. எச். பண்டார—பதுளை)
(Mr. B. H. Bandara—Badulla)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ප්‍රථමයෙන් කථා කළ නාත්තන්ඩියේ ගරු මන්ත්‍රීතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට විශේෂ ආදරයක් ඇතිව, අප කෙරේ විශේෂ කාරුණික භාවයක් දක්වමින් කථා කිරීම ගැන එතුමට මම ස්තුතිවන්ත වෙනවා. මේ විධියේ කාරුණාවක් ආදරයක් ගරු මන්ත්‍රීතුමා තුළ පහළ වීමට කුමක් හේතු වුණාද කියන්න මා දන්නෙ නැහැ. ඒ කොයි හැටි වෙතත් එකක් නම් අපි හොඳින් දන්නවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, ලංකා සමසමාජ පක්ෂයත් එකතු වී සහාග ආණ්ඩුවක් මේ රටේ පිහිටුවා ගනු ලැබීම වළක්වන්නට එක්සත් ජාතික පක්ෂය පුළුවන් තරම් වෙහෙස ගෙන ක්‍රියා කළ බව අප කාටත් පැහැදිලියි. අපට එය තවමත් අමතක වෙලා නැහැ. ඒ හැම දෙයක්ම කළේ අපට ආදරයෙන්ම බවත් අපි දන්නවා. අප වෙත පළ කළ කරුණාව සහ ආදරය ගැන එතුමන්ලට අපි ස්තුති කරනවා.

සහාග ආණ්ඩුවක් පිහිටුවා ගැනීමෙන් අප අදහස් කළේ කුමක්දැයි ලුහුඬින් සඳහන් කරන්න කැමතියි. දිවංගත බණ්ඩාරනායක අගමැතිතුමා 1956 අවුරුද්දෙදි ආරම්භ කළ ඒ සමාජවාදී ගමන තවත් වේගවත් අන්දමින් ඉදිරියට යාමට මිස වෙනත් අදහසකින් නොවෙයි සහාග ආණ්ඩුව පිහිටෙව්වෙ. ඒ නිසා නාත්තන්ඩියෙ ගරු මන්ත්‍රීතුමා කථා කළේ අප වෙත ආදරයකින් නොවෙයි. අපේ එකතුව නිසා එක්සත් ජාතික පක්ෂයට සෑහෙන තරමේ වේදනාවක් සහ බලාපොරොත්තු කඩවීමක් ඇති වුණා. ඒ නිසාම අප වෙත හදිසියේ ආදරයක් එතුමා තුළ ඇති වී තිබෙන බව අපට පැහැදිලියි.

නාත්තන්ඩියෙ ගරු මන්ත්‍රීතුමා එතුමගෙ කථාවෙහි සඳහන් කළ කරුණු කීපයක් තිබෙනවා. ඒ ගැන මුලින්ම වචනයක් දෙකක් කියන්න ඕනෑ. බස් රථ ධාවනය ගැන කථා කළ එතුමා බස් අඩුකම ගැනත් මඟීන්ට විඳින්ට සිදු වන යම් යම් අපහසුකම් ගැනත් සඳහන් කළා. අවශ්‍ය තරම් බස්රථ සංඛ්‍යාවක් නැති බව අපි පිළිගන්නවා. බස් සේවය තවත් දියුණු කළ යුතු බවත් අපි පිළිගන්නවා. ඒ වුණත් බස් සේවය ජනසතු කරන්න ඉස්සර වෙලා එතුමගෙ පක්ෂයේ අය බස් කොම්පැණිකාරයින් හැටියට ගෙන ගිය බස් සේවයට වඩා උසස්—සියේට සියයක් හොඳ—සේවයක් දැනට ලංගමයෙන් මඟීන්ට ලැබෙන බව ඒ ගරු මන්ත්‍රීතුමාම පිළිගන්නවා ඇති.

ශ්‍රීමත් ඇල්බට් පීරිස්
(சேர் அல்பேட் பீரிஸ்)
(Sir Albert Peries)

නැහැ, නැහැ, පිළිගන්නෙ නැහැ. දැන් බොහොම දුර්වලයි.

බණ්ඩාර මයා.
(திரு. பண்டார)
(Mr. Bandara)

මා නියෝජනය කරන බදුල්ල ප්‍රදේශයේ ඌව බස්රථ සමාගම කරගෙන ගියෙ තමුන්නාන්සෙගෙ පක්ෂයෙ උදවියයි. ඒ දවස්වල වර්ෂාව පවතින විට මඟීන්ට යන්න වෙලා තිබුණෙ බස් ඇතුළෙත් කුඩ ඉසලාගෙනයි. මග දිගට බස් තල්ලු කරන්නත් මඟීන්ට නිතර නිතර ඒ දවස්වල සිද්ධ වුණා.

ශ්‍රීමත් ඇල්බට් පීරිස්
(சேர் அல்பேட் பீரிஸ்)
(Sir Albert Peries)

දැන් තත්ත්වය ඊටත් වඩා නරකයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ජයසිංහ මයා.
(திரு. ஜயசிங்ஹ)
(Mr. Jayasinghe)

දැන් ගරු ඇමතිතුමත් බස් තල්ලු කරනව.

බණ්ඩාර මයා.
(திரு. பண்டார)
(Mr. Bandara)

තම තමන්ගෙ හිතට එකඟව කථා කරන ඕනෑම කෙනෙක් කිසිම සැකයක් නැතිව පිළිගන්නවා ඇති, අද හැම අතින්ම එදාට වඩා කීප ගුණයකින් හොඳ බස් සේවයක් මේ රටේ තිබෙන බව.

ශ්‍රීමත් ඇල්බට් පීරිස්
(சேர் அல்பேட் பீரிஸ்)
(Sir Albert Peries)

තමුන්නාන්සෙ අද හැන්දෑවෙ එනව නම් මට පෙන්වන්න පුළුවන්, කොයි විධියෙ තත්ත්වයක්ද තියෙන්නෙ කියල.

බණ්ඩාර මයා.
(திரு. பண்டார)
(Mr. Bandara)

මම බස් රථ කීපයකම ගමන් කරනව. සමහර විට ගරු මන්ත්‍රීවරයා බස් එකක වත් ගමන් නොකරනව ඇති. මට කියන්න පුළුවන්, එදාට වඩා හොඳ තත්ත්වයකින් බස් ධාවනය කරන බව. ඒ අතරම මමත් පිළිගන්නව සුළු සුළු අඩුපාඩුකම් තිබෙන බව.

විශේෂයෙන්ම ගෙවල් හිමියන්, වතු හිමියන් ආරක්ෂා කිරීමේ පුරෝහිතයකු හැටියටයි එතුමා කථා කළේ. එතුමා සඳහන් කළා එතුමාට කුලියට දෙන්න ගෙවල් නැත කියා. ඒක වෙන්න පුළුවනි, නමුත් අප දන්නවා ගෙවල් හිමියන්ගෙන් වැඩි දෙනකු තමුන්නාන්සෙලාගේ පක්ෂයේ අය බව. ඒ වගේම තේවතු හිමියන් ගෙන් වැඩි දෙනකු තමුන්නාන්සෙලාගේ පක්ෂයේ අයයි. එම නිසා තමුන්නාන් සෙලාගේ යුතුකමක් තිබෙනව ගෙවල් හිමියන්, තේවතු හිමියන් ආරක්ෂා කිරීමට. එම නිසා ඒ ගැන ඊට වඩා කථා කරන්න මම යන්නෙ නැහැ. ඒ අයගේ උත්සාහය ගැනත් අප විරුද්ධත්වයක් දක්වන්නෙ නැහැ.

මෙම අයවැය ලේඛනය ගැන සඳහන් කරන විට පළමුවෙන්ම කියන්නට කැමතියි, මෙම අයවැය ලේඛනය සකස් කළ ගරු මුදල් ඇමතිතුමා මේ රටේ පමණක් නොවෙයි, මුළු ලෝකයේම ප්‍රසිද්ධියක් උසුලන බව. මුදල් ඇමති තනතුර දැරීම සඳහා එතුමා වඩාත්ම සුදුසු පුද්ගලයා හැටියට කාගේත් පිළිගැනීමක් තිබෙනව. එවැනි මුදල් ඇමතිවරයකුයි අද අපට ඉන්නෙ. එම නිසා මේ රටේ මහජන තාව ලොකු බලාපොරොත්තුවක් ඇතුව සිටියා වාගේම ඒ බලාපොරොත්තු මෙම අයවැය ලේඛනය ඉදිරිපත් කිරීමෙන් බොහෝ දුරට ඉටු වී තිබෙන බව කියන්න කැමතියි. අවුරුදු විසිහතක පමණ කාලයක් මෙම නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ඉදිරියේ ගෙනෙන ලද අයවැය ලේඛන පිළිබඳ විවේචන ඉදිරිපත් කරමින්, ඒවායේ ඇති අඩුපාඩුකම් දක්වමින් ලැබූ අත්දැකීම් අනුව, ඒ අඩුපාඩුකම් බොහෝ දුරට අඩු කරමින්, හොඳ අයවැය ලේඛනයක් එතුමාට ඉදිරිපත් කරන්නට හැකි වීම ගැන අප සන්තෝෂ වෙනව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාට කටයුතු කරන්නට ඉතාමත් කෙටි කාලයයි තිබෙන්නෙ. නමුත් ඒ කෙටි කාලය තුළ මේ රටේ ධනෝපායන මාර්ග මේ රටේ සංවර්ධනයට යෙදවීම සඳහා හැකි වන විධියේ අයවැය ලේඛනයක් ඉදිරිපත් කිරීම ගැන මම නැවතත් අපේ ගරු මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනව.

මෙම අයවැය ලේඛනය සකස් කිරීමේදී කරුණු කීපයක් ගැන විශේෂ අවධානය යොමු කිරීමෙන් පෙනී යනව, ගැඹුරු කල්පනාවක් ඇතුව මේ අයවැය ලේඛනය සකස් කර තිබෙන බව. මේ රටේ පාසැල් යන වයසේ සිටින ශිෂ්‍ය ශිෂ්‍යාවන් ගැන, ඒ වාගේම විශ්ව විද්‍යාලවල ඉගෙනීම ලබන තරුණ තරුණියන් ගැන, ගුරුවරුන් ගැන, වැඩ කරන ජනතාව ගැන, මේ ආදී හැම කොට්ඨාශයක් ගැනම ලොකු හැඟීමක් ඇතුව මෙම අයවැය ලේඛනය සකස් කර ඇති බව පෙනී යනව. මේ කාරණා පිළිබඳව පැහැදිලි වශයෙන් කථා කරන්න පසුවට බලාපොරොත්තු වෙනව, කෙසේ වෙතත් වැදගත් අරමුණු කීපයක් පෙරදැරි කර ගෙන මෙම අයවැය ලේඛනය සකස් කිරීම ගැන, ඉදිරිපත් කිරීම ගැන, නැවත වරක් මම ගරු මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනව.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ සමගම මගේ කනගාටුවට කාරණයක් නම් මෙයයි. මෙම අයවැය ලේඛනය පිළිබඳව මෙම ගරු සභාවෙහි කරන ලද කථාවලින් පෙනී ගියා, වැඩි හරියක්ම සිංහලට වඩා ඉංග්‍රීසියට තැනක් දී ඇති බව. ඇත්ත වශයෙන්ම වැඩි හරියක් කථා ඉංග්‍රීසි භාෂාවෙන් කිරීමෙන්, සිංහල භාෂාව මේ රටේ රාජ්‍ය භාෂාව වශයෙන් පිළිගත් ඒ ප්‍රතිපත්තිය අපම අමතක කරනවාද කියන හැඟීමක් මා තුළ ඇති වී තිබෙනව. මේ ගරු සභාවේදීම අප පනතක් සම්මත කර ගත්තා පමණක් නොවෙයි, ඒ ඒ දෙපාර්තමේන්තුවලට සිංහලෙන් වැඩ කටයුතු කරන ලෙස බල කරනව. ඒ සඳහා පනත් ඉදිරිපත් කර සම්මත කර ගත්ත මේ ගරු සභාවම ආදර්ශයක් ලැබෙන හැටියට කටයුතු කරන්නෙ නැති නම්, සිංහලෙන් මේ රටේ වැඩ කටයුතු කරන්න වය කියා අනිකුත් අයට බණ කීමෙන් වැඩක් වෙන්නෙ නැති බව, ඒ අය පිළිගන්නෙ නැති බව, කියන්න සිදු වී තිබෙනව. එම නිසා අප ආදර්ශයක් වන පරිද්දෙන්, මේ සභාවේ සිංහලෙන් වැඩ කටයුතු කිරීමට මුල් තැන දිය යුතු බව මම විශෙෂයෙන් සඳහන් කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර විට මෙයට කලින් සිටි මුදල් ඇමතිවරුන්ට නොපෙනුණු ආදායම් ලබාගැනීමේ යම් යම් ක්‍රම ගැන, ඒ වාගේම අපේ විදේශ විනිමය ඉතිරි කර ගැනීමේ ක්‍රම පිළිබඳව සොයා බැලීමකින් යුතුව මෙම අයවැය ලේඛනය සකස් කර ඇති බව අපට පෙනී යනව.

මැණික් කර්මාන්තය ගැන මීට කලින් වතාවල කරුණු ඉදිරිපත් වුණේ නැහැ. මැණික් සංයුක්ත මණ්ඩලයක් පිහිටුවා මේ රටේ මැණික් කර්මාන්තයට ආධාර දෙනවාත් සමගම එයින් රටට ආදායමක් ලබා ගැනීමටත්, ඒ අනුව විදේශ විනිමය පිළිබඳ වැදගත් තත්ත්වයක් ඇති කර ගැනීමටත්, හැකි වන අන්දමේ වැඩ පිළිවෙළක් අයවැය ලේඛනයෙන් ඉදිරිපත් කර තිබෙනව. මේ රටේ මැණික් කර්මාන්තය ගැන අපි හරි හැටි දන්නෙ නැහැ. කොතරම් මැණික් ප්‍රමාණයක් ලැබෙනවාද කියාවත්, මැණික්වලට කොතරම් මුදලක් ලැබෙනවද කියාවත්, කොතරම් මැණික් ප්‍රමාණයක් පිට රට යවනවාද කියාවත් අපි දන්නෙ නැහැ. බ්‍රෝකර්වරුන්, වෙළෙන්දෝ සිකරුවන්, තැරැව්කාරයන් මැණික් ගල් ව්‍යාපාරය ඔවුන්ට ඕනෑ අන්දමට පිළියෙළ කරගෙන තිබෙනව; මේ රටට ලැබෙන්නට තිබෙන ආදායමක් නොලැබෙන විධියට, ඔවුන්ගේ පෞද්ගලික ප්‍රයෝජනයට, ඒ ව්‍යාපාරය හරවා ගෙන තිබෙනව. ඒ නිසා බොහෝ දෙනකුට පෙනුණෙ නැති දෙයක් ගරු මුදල් ඇමතිතුමාට පෙනී තිබීම ගැන අපි සතුටු වෙනව. අපේ රටේ තිබෙන ඛනිජ ද්‍රව්‍ය පිළිබඳව සහ අපේ රටේ නිෂ්පාදනය කිරීමට පුළුවන් ද්‍රව්‍ය ගැනත් පැහැදිලි අවබෝධයක් ඇතිවයි අපි මේ සංවර්ධන කටයුතු කළ යුත්තෙ. මැණික් සංයුක්ත මණ්ඩලයක් පිහිටුවීමෙන් පසුව මැණික් ඉල්ලම් ඇති ඉඩම් බදු දී මැණික් ව්‍යාපාරය ක්‍රමානුකූලව කරගෙන යාමට පුළුවන් වෙනව ඇති. ඒ අනුව මැණික් ව්‍යාපාරයෙන් විශාල ආදායමක් මේ රටට ලැබෙනවා පමණක් නොව, බ්‍රෝකර්වරුන්ගෙන් සහ තැරැව්කාරයන්ගෙන් බේරී තමන්ගේ මහන්සියෙ ප්‍රමාණයට ආදායමක් ලබා ගැනීමට මැණික් ගැරීමේ යෙදෙන සාමාන්‍ය මහජනතාවට පුළුවන් වෙනවා ඇති. ඒ වාගේම ඒ අනුව රටේ විශාල ආර්ථික දියුණුවක් ඇති වනවාටද කිසිම අඩමානයක් නැහැ. ඒ නිසා මේ පිළිබඳව කල්පනා කර මෙවැනි වැඩ පිළිවෙළක් ඉදිරිපත් කිරීම ගැන මම මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනව.

ඒ වාගේම නැව්වලට ඉන්ධන ද්‍රව්‍ය සැපයීම පිළිබඳවත් මුදල් ඇමතිතුමා කල්පනා කර තිබෙනව. නැගෙනහිරට සහ බටහිරට යන නැව් ඔවුන්ගේ පහසුව තකා මෙහි පැමිණි විට ඒවාට අවශ්‍ය තෙල් සහ ජලය සැපයීම ආදියෙන් ආදායමක් රටට ලැබෙන ක්‍රමයක් මීට කලින් තිබුණේ නැහැ. එවැනි ක්‍රමයක් සඳහා මේ අයවැය ලේඛනයෙන් කරුණු ඉදිරිපත් කර තිබෙනව. එයින් රටට ආදායමක් ලැබීමෙන් රටේ ආර්ථික තත්ත්වයේ දියුණුවක් ඇති වන නිසා ඒ පිළිබඳවත් මා ගරු මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනව.

මේ රටට පමණක් නොව ලෝකයේ සෑම රටකටම මූලික වූ ප්‍රශ්න කීපයක් තිබෙනව. එනම් ආහාර, සෞඛ්‍යය, අධ්‍යාපනය සහ නිවාස යන සතරයි. අත්‍යවශ්‍යයෙන්ම විසඳිය යුතු මූලික ප්‍රශ්න ඒවායි. ඒ ප්‍රශ්න පිළිබඳව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බණ්ඩාර මයා.]

පැහැදිලි අවබෝධයක් ඇතිව, ඒවාට තුඩු දෙන අන්දමට මෙම අයවැය ලේඛනය පිළියෙළ කර තිබෙන බව අපට පේනවා.

අපි මෙම ගරු සභාවේදී නොයෙක් විධියේ පනත් සම්මත කර ගන්නවා. රටේ ආර්ථික දියුණුව සඳහා අදාළ වන නොයෙක් විධියේ පනත් සම්මත කර ගත්තත් ඒවා කඩා බිඳ දමන්නට ඒවායේ ප්‍රයෝජනය මහජනයාට ලබා නොදෙන්නට යම් යම් උපක්‍රම තිබෙන බව අපි දන්නවා. ඒ අනුව බලන විට මම හිතනවා රාජ්‍ය වෙළඳ සංයුක්ත මණ්ඩලයක් පිහිටුවීම සඳහා කර තිබෙන යෝජනාව ඉතාමත් වැදගත් එකක්ය කියා. අපි හොඳින්ම දන්නවා, මේ රටේ වෙළෙන්දා මේ රටේ පාරිභෝගිකයාට වැඩි මිළට බඩු විකුණන බව. බඩු සඟවනවා. මේවා නිසා රජයට නිතරම දොස් පැවරෙනවා. රාජ්‍ය වෙළඳ සංස්ථාව පිහිටුවීමෙන් මේ විධියේ දූෂණ ක්‍රම නැති වී පාරිභෝගිකයාට ඇති නොයෙක් කරදර මගහරවා ගන්න කටයුතු සැලසෙනවාට කිසිම අඩමානයක් නැහැ.

ඒ වාගේම මේ රටේ නිෂ්පාදනය කරන ද්‍රව්‍යවල මිළ පාලනය කිරීම ගැනත් අයවැය කථාවේ සඳහන් වෙනවා. එයත් ඉතාමත් වැදගත් කාරණයක්. මේ රජය පිහිටුවීමෙන් පසුව රටේ කර්මාන්ත යුගයක් ආරම්භ වූ බව කවුරුත් දන්නවා. මේ ආණ්ඩුව පිහිටුවීමෙන් පසුව කවදාවත් නොතිබුණු අන්දමේ කර්මාන්ත යුගයක් ඇතිවී තිබෙනවාය යන්න කවුරුත් අවිවාදයෙන් පිළිගන්නවාට කිසිම අඩමානයක් නැහැ. මේ රටේ නිෂ්පාදනය කරන ද්‍රව්‍ය පාරිභෝගිකයා අතර අලෙවි කිරීම සඳහා අප පිටරටින් ගෙන්වන ද්‍රව්‍ය සීමා කළා. ඒ නිසා සමහර අවස්ථාවලදී ඇතැම් ද්‍රව්‍ය දුර්ලභවීමේ තත්ත්වයක් ඇති වුණා. ඒ වාගේම මේ රටේ නිෂ්පාදනය කළ ද්‍රව්‍ය නියම පාලන මිළකට අලෙවි නොකිරීම නිසාත් මහජනයාට නොයෙකුත් කරදර වලට මුහුණ පාන්නට සිදුවුණා. ගිනිපෙට්ටි, ටෝච් බැටරි ආදිය ලංකාවේ නිෂ්පාදනය කරනවා. නමුත් ශත 43 ක් වන ටෝච් බැටරි කැල්ල සමහර අවස්ථාවලදී රු 1 40ට පමණ කළු කඩෙන් මිළ දී ගන්න සිද්ධ වෙනවා. සමහර අවස්ථාවලදී ගිනි පෙට්ටිත් නැහැ. ඒ විධියට නියම පාලන මිළකට බඩු නොවිකිණීමත් බඩු සඟවා ගැනීමත් නිසා මහජනයාට නොයෙකුත් කරදර ඇති වුණා. ඒ නිසා මේ රටේ නිෂ්පාදනය කරන ද්‍රව්‍ය වල මිළ පාලනය කිරීම ඉතාමත්ම වැදගත් කාරණයක්.

අයවැය ලේඛනයේ තවත් වැදගත් කාරණයක් සඳහන් වෙනවා. අතිරේක භෝගවලට සහතික මිළක් නියම කිරීමයි ඒ. මේ රටේ ගොවියා මහන්සි වන ප්‍රමාණයට ඔහු නිෂ්පාදනය කරන ද්‍රව්‍යවලට නියම මිළක් නොලැබෙන බව අපි දන්නවා. ඒ නිසා සහතික මිළක් දීමෙන් ගොවිතැන කෙරෙහි ගොවියා තුළ විශ්වාසයක් හා උනන්දුවක් ඇති වෙනවා. ඒ වාගේම තවත් අවශ්‍ය ද්‍රව්‍ය තිබෙනවා. ඒවාටත් සහතික මිළක් දීමෙන් ඇත්ත වශයෙන්ම ගොවිතැන කෙරෙහි මහජනතාව තුළ විශේෂ උනන්දුවක් ඇති වන බවට අපට කිසිම අඩමානයක් නැහැ. ගොවියා මහන්සි වන ප්‍රමාණයට ආදායමක් ස්ථිර වශයෙන්ම ලැබෙන නිසා ඔහු වඩ වඩා ධෛර්යමත් වෙනවා. ඒ වාගේම ඔහුට ආර්ථික දියුණුවකුත් ඇති කරගන්ට පුලුවන් වෙනවා. අල, ලූණු, මිරිස් ආදී වගාවන්ට මේ විධියට සහතික මිළක් දීමෙන් තවත් නොයෙකුත් ද්‍රව්‍ය නිෂ්පාදනය කරන්ට ගොවියාට උනන්දුවක්, ධෛර්යයක් ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටට වුවමනා තරම් එළවලු අපේ ප්‍රදේශවල වගා කරන නමුත් ඒවාට සහතික මිළක් නැහැ. අපේ ප්‍රදේශවල එළවළු වවන්නන් හැමදාම හිඟන්නන් හැටියට ජීවත් වෙනවා. සමහර අවස්ථාවලදි ගෝවා රාත්තල ශත 2ටත් යනවා. එළවලු වවන ගොවියා මහන්සි වන ප්‍රමාණයට ආදායමක් ලැබෙන්නෙ නැහැ. ඔහුට ජීවත් වෙන්නත් ක්‍රමයක් නැහැ. ඒ නිසා දින පතා ඔහු වැවීමට අධෛර්ය වෙනවා. නමුත් එළවලුවලටත් සහතික මිළක් දුන්නොත් මේ රටට වුවමනා එළවලු ප්‍රමාණය පමණක් නොවෙයි, පිටරටවලට යවන්නත් එළවලු වගා කරන්න පුළුවන් වෙනවාට කිසිම අඩමානයක් නැහැ. වෙනත් අවශ්‍ය ද්‍රව්‍ය වලට සහතික මිළක් ඇති කරන්ට බලාපොරොත්තු වන්නා වගේම එළවලුවලටත් සහතික මිළක් ඇති කර ගොවියා උනන්දු කරවන්න යම්කිසි වැඩ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පිළිවෙළක් සකස් කිරීමේ ප්‍රශ්නයට ගරු මුදල් ඇමතිතුමාගේ අවධානය මා යොමු කරවනව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට විශ්ව විද්‍යාලවලට ඇතුළුවන දුප්පත් ශිෂ්‍ය-ශිෂ්‍යාවන් සම්බන්ධයෙන් ඉතා වැදගත් යෝජනාවක් අයවැය කථාවේ සඳහන් වී තිබෙනව. අපේ ප්‍රදේශවල දුප්පත් කම්කරුවන්ගේ හා ගොවීන්ගේ දරුවන් විශ්ව විද්‍යාලයකට ඇතුළු වුණාට පසු ඔවුන්ට සමහරවිට මුදල් හදල් නැතිකම නිසා ඉතා කරදරකාරී අවස්ථාවලට මුහුණපාන්ට සිදු වෙනව. මුදල් හදල් හිඟ එවැනි ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට රජය මගින් ණය මුදල් ලබා දීමේ ක්‍රමයක් ක්‍රියාවේ යෙදීමට බලාපොරොත්තු වෙනව. එය ඉතා වැදගත් යෝජනාවක්. මේ රටට වැදගත් සේවයක් කරන්ට පුලුවන්කම තිබෙන, හොඳ මොළ ඇති දක්ෂ ළමයින් සිටිනව, දුප්පත්කම නිසා ඔවුන්ගේ සහජ දක්ෂතා පෙන්වන්න ශක්තියක් නැතිව. එම නිසා විශ්ව විද්‍යාලවලට තේරන එවැනි ශිෂ්‍යයන්ට ණය සහනයක් ඇති කිරීමෙන් කලින් තිබුණු දුර්වලකම් මඟහැරී ගම්බද දුප්පත් දරුවන්ට තම සහජ දක්ෂතා පෙන්වමින් මේ රටට වැදගත් සේවයක් කරන්ට පුළුවන් වෙනවාට කිසිම අනුමානයක් නැහැ.

තවත් වැදගත් කාරණයක් තමයි, අඩු වැටුප් ලබන රජයේ සේවකයන්ට මේ අයවැය ලේඛනය මගින් දෙන්ට බලාපොරොත්තු වන සහනය. පහළ මට්ටමේ වැටුප් ලබන රජයේ සේවකයන්ගේ වැටුප කලින් තිබුණාට වඩා වැඩි කර තිබෙනව. ඔවුන්ගේ වාර්ෂික වැටුප් වැඩිවීම කලින් රුපියල් 12ක් ව තිබුණු බව අපි දන්නව. අයවැය ලේඛන කථාවේ සඳහන් අන්දමට එය රුපියල් 36 දක්වා වැඩි වන බව පෙනී යනව. මේ රටේ අඩු වැටුප් ලබන රජයේ සේවකයින් 90,000 කට පමණ එයින් විශාල වාසියක් සිදු වන බව අපි පිළිගන්ට ඕනෑ. රජයේ සේවයේ උසස් නිලධාරීන්ට ඕනෑවටත් වඩා පඩි ලැබෙන බව අපි දන්නව. එමෙන්ම ඉතා අඩු වැටුප් ලබන, තමන්ගේ පවුල නඩත්තු කරන්ටත් අමාරු තත්ත්වයක පසුවන පිරිසකුත් සිටිනව. මේ වැටුප් වැඩි කිරීම නිසා එවැනි උදවියට විශාල සහනයක් සැලසෙන බව මතක් කරන්ට ඕනෑ. මේ ප්‍රශ්න එකින් එක මා මතක් කරන්නෙ මේ අයවැය ලේඛනයේ සඳහන් රා ප්‍රශ්නය පමණක් මතු කරගෙන ඊට විරෝධය පළ කරමින් අයවැය ලේඛනයේ සඳහන් අනිකුත් වැදගත් කරුණු ගැන කිසිම ප්‍රශංසාවක් නොකරන නිසයි.

ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් ක්‍රමය සම්බන්ධයෙනුත්, ඉතා වැදගත් යෝජනාවක් මේ අයවැය ලේඛනයෙන් ඉදිරිපත් වී තිබෙනව. මෙය ගුරුවරුන් බොහෝ කාලයක් තිස්සේ උද්ඝෝෂණය කළ ප්‍රශ්නයක්. ගුරුවරුන් විශාල කොටසක් මේ ප්‍රශ්නය උඩ රජයට ලැදිකමක් දක්වන බව මතක් කරන්ට කැමතියි. ඔවුන් තම බලාපොරොත්තු ඉටුවීමෙන් ප්‍රීතියකින් සිටින බව අපි දන්නව. මා මුලින් මතක කළා වගේ මේ අයවැය ලේඛනය ඉදිරිපත් කිරීමේදී ගරු මුදල් ඇමතිතුමා පාසැල් ශිෂ්‍යයාගේ පටන් ගුරුවරයා දක්වා රජයේ සුළු සේවකයා දක්වා, යනාදි වශයෙන් සෑම තරාතිරමකම පුද්ගලයන් ගැන කල්පනා කර, ඔවුන් පිළිබඳව හැඟීමක් ඇතිව මෙය සකස් කර තිබෙන බව පෙනී යනව.

ඊළඟට බදු අය කිරීම සම්බන්ධවත් වචනයක් කියන්ට ඕනෑ. අය බදු සම්බන්ධයෙන් මේ රටේ ධනපති උදවිය මීට වඩා ඉතා භයානක අන්දමේ බලාපොරොත්තු ඇතිව සිටි බව කවුරුත් පිළිගන්නවා ඇති. එහෙත් සාධාරණ අන්දමට, ක්‍රමානුකූලව, පිළිගන්න පුළුවන් තත්ත්වයකින් බදු වැඩි කර තිබෙන බව මතක් කරන්ට කැමතියි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බණ්ඩාර මයා.]

ඊ ළඟට ගෙවල් බද්ද පිළිබඳව වචනයක් කියන්න ඕනෑ. අපි දන්නවා, මේ රටේ මහජනයට අවශ්‍ය ප්‍රමාණයට ගෙවල් නැති බව. සමහර විට එක පුද්ගලයකුට වුවමනාවට වඩා ගෙවල් තිබෙනවා. එක්සත් ජාතික පක්ෂය මේ රට ආණ්ඩු කරන කාලයේදි නිවාස ණය වශයෙන් ලක්ෂ ගණන් මුදල් ධනපතින්ට දුන්න බවත්, ඒ අය ඒ මුදල්වලින් තට්ටු ගෙවල් සාදා විශාල වශයෙන් කුලී අය කරන බවත් අපි දන්නවා. බොහෝ අය ඉන්න හිටින්න තැනක් නැති නිසා විශාල වශයෙන් කුලී ගෙවාගෙන ඒ තට්ටු ගෙවල පදිංචි වෙලා ඉන්නවා. එක්කෙනකුට එක ගෙයක් තිබුනම හොඳටම ඇති. මේ ගෙවල් බද්ද ඇති කිරීම නිසා ගෙවල් නැති අයට ලොකු වාසියක් සිදු වන අතරම ඒ අය ගෙවල් විකිණීම නිසා ගෙවල් නැති අයට ඒ ගෙවල් ලබා ගන්නත් පුළුවන් වෙනවා. සමහර විට මීට කලින් වැඩිපුර ගෙවල් හැදූ අය මින් පසු ගෙවල් හැදීම අඩු කරන්න පුළුවන්. ඒ ගැනත් සලකා කටයුතු කරන්න ඕනෑ. මේ රටේ නිවාස ප්‍රශ්නය විසඳන්න ඕනෑ. මේ රටේ ජනගහනය ශීඝ්‍රයෙන් වැඩි වේගන යනවා. මහජනයට වාසය කරන්නට නිවාස වුවමනා කරනවා. නිවාස හත් දහස් ගණනක් ඉදි කරන බව අයවැය ලේඛනයෙ සඳහන් වෙනවා. රටට අවශ්‍ය ප්‍රමාණයට නිවාස සපයන්න ඕනෑ. එසේ නොකළොත් නිවාස හිඟයක් ඇති වී අපට ටිකක් කරදර වන්න පුළුවන්. ඒ නිසා ඒ ගැනත් විශේෂයෙන් සලකා බලන්න ඕනෑ.

එක්සත් ජාතික පක්ෂය ආණ්ඩු කළ කාලයේදි වගේ නොවෙයි, හත් අට දෙනාට එකතු වී සමුපකාර සමිති හැටියට හැඩගැසී ණය මුදලක් ලබාගෙන සුදුසු ඉඩමක් ගැනීමට පිළිවෙළක් ඇති කරන්න ඕනෑ. ඊට පස්සෙ විශාල වශයෙන් නොවෙයි, අවශ්‍ය තරමට ගෙයක් සාදා ගැනීමට මුදලක් ලබා දී ගෙයක් සාදා ගැනීමට පහසුකම් සපයා දෙන්න ඕනෑ. එසේ කළොත් එයින් වැදගත් සේවයක් සිදු වේය කියා මම කල්පනා කරනවා.

දුම්කොළ බද්ද පිළිබඳව ගරු මුදල් ඇමතිතුමාගේ කථාවේ සඳහන් වෙනවා. මේ සිගරැට් දුම්කොළ බද්ද පාරිභෝගිකයාගෙන් අය වෙන්නෙ නැහැ. ඒ බද්ද අය වෙන්නෙ කොම්පැනි කාරයන්ගෙන්. නමුත් රාත්තලකට ශත 50 බැගින් දුම්කොළ බද්දක් අය කිරීමේ යෝජනාව අයවැය ලේඛනයෙන් ඉදිරිපත් වුණාට පස්සෙ සිගරැට් එකේ දිග පළලත් අඩු වෙලා තියෙනව වගේ පෙනෙනවා. කොම්පැනි කාරයන් නිතරම උත්සාහ කරන්නෙ මොන උපක්‍රම හෝ යොදා ඔවුන්ගේ වාසිය වැඩි කර ගැනීමටයි. සිගරැට් දුම්කොළ රාත්තලකින් සාමාන්‍යයෙන් සිගරැට් 400 ක්, 450 ක් පමණ සාදන්න පුළුවන්. නමුත් දැන් සිගරැට් දුම්කොළ රාත්තලකින් සිගරැට් 500 ක් පමණ හදන්න පුළුවන්. දැනටම සිගරැට් එකේ ප්‍රමාණය අඩු වෙලා තියෙන බව මට පෙනෙනවා. ඒ නිසා මේ පිළිබඳවත් සැලකිල්ල යොමු කළ යුතු බව මම කියන්න කැමතියි.

ඊ ළඟට අක්කර බද්ද පිළිබඳව වචනයක් කියන්න ඕනෑ. අපේ ප්‍රදේශය විශේෂයෙන් තේ වැවෙන ප්‍රදේශයක්. තේ වතුවලින් අක්කර බද්දක් අය කිරීම පිළිබඳව එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු බොහොම විරුද්ධව කථා කළා. සාමාන්‍යයෙන් තේ වතු අයිතිකාරයන් වෙනුවෙන් උන්නැහෙලා කථා කරන්න ඕනෑ. අපේ ප්‍රදේශවල තියෙන විශාල වැවිල්ල තේ වැවිල්ලයි. මේ අක්කර බද්ද අය කිරීම ඉතාම සාධාරණ බව මම මතක් කරන්න ඕනෑ. විශාල තේ වතු තියෙන අයට විශාල ආදායමක් තියෙනවා. මේ අක්කර බද්ද ගෙවන්න ඔවුන්ට අපහසු වන්නෙ නැහැ. අක්කර 100 ට වඩා වැඩිපුර තිබෙන අයගෙනුයි, මේ අක්කර බද්ද අය කරන්නෙ. අක්කර 125, 150 තිබෙන තේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වතු හිමියොත් මේ සංඛ්‍යාවට අයත් වෙනව. ඒ විධියේ සුළු අයට මේ අක්කර බද්ද නිසා අමාරුවක් වේදෝ කියා මට සැකයක් ඇති වෙනව. විශාල වතු තියෙන උදවියට නම් මේ බද්දෙන් කිසි අමාරුවක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ තේ වතු ගැන කථා කරන විට අපේ ප්‍රදේශයේ මහජනයාගේ රැකීරක්ෂා ප්‍රශ්නය ගැන අපට කථා නොකර ඉන්න බැහැ. එහි තේ වතුවල සේවයේ සිටින්නේ ද්‍රවිඩ ජාතිකයනුයි. අපේ ගම්බද ජනයාට කිසිත් රැකියාවක් කරන්නට ඇත්තේ නැහැ. ඒ ගම්වල ජනතාවගෙන් සියයට එක්කෙන කුවත් රජයේ සේවයේ ඇත්තේ නැහැ. ඔවුන්ට ජීවත් වීමට තිබෙන්නේ අහල පහල තිබෙන වතුවල වැඩ කරලයි. නමුත් ඒ ප්‍රදේශවල තිබෙන අධිරාජ්‍යවාදීන්ගේ වතුවල සේවයට ගන්නේ ද්‍රවිඩයින් පමණයි. අපි ඔවුන්ට විරුද්ධව කථා කරනවා නොවෙයි. නමුත් අපේ ගම්බද සිංහල ජනතාවට රැකියාවක් ඇත්තේ නැති නිසා, රැකියාවක් කරන්නට තිබෙන්නේ වතුවල පමණක් නිසා, ඔවුන්ටත් රක්ෂා දීමට යුතුකමක් තිබෙන බව පෙන්නා දිය යුතුයි. මම මේ ප්‍රශ්නය පිළිබඳව මේ ගරු සභාවේදී බොහෝ අවස්ථාවල කරුණු ගෙන හැර දක්වා තිබෙනවා. ආණ්ඩු පක්ෂයේ රැස්වීම්වලදීත් යෝජනා ආදිය ගෙනවුත් තිබෙනවා. නමුත් තවමත් ඒ පිළිබඳව පැහැදිලි වැඩ පිළිවෙලක් ඇති කර නැහැ. ඒ නිසා අපේ ප්‍රදේශවල සිටින රක්ෂා නැති දුප්පත් ජනතාවට මුහුණ පාන්නට ඇති මේ ප්‍රශ්නය ගැන නිතර නිතරම කරුණු කීමට අපට සිද්ධ වෙනවා. මේ ප්‍රශ්නය විසඳෙන තුරු අපට සෑහීමකට පත් වෙන්නට පුළුවන්කමක් නැහැ. ඔවුන්ට ජීවත් වීමට වෙනත් මාර්ගයක් ඇත්තේ නැහැ. ගොවිතැනක් කරගැනීමට සෑහෙන ඉඩම් නැති නම්, වෙනත් රක්ෂාවක් කරන්නට ඇත්තේත් නැති නම්, ඔවුන්ගේ ජීවත් වීමට යම් කිසි වැඩ පිළිවෙලක් යෙදීම ආණ්ඩුවේ යුතුකමක් බව මගේ බලවත් හැඟීමයි.

ආණ්ඩුව ගුරුවරුන්ට සහනයක් ලබා දෙනවා. වෙනත් රජයේ සේවකයින්ට සහනය ලබා දෙනවා. ඒවා කිරීම හොඳයි. ඒ අතර රක්ෂා නැතිව සිටින ඒ ගම්බද ජනතාවටත් ජීවත් වීමට මාර්ගයක් සලසා දීම ආණ්ඩුවේ යුතුකමක් බව මම අවධාරණයෙන්ම කියා සිටිනවා. මම මීට කලින් කියා ඇති අන්දමට ඒ වතුවල රක්ෂාවලින් සියයට 25 ක් වත් ගම්බද සිංහල ජනතාවට දිය යුතුයි. ඒ සඳහා දැන්වත් වැඩ පිළිවෙලක් සකස් කරන මෙන් මම ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමනි, පාසැල් ශිෂ්‍යයන්ට බස් ගාස්තු සම්බන්ධයෙන් දෙන ලද සහනය ගැනත් මතක් කරන්න කැමතියි. මෙම සහනය සෑම ශිෂ්‍යයකුටම දුන්නොත් එයින් විශාල ආදායමක් නැතුව යනව. එම නිසා මා ඉල්ලා සිටිනවා, එක් එක් පුද්ගලයාගේ ආදායම් තත්ත්වය අනුව ඒ පහසුකම් සලසන ලෙස. සෑහෙන ආදායමක් ලැබෙන රක්ෂාවල යෙදෙන උදවියගේ දරුවන්ට, සෑහෙන ආදායමක් ලැබෙන අයගේ දරුවන්ට, උසස් පංක්තිවල අයගේ දරුවන්ට, මේ පහසුකම නොදී අපේ දුප්පත් ගම්බද ජනතාවගේ දරුවන්ට සහ නගර බද දුප්පත් කම්කරු ජනතාවගේ දරුවන්ට පමණක් මේ සහනය සලසා දෙනවා නම් එය නුවණට හුරුය කියා මම කල්පනා කරනව.

ගරු කථානායකතුමනි, ගෙවල් බද්ද පිළිබඳව මගේ අදහස් දක්වන්නට කැමතියි. මේ කාරණය ගැන අපේ මුදල් ඇමතිතුමා ටිකක් කල්පනා කළා මදි කියල මට හිතෙනව. මගේ කල්පනාවෙ හැටියට කුලියට දී තිබෙන ගෙවලින් ලැබෙන ආදායමෙන්—කුලියෙන්—සියයට 33ක් අර ගැනීමට හැකි වන ලෙස මෙය සංශෝධනය කරනව නම් මම වඩාත්ම සතුටු වෙනව. ඇත්ත වශයෙන් මම මේ කාරණය ගැන කලින් දැන සිටිය නම් මම එතුමාගෙන් ඉල්ලා සිටිනව සියයට තිස් තුනකවත් බද්දක් අය කරන්නය කියා. එසේ කළා නම් විශාල ආදායමක් රජයට ලැබෙන්න පුළුවන් බව ප්‍රකාශ කරන්න සතුටුයි.

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීවරුන් කීප පොලක්ම ප්‍රකාශ කළා මේ අය වැය ලේඛනයෙන් ගොවීන්ට කිසි පහසුකමක් සලසා නැත කියා. ඇත්ත වශයෙන්ම මේ රටේ විශාල සේවයක් කරන පුද්ගලයන් වශයෙන් ගොවියන් හඳුන්වා දෙන්න කැමතියි. අපේ ගම්බද ගොවියා ඉතා වෙහෙස මහන්සි වී, ඇතැම් විට අවුරුද්දකට දෙවතාවක් කුඹුරු වගා කොට රටට අවශ්‍ය සහල් නිපදවමින් විශාල සේවයක් ඉටු කරනව. මේ රටේ ජනතාවට ආහාර ලබා දීමට විශාල මෙහෙයක් ඉටු කරන ඒ ජනතාවට සහනයක් ලබා දීම යුක්ති සහගත බව මා කල්පනා කරනව. පෙන්ෂන් ක්‍රමයක් ඇති කිරීම කෙසේ වෙතත්, ආරෝග්‍ය ශාලාවක ඇඳක් වත් ලබා ගැනීමට පහසුකම් සලසා නැහැ. ඔවුන්ට සිදු වන්නේ ඇඳන් උඩ සිටීමට නොව ඇඳන් යට සිටීමට බව තමුන්නාන්සෙත් පිළිගන්නව ඇති.

රෙදිවලට සීල් ගැසීම සම්බන්ධයෙන් කථා කරන විට විරුද්ධ පාර්ශවයේ ගරු මන්ත්‍රීවරයෙක් ඇසුවා, සීල් ගැසීමෙන් මිළ පාලන ක්‍රමයක් ඇති කරන්නෙ කොහොමද කියා. සීල් ගැසීම පමණක් නොව, කථානායකතුමනි, යාරයෙන් යාරයට මිලත් මුද්‍රණය කරන්න පුළුවනි. එය රෙදි මේ රටට ගෙන්නුවාට පසු අප විසින් කළ යුත්තක් නොව, රෙදි ගෙන්වනු ලබන ඒ ඒ රටවලටම ඇනුම් දුන් විට ඔවුන් විසින් යාරයෙන් යාරයට සීල් සහ මිලත් මුද්‍රණය කර එවනවා ඇති.

ඉඩම් ප්‍රශ්නය ගැන බලන විට එය දැන් ඉතාමත් උග්‍ර තත්ත්වයකට පත් වී ඇති බව අපි පිළිගන්නව. ඉඩම් ප්‍රශ්නය විසඳීම සඳහා පියවර කීපයක් ගන්නට යෙදුණ. නමුත් තවමත් සෑහෙන ප්‍රතිඵල ලැබී නැති බව කනගාටුවෙන් ප්‍රකාශ කරන්න කැමතියි. උඩ රට වතුකරයේ විශාල වතුවලින් සියයට 2 බැගින් ගෙන සිංහල මහජනයා පදිංචි කර ඒ ප්‍රදේශයේ සිංහල ජනපදයක් ඇති කිරීමට ගත් පියවර තවමත් ක්‍රියාත්මක වී නැති බවත් කනගාටුවෙන් සඳහන් කළ යුතුව තිබෙනව. ගම් පළල් කිරීමේ වැඩ පිළිවෙළ යටතේ අකුරණ ඡන්ද කොට්ඨාශයේ අක්කර සිය ගණනක වතු යායවලින් කීපයක් දැනට අවුරුදු 12 කට 15 කට උඩදී පමණ රජයට අයත් කරගෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සිරිසේන මයා.]

තිබෙනව. නමුත් ඒ ඉඩම් තවමත් මහජනතාවට බෙදා දී නැහැ. ඒවායින් ආදායම් ලබන්න ඕනෑය කියා රජයේ වැවිලි සංයුක්ත මණ්ඩලය මගින් ඒවා පාලනය කරනු ලබන බව මම දන්නව. රජයේ වැවිලි සංයුක්ත මණ්ඩලය මගින් පාලනය කිරීමේ වරදක් තිබෙනවය කියා මම කියන්නෙ නැහැ. ආදායම් තිබෙන කොටස් පාලනය කිරීම සාධාරණයි. නමුත් ආදායම් නොලැබෙන නොදියුණු වතු කීපයක්ද ඒ වතු අතර තිබෙනව. ඒ නොදියුණු ආදායම් නොලැබෙන වතු අතුරින් අක්කර සියයක් පමණ වූ යහළුතැන්න වත්ත කැලෑවට ගොස් දූන් කැලෑ ප්‍රදේශයක් බවට පත්ව තිබෙනව. එම නිසා ගම් පළල් කිරීමේ වැඩ පිළිවෙළ යටතේ එම වත්ත ජනතාව අතර බෙදා දෙන්නය කියා මම ඉල්ලනව.

රා කර්මාන්තය ගැනත් වචනයක් දෙකක් සඳහන් කිරීම මා හිතනව මගේ යුතුකමක්ය කියා. ගරු කථානායකතුමනි, රා කර්මාන්තය ගැන මගේ කිසිම විරුද්ධත්වයක් නැහැ. රා බොන අය බීපුවාවෙ. නොබොන අය නොබීපුවාවෙ. නමුත් රා කර්මාන්තය නිසා අනාගතයේදී ඇති වන්නට පුළුවන් යම් යම් සිද්ධීන් ගැන යම් කිසි ප්‍රකාශයක් කර තැබුවොත් අනාගතයේදී මටම සැනීමට පත් වන්නට පුළුවන් නිසා මට පෙනෙන පමණින් ඒ ප්‍රකාශය කිරීමට මම අදහස් කරනව.

ගරු කථානායකතුමනි, සුරාව ඈත අතීතයේ සිටම මේ රටේ තුබුවක් බව අපි පිළිගන්නව. අවුරුදු තුන් හාර සියයකට පමණ පෙර විදේශිකයන් මේ රට ආක්‍රමණය කළාට පසු නොයෙක් රසායන ක්‍රම අනුව සුරා නිපදවීමෙන් සහ පිටරට නිපදවන සුරාව මේ රටේ අලෙවි කර ගැනීමට හැකි වන පරිදි කටයුතු කිරීමෙන් නොයෙකුත් උපක්‍රම යොදා ඔවුන්ගේ ජාවාරම් කරගෙන ගිය බව අපි පිළිගන්න ඕනැ. මේ රටේ නිපදවන සුරාවට තැනක් නොදී, රසායන ක්‍රම අනුව නිපදවන ඔවුන්ගේ සුරා අගය කොට සැලකීමෙන් සහ ඒවා පාවිච්චි කරන උදවිය උසස් කොට සැලකීමෙන්, එවැනි හැඟීම් දීමෙන්, ඔවුන්ගේ ජාවාරම් කර ගත්ත. මෙම පාර්ලිමේන්තු මන්දිරයේ පවා තැබෑරුමක් තිබුණ බව අපි දන්නව. එපමණක් නොවෙයි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ නේවාසිකාගාරයේ පවා තැබෑරුමක් තිබුණ. ඒවා වසා දැමීම සඳහා කටයුතු කිරීමේදී දැන් සුරාවට විරුද්ධව කථා කරන ඔය මන්ත්‍රීවරු කිසි කෙනෙක් පෙරට විත් ක්‍රියා නොකළ බව තමුන්නාන්සේ පිළිගන්නවා ඇති. ඒ තැබෑරුම් වැසීමට පවා ක්‍රියා කළේ අපේ නැසී ගිය ගරු බණ්ඩාරනායක අගමැතිතුමා බව තමුන්නාන්සේ පිළිගන්නවා ඇති. එදා වගේ නොවෙයි, තවත් විපර්යාස කීපයකට රට පරිවර්තනය කිරීමට පියවර තබා තිබෙන මේ අවසථාවේදී සුරා ප්‍රතිපත්තිය පිළිබඳව කිසියම් වෙනසක් කළයුතු නම් එවැනි ක්‍රියා මාර්ගයක් අනුගමනය කළාට පෞද්ගලික වශයෙන් මගේ කිසිම විරුද්ධත්වයක් නැහැ. රා බොන්න වුවමනා කරන පුද්ගලයාට රුපියල් 15 ක බද්දක් අය කර ගසක් මැද ගැනීමට අවසර දීමේ ක්‍රමයකුයි තිබෙන්නෙ. ටික කලක් ගත වන විට මහජනයා උද්ඝෝෂණ ඇති කරයි; රා බොන්නන්ගේ සංවිධාන ඇති කර ගනියි; රා බොන්නන්ගේ වෘත්තීය සමිති ඇති කර ගනියි; ඒ වෘත්තීය සමිති මාර්ගයෙන් රජයට කරුණු ඉදිරිපත් කරයි; එක ගසක් මැද ගැනීමට රුපියල් 15 ක් අය කරනවා නම් අපි රජයට ඊට වඩා වැඩිපුර ආදායමක් ලබා ගැනීමේ මාර්ගයක් පෙන්වන්න කැමතියි, රුපියල් 15 න් පහක් අඩු කර ගසකට රුපියල් 10 බැගින් ගස් දෙකක් මැදගැනීමට අවසර දෙන්න, යනාදී වශයෙන් ඉල්ලීම් ඉදිරිපත් කරයි; තවත් ටික කලක් යන විට රජයට තවත් වැඩියෙන් ආදායමක් ලබා ගැනීමේ මාර්ග ඉදිරිපත් කරයි; ගස් දෙකකට රුපියල් 20 ක් අයකරනවා නම් ගස් තුනක් මැද ගැනීමේ අවසරය සඳහා අපි රුපියල් 24 ක් නැත්නම් 25 ක් ගෙවන්න සූදානම්ය කියා යෝජනා ඉදිරිපත් කරයි. එපමණක් නොවෙයි. රා මැදීමට වුවමනා කරන ගස් බදු ගැනීම සඳහා විශේෂ වරප්‍රසාද ඉල්ලුම් කරනවා ඇති. සියලු දෙනාටම පොල් ගස් නැත, පොල් වතු යායවල් තිබෙන්නේ විශාල ධන කුවේරයින්ටය, අපේ ගම්බද ප්‍රදේශවල ඇතැම් අයට පොල් ගස් නැත, පොල් ගස් තිබෙන්නේ අසවලාගේ ඉඩමේ පමණයි, ඒ නිසා එය රාජසන්තක කර පොල් ගස් ටික අප අතර බෙදා දෙන්නය කියා තවත් ඉල්ලීම් ඉදිරිපත් කරනවා ඇති. එතනින් නතර වෙන්නෙ නැහැ. තව ටික කලක් ගත වන විට, පොල් ගස් මැද ගැනීමට අපට අවසර දී තිබෙනවාය, ඒ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිසා මීට පසු මහා මැතිවරණයකදී අප ඡන්දය පාවිච්චි කරන්නෙ පොල් ගස් මැදීමට අය කරන බද්ද නිදහස් කළොත් පමණය, එසේ බද්ද නිදහස් කරන්ට ඉදිරිපත් වන පක්ෂයට අපේ ඡන්දය පාවිච්චි කරනවාය කියා තවත් මහජන උද්ඝෝෂණයක් ඇති වෙයි. දැන් පොල් ගස් මැදීම නිසා රටේ රා පැතිරී යාමෙන් අනාගතය නරක් වෙන්න ඉඩ තිබෙනවාය, ඒ නිසා මෙය සාධාරණ නැත කියා එක්සත් ජාතික පක්ෂය ප්‍රකාශ කර තිබෙන නමුත් මහමැතිවරණ අවස්ථාවක ඔවුන්ම ඉදිරිපත් වී, පොල් ගස් මැද ගැනීම සඳහා රුපියල් 15 ක් අය කරන බද්ද අපි රුපියල් 5 ක් කරනවාය, ඒ නිසා අපට ඡන්දය දෙන්න කියා වේදිකාවල කථා කරන අවස්ථා ඇති වෙයි. ඒ විධියට සලකා බලන විට රා මැදීමේ ව්‍යාපාරය නිසා අනාගතයේදී වෘත්තීය සමිති මාර්ගයෙන් ඉල්ලීම් රාශියක් රට පාලනය කරන අය වෙත ඉදිරිපත් වීම වළක්වන්න පුළුවන්කමක් ඇති වන්නෙ නැහැ. එපමණක් නොවෙයි. රා බීම වුව මනා නම් උවමනා කරන්නේ ඉතාමත් වෙහෙස මහන්සියෙන් වැඩ කරන අපේ ගොවි කම්කරු ජනතාවට බව අපි පිළිගන්නව. සමහරු ආහාරයක් වශයෙන් රා පාවිච්චි කරනව. තවත් සමහරු ආහාර ටිකක් වැඩිපුර කන්න රා පාවිච්චි කරනව. ඒ අනුව බලන විට, උදේ තේ බොනවා වෙනුවට රා බීමෙන් එය පිරිමසා ගන්න පුළුවන් වේවිය කියා රා පාවිච්චි කරන්ට පටන් ගන්නවා ඇති. පාසැල් ශිෂ්‍යයන්ටත් උදේ තේ වතුර වෙනුවට රා ටිකක් බිල පලයන් කියා දෙමව්පියන් තම දරුවන්ට රා බීම පුරුදු කරන අවස්ථාවකුත් ඇති වෙන්න පුළුවන්. එපමණක් නොවෙයි. පාසැල්වල දුන් දෙන්නෙ කිරි, බනිස්. අර දෙමව්පියන් රා පානයට පුරුදු කළ ශිෂ්‍යයන් කිසියම් අවස්ථාවක උද්ඝෝෂණයක් කරන්න පුළුවනි, අපට කිරි එපා, බනිස් එපා, අපට රා ඕනැය කියා. අනාගතයේදී මෙබඳු ප්‍රශ්න මහත් රාශියකට මුහුණ දෙන්න තිබෙන නිසා කල්පනාකාරීව සැලැස්මක් උඩ විනය ආරක්ෂා වන ආකාරයට මේ රා ක්‍රමය ඇති කරනවා නම් ඊට මගේ කිසිම විරුද්ධත්වයක් නැති බව මතක් කරන්ට කැමතියි.

කථානායකතුමනි, හොරි හැදුණු පුද්ගලයා වේදනාව අඩු කර ගන්න ටිකක් කසනව. කසා ඉවර වූ පසු කැසීම වෙනුවට දැවිල්ල ඇති වෙනව. එවිට දැවිල්ල නවත්වාගන්න බෙහෙතක් සොයා ගෑ විට දැවිල්ල අඩු වී නැවතත් කැසිල්ල ඇති වෙනව, ඒ කැසිල්ල නිසා නැවතත් දැවිල්ල ඇති වෙනව. ඔය අන්දමට කැසිල්ලයි දැවිල්ලයි පවතින්නාක් මෙන්, කසිප්පු ප්‍රශ්නය රාවලින් විසඳන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි. ඉතා කල්පනාකාරීව රටට ගැළපෙන අන්දමට සූරා ක්‍රමය සංවිධානය කරන ලෙස අපේ නුවණැති ගරු මුදල් ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනව.

ගරු කථානායකතුමනි, තවත් කරුණු දෙකක් පමණයි, මා තමුන්නාන්සේ ඉදිරිපිට තබන්ට බලාපොරොත්තු වන්නෙ. මහ ආණ්ඩුව වැය ශීර්ෂ පිරිමසා ගැනීම සඳහා නොයෙකුත් බදු ක්‍රම ඇති කරනව. ඒ බදු ක්‍රම මගින් රජයේ ආදායම පියවා ගන්න නමුත් පළාත් පාලන ආයතන වලට—විශේෂයෙන්ම ගම්කාර්ය සභාවලට—ආදායම් ලබා ගැනීමට කිසිම මාර්ගයක් මේ රජය පෙන්වා දී නැහැ. ඒ සඳහා නීති සකස් කර නැහැ. මීට වඩා ආදායම් ලබා ගැනීමට පහසුකම් පළාත් පාලන ආයතන වලට ලබා දෙන ලෙස මා රජයෙන් ඉල්ලා සිටිනව. ගම්බද පළාත්වල ඇති මෝටර් රථවලින් හා ගුවන් විදුලි යන්ත්‍ර යනාදියෙන් බදු අය කර ගැනීමට පළාත් පාලන ආයතනවලට පහසුකම් සලසා දෙන ලෙස ගරු මුදල් ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනව.

ආදායම් බදු වසන් කරන උදවිය සොයා ගැනීම රජයට විශාල ප්‍රශ්නයක්ව තිබෙනව. ඔවුන් සොයා ගැනීම එතරම් ලෙහෙසි වෙන්නෙ නැහැ. ඒ උදවිය සොයා ගැනීමට විශේෂ පිරිසක් යොදවන්න සිදු වෙනව. තැගි ක්‍රමයක් හෝ ඇති කර එවැනි උදවිය අල්ලා ගැනීමෙන් විශාල ආදායමක් ලබා ගැනීමට පුළුවන් බව පෙනී යනව.

විශාල වශයෙන් අපට සතුටු විය හැකි එක්තරා කරුණක් ගරු මුදල් ඇමතිතුමා මෙවර අයවැය ලේඛනයෙන් ඉදිරිපත් කර තිබෙනව. අපේ ගම්බද ප්‍රදේශවල තිබෙන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සිරිසේන මයා.]

පුවක්වලින් විශාල ආදායමක් ලබාගන්න පුළුවන්කම තිබෙන බව තමුන්නාන්සේලා පිළිගන්නව ඇති. උඩරට හා සබරගමු ප්‍රදේශවල විශාල ආදායම් මාර්ගයක් වශයෙන් මෙය හඳුන්වා දෙන්න පුළුවනි. දැන් අපේ රටේ ගස්වල පුවක් වැටී පැල වෙනව මිස එයින් කිසිම ප්‍රයෝජනයක් ගන්ට පුළුවන්කමක් නැතිව ගොස් තිබෙනව. කරුංකා හා කට්ට පුවක් යනාදිය අපේ පැරන්නන් විසින් ඉන්දියාව ආදී රටවලට විකුණා ගත්ත. දැන් ඒවා කිසිම මිළකට විකුණා ගන්ට බැරිව අපතේ යනව. පුවක්වලින් විශාල ආදායමක් ලබා ගන්ට මාර්ගයක් සකස් කිරීම ගැන මුදල් ඇමතිතුමාට මගේ අවංක ස්තුතිය මේ අවස්ථාවෙදි ප්‍රකාශ කරන්ට කැමතියි.

සුරා බදු දෙපාර්තමේන්තුව ඉවත් කරන්ට කියා අපි උද්ඝෝෂණය කරන මේ අවස්ථාවේදී රා බද්ද නිසා සමහරවිට සුරාබදු නිලධාරීන් විශාල සංඛ්‍යාවක් තවත් වුවමනා වෙයි. ඒ අනුව සලකා බලන විට ගස් බද්දෙන් ලැබෙන ආදායම අළුතෙන් බඳවා ගන්ට සිදුවන සුරාබදු නිලධාරීන්ගේ වියදම පිරිමසා ගැනීමට වත් ප්‍රමාණවත් වන එකක් නැහැ. සුරාවෙන් ලබා ගන්ට අදහස් කරන ආදායම වෙනුවට ගෙවල් හිමියන්ට කුලී වශයෙන් ලැබෙන ආදායමෙන් සියයට 33 ක් අය කර ගැනීමේ ක්‍රමයක් සකස් කිරීමෙන් ලබා ගන්ට පුළුවන්. සමහරවිට ඊටත් වඩා ආදායමක් මේ ක්‍රමයෙන් ලබාගන්ට පුළුවන්.

ගරු කථානායකතුමනි, මීගමුවේ ගරු මන්ත්‍රීතුමා විහාර සන්තක දේපොළ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් මතු කළා. විහාර සන්තක දේපොළවලට විශේෂ වරප්‍රසාදයක් මේ අයවැය ලේඛනයෙන් දී තිබෙන බව එතුමා ප්‍රකාශ කළා. විහාර සන්තක දේපොළ අද ඊයේ ඇති වූ ඒවා නොවෙයි. සිංහල රජ කාලයේ රජදරුවන් විසින් පරිත්‍යාග කරන ලද විහාර සන්තක දේපොළ හා ඉඩ කඩම් පිළිබඳව විශේෂ සැලකිල්ලක් දැක්විය යුතු බව මේ අවස්ථාවේදී මතක් කරන්ට කැමතියි. ඊට පසුවයි, විදේශ රටවලින් වෙනත් ආගම් මේ රටට පැමුණුනේ. ඒ ආගම්වලට අයත් වන්නෙ පුද්ගලයන් විසින් පරිත්‍යාග කරන ලද දේපලයි. ඒ දේපලත් බදුවලින් නිදහස් කරන්න පුළුවන්කමක් තියෙනව නම් ඒ ගැන මගේ විරුද්ධත්වයක් නැහැ.

තව එක ප්‍රශ්නයක් ගැන පමණයි මට මතක් කරන්න තියෙන්නෙ. විහාර ආදී පූජනීය ස්ථානවලට අයත් ගොඩනැගිලිවලින් බද්දක් අය කරනවද කියා ප්‍රශ්නයක් මතු කළා. ගරු කථානායකතුමනි, පූජනීය ස්ථානයක නඩත්තුව සඳහා මාසයකට වුවමනා කරන මුදල කොපමණදැයි සීමාසහිත ගණනක් නියම කරන්න පුළුවන් නම්, ඒ සීමාසහිත මුදලට වඩා ආදායම් ලැබෙනව නම්, ඒ ආදායම ගන්නට කිසි වරදක් නැති බව තමුන්නාන්සෙගෙ මාර්ගයෙන් මුදල් ඇමතිතුමාට ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනව.

අ. භා. 7.30

සුමනපාල දහනායක මයා. (දෙණියාය)

(திரு. ஸுமனபால தகநாயக்க—தெனியாய)

(Mr. Sumanapala Dahanayake—Deniyaya)

ගරු කථානායකතුමනි, ලංකා සමසමාජ පක්ෂයත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එක් වී සභාග ආණ්ඩුවක් ඇති කර ගැනීමෙන් පසු ඉදිරිපත් කරන පළමුවැනි අය වැය ලේඛනයේදී නව මුදල් ඇමතිතුමා අමතර බදු මේ රටේ ජනතාව පිට පටවන්නෙ නැතැයි කියා මේ රටේ ජනතාව බලාපොරොත්තු වුණා. එසේම අළුත් මුදල් ඇමතිතුමාගේ අයවැය ලේඛනයෙන් සෑහෙන සහනයක් ලැබේය කියාත් ඔවුන් බලාපොරොත්තු වුණා. මේ අයවැය ලේඛනයෙන් සමාජවාදය තහවුරු කිරීමට අඩිතාලමක් වැටේය කියාත් ඒ සමගම ඔවුන් බලපොරොත්තු වුණා. ඒ අයුරින් මහජනතාව එදා බලාපොරොත්තු වූ දේ ලබා ගැනීමට—ඔවුන්ගේ බලාපොරොත්තු මුදුන් පමුණුවා ගැනීමට—අවස්ථාවක් මේ අයවැය ලේඛනයෙන් ලබා දුන් නිසා පළමුවෙන්ම ගරු මුදල් ඇමතිතුමාට මගේ ප්‍රශංසාව පළ කරනව.

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරයකු වශයෙන් මේ ගරු සභාවට පැමිණි මට, 1962 අයවැය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලේඛයෙන් මතු වූ අර්බුදයක් නිසා ඒ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් අස් වී මේ පැත්තට ඇවිත් ලංකා සමසමාජ පක්ෂයත් සමග එකතු වී වැඩ කිරීමට සිදු වුණා. ඊට අවුරුදු දෙකකට පසු අද, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, එදා මා මේ පැත්තට ඇවිත් සම්බන්ධ වූ ලංකා සමසමාජ පක්ෂයත් අතර සභාග රජයක් පිහිටුවීමෙන්, මා එදා ගත් තීරණයේ සාධාරණත්වය ඔප්පු වීම නිසා මම අද ප්‍රීතියෙන් මේ අයවැය ලේඛනය සම්බන්ධව වචන ස්වල්පයක් කථා කිරීමට බලාපොරොත්තු වෙනව.

මේ අයවැය ලේඛනයේ සඳහන් කරුණු දෙස බලන විට මෙය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදන්න පුළුවන්. පළමු වැනි කොටස නම් අද හෙටම වාගේ—මේ අවුරුද්ද තුළම—ජනතාවට යම් යම් සහන සැලසීමට ඉදිරිපත් කර ඇති යෝජනායි. අනික් කොටස නම් මේ රටේ ධනේශ්වර ක්‍රමය සම්පූර්ණයෙන් නැති කිරීමට, සමාජ වාදි ක්‍රමය මේ රටේ තහවුරු කිරීමට, රටේ ජනතාවගේ අනාගත ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කර ඇති යෝජනායි.

මේ අයවැය ලේඛනය සම්බන්ධ විවාදය පටන් ගත් දවසේ පළමුවැනි කථාව කළ එක්සත් ජාතික පක්ෂයේ දකුණු කොළඹ පළමුවැනි ගරු මන්ත්‍රීතුමාත් (ජේ. ආර්. ජයවර්ධන මයා.) කථාව ආරම්භ කරමින් මේ අයවැය ලේඛනය කොටස් දෙකකට බෙදා තිබෙනව.

1964 අගෝස්තු 6 වන ද හැන්සාඩ් වාර්තාවේ 1710 වන තීරුවෙහි ඒ මන්ත්‍රීතුමා මෙසේ කියා තිබෙනවා :

"අයවැය ලේඛනයට අදාළ කරුණු ගැන කල්පනා කරන විට ඒවාත් කොටස් දෙකකට බෙදන්න පුළුවන් බව පෙනී යනවා. එනම්, ප්‍රයෝජනවත් ප්‍රතිඵල ලැබෙන කරුණු හා ප්‍රයෝජනවත් ප්‍රතිඵල නොලැබෙන කරුණු යනුවෙනුයි."

මම කලින් පෙන්නූ විදියට අද හෙට ම වාගේ ඉක්මනින්ම ජනතාවට ප්‍රයෝජන ලැබෙන කරුණු සම්බන්ධයෙන් ඒ මන්ත්‍රීතුමාත් එතුමන්ලාගේ පක්ෂයත් සහයෝගය දක්වනවායයි කියා තිබෙනවා. මෙන්න මේ විදියටයි, හැන්සාඩ් වාර්තාවේ සඳහන් වී තිබෙන්නෙ :

"ප්‍රයෝජනවත් ප්‍රතිඵල ලැබෙන කරුණු පිළිබඳව අපේ පක්ෂය සම්පූර්ණයෙන්ම එකඟ වෙනවා. එනම්-ඇතැම් උදවියට ආදායම් බදු සහන ලබා දීම ; ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් ක්‍රමයේ සහනයක් ලබා දීම ; අවුරුදුපතා සුළු සේවකයින්ගේ පඩි වැඩි වීමේ සහනයක් ලබා දීම."

මේ විදියට කියාගෙන ගිහින් මෙසේත් කියනවා :

"එතකොට අයවැය ලේඛනයට ප්‍රයෝජනවත් නැති කරුණු මොනවාද? එකක් නම්, මේ අයවැය ලේඛනයේ තිබෙන අලාභය—deficit එක—නියම මුදල් වස්තුවලින් නම් පියවා ගන්න බැරි වන බව මා කල්පනා කරනවා. එසේ නම් මීට ප්‍රථම යෙන් ඉදිරිපත් කල අයවැය ලේඛනවලින් වාගේම මේ අයවැය ලේඛනයෙන් පසුවත් දිනපතා ජීවන වියදම වැඩි වෙයි; දිනපතා රුකීරක්ෂා ප්‍රශ්නය උග්‍ර වෙයි." [නිල වාර්තාව, 1964 අගෝස්තු 6; 56 කාණ්ඩය, තී. 1715].

කථානායකතුමනි, මේ අයවැය ලේඛනයේ දෙවන කොටස වශයෙන් අපි සලකන්නේ සමාජවාදය කරා යාමට ඉදිරිපත් කර ඇති යෝජනායි. මේ ආණ්ඩුවට සමාජවාදය කරා යන ඉදිරි ගමන ආරම්භ කිරීමට සිදු වී ඇත්තේ ධනේශ්වර අඩිතාලම උඩයි. ඒ නිසයි. නව මුදල් ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ඉතා වැදගත් වන්නේ. අපේ මුදල් ඇමතිතුමා මේ ධනේශ්වර ක්‍රමය සම්පූර්ණයෙන්ම නැති වී යන අන්දමට, නියම සමාජවාදය බිහි වන අන්දමට ඉදිරිපත් කර ඇති යෝජනාවලට දකුණු කොළඹ පළමුවන ගරු මන්ත්‍රීතුමා (ජේ. ආර්. ජයවර්ධන මයා.) විරුද්ධ වීම ඒ තරම් පුදුමයක් නොවෙයි. ඒ ගරු මන්ත්‍රීතුමා රජයේ වෙළඳ සංයුක්ත මණ්ඩලයක් ඇති කිරීම, ගෙවල් බද්ද, තේ අක්කර බද්ද, යන මේවා ජනතාවට ප්‍රයෝජනවත් නැති කාරණා හැටියට හැඳින්නුවා. එවැනි යෝජනාවලින් පමණයි, මේ රටේ ඇති ධනේශ්වර අඩිතාලම සුනු විසුනු කර නියම සමාජවාදය ඇති කළ හැක්කේ. ඒ නිසයි, දකුණු කොළඹ පළමුවන මන්ත්‍රීතුමා ඒවා මහජනයාට ප්‍රයෝජනවත් නොවන යෝජනා හැටියට පෙන්නීමට උත්සාහ ගත්තේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුමනපාල දහනායක මයා.]

මේ යෝජනා ජනතාවට ප්‍රයෝජනවත් නොවන්නේ ද කියා අපි කල්පනා කර බලමු. කොහොමද ඒ යෝජනා ජනතාවට ප්‍රයෝජනවත් වන්නේද කියා සොයා බලන්නෙ ? මේ රට නියම සමාජවාදය කරා ගමන් කරනවා නම්—සමාජවාදී රජයක් ඇති වෙනවා නම්—ඒ ඉදිරියට යන ගමනේදී ධනේශ්වර පන්තියට සැහෙන රිදීමක්, සැහෙන වේදනාවක් ඇති වෙන්න ඕන. අපට පේනවා එවැනි රිදීමක් එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ මේ රටේ සිටින ප්‍රතිගාමීන්ට දැන් ඇති වී තිබෙන බව. එක්සත් ජාතික පක්ෂය මේ රටේ ධනේශ්වර ක්‍රමය ආරක්ෂා කිරීමට ක්‍රියා කරන බව අපි දන්නවා. එතුමා කියනවා මේ යෝජනාවලින් ජනතාවට ප්‍රයෝජනයක් නොලැබෙනවා ය කියල. එහෙත්, සමාජවාදී සැලැස්මක් අනුව, සමාජවාදය රටේ තහවුරු කිරීමට යම්කිසි වැඩ පිළිවෙළක් ගෙන යනවා නම්, ඒ සඳහා යෝජනා තිබෙනවා නම්, හොඳ ප්‍රතිඵල ලැබෙන්නේ කුමන යෝජනාවලින් ද කියා අපි විමසා බලන්න ඕනෑ.

ඒ යෝජනාවලින් රටේ විශාල කොටසකට, සාමාන්‍ය පොදු ජනතාවට විශාල සේවයක් වන බව අපි බය නැතිව කියන්න ඕනෑ. නමුත් දකුණු කොළඹ පළමුවැනි ගරු මන්ත්‍රීතුමා (ජේ. ආර්. ජයවර්ධන මයා.) කීවේ ඒ යෝජනාවලින් රටට ප්‍රයෝජනයක් වන්නේ නැත කියලයි. එහෙම කියන්න හේතුව මොකක් ද ? ඒ යෝජනාවලින් තමයි ඔවුන්ට පාඩුවක් වෙන්නෙ. ඔවුන් මෙපමණ කලක් අනුගමනය කළ දර්ශනයක් මේ යෝජනාවලින් වෙනස් වන නිසා ප්‍රයෝජනයක් නැත කියනව. ගරු කථානායක තුමනි, මේ යෝජනාවලින් රටට යහපතක් වෙනවාය කියා අප විශ්වාස කරනව. එතුමා කී විධියට මීට කලින් තිබුණු අයවැය ලේඛනවලින් වගේ අයවැය පරතරය පියවන්නට අමාරුකමක් මේ අයවැය ලේඛනයෙන් ඇති වෙන්නෙ නැහැ. පසුගිය අයවැය ලේඛනවලින් ආදායම් ලබා ගැනීමේ නොයෙකුත් මාර්ග යෝජනා කළ නමුත් බලාපොරොත්තු වූ ආදායමෙන් බාගයක්වත් නොලැබුණු බව අපි දන්නව. සමහර යෝජනාවලින් කොහෙත්ම ආදායම් ගන්න බැරි වුණා. එහෙත් මේ අයවැය ලේඛනයේ ආදායම් යෝජනා අනුව, ඒවා අය කර ගැනීමට පුළුවන් වීමේ විශිෂ්ඨ ගතිය තිබෙන බව කියන්න ඕනෑ. යම්කිසි යෝජනාවක් තිබෙනවා නම්, ආදායම් ලබා ගැනීමේ මාර්ගයක් තිබෙනවා නම්, ඒ ආදායම ලබා ගැනීමට හැකි වන බව සැකයක් බයක් නැතිව අපට කියන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, මගේ අදහස් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ මේ අයවැය ලේඛනයේ කරුණු සියල්ලම ගැන නොවෙයි, කරුණු කීපයක් ගැන පමණයි. විශේෂයෙන්ම අද දවසේ ඉතාම වැදගත් ප්‍රශ්නයක් හැටියට තිබෙන්නෙ ගරු මුදල් ඇමතිතුමා තේ සම්බන්ධයෙන් පැනවූ අලුත් බද්දයි. මේ තේ සම්බන්ධව බද්ද ඇති කිරීමෙන් අපට එකක් පැහැදිලියි. තේ කර්මාන්තය සම්බන්ධවත්, තේ වෙළඳාම සම්බන්ධවත්, ගරු මුදල් ඇමතිතුමා ඉතාම තියුණු පරීක්ෂණයක් කර තිබෙන බව අපට පෙනෙනවා. මේ රටෙන් පිටරට යවන තේවල තත්ත්වය දවසින් දවස පහත වැටෙන එක—වර්ගයෙන් පහත වැටෙන එක—අප කාටත් කලක සිටම පෙනුණු කරුණක් තමයි. ඒ අනුව තේවල මිල බොහෝ සෙයින් අඩු වුණා. නමුත් ගරු මුදල් ඇමතිතුමා විසින් ඒ තත්ත්වය සහමුලින්ම මගහැරවීමට " ඈඩ්-වැලෝරම් " බද්ද ඉවත් කිරීමෙන් එතුමා තේ කර්මාන්තය සම්බන්ධයෙන් වැදගත් පියවරක් අරගෙන තිබෙනවා. මේ " ඈඩ් - වැලෝරම් " බද්ද අනුව රු. 1.85 කට වැඩියෙන් විකිණෙන සෑම තේ රාත්තලකින්ම සත 50 සිට 70 දක්වා වූ බද්දක් රජයට අය වුණු නිසා, රු. 1.85 හේ මට්ටම තිබුණොත් සැහේවීයයි සෑම නිෂ්පාදකයකුම කල්පනා කළා. ඒ නිසා රු. 1.85 ට වැඩි මිලකට තේ අලෙවි කරන්න ඔවුන් මහන්සි වුණේ නැහැ. එයින් කොටසක් රජයට යන නිසයි එසේ කළේ. තේ කර්මාන්තය විශාල වශයෙන් පවතින ප්‍රදේශයක මන්ත්‍රීවරයකු හැටියට ගරු මුදල් ඇමතිතුමා විසින් ගන්නා ලද පියවර ගැන මා එතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු මුදල් ඇමතිතුමා ලංකාවේ තිබෙන තේ ඉඩම් ගැන පොදුවේ කල්පනා කරන්නේ නැතිව වෙළෙඳ පොළේ තේ අලෙවි වන පිළිවෙළ අනුව සලකා උඩරට, මැදරට සහ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පහතරට යනුවෙන් කොටස් තුනකට ලංකාවේ තේ ඉඩම් වර්ග කර සුදුසු පරිදි බදු නියම කර තිබෙනවා. උඩරට තේ වලට හොඳ මිලක් ලැබෙන බව කවුරුනුත් දන්නවා, ඒ නිසයි, උඩරට ප්‍රදේශයේ අක්කර සියයකට වඩා ඇති තේවතුවලින්, අක්කර සියයෙන් එහා ඇති හැම තේ අක්කරයෙන්ම රුපියල් 300 ක බද්දක් නියම කෙළේ. ඒ අතර මැදරට සහ පහත රට ප්‍රදේශවලදී ඒ බද්ද රුපියල් 60 දක්වා අඩු කළා. මෙවැනි බදු ක්‍රමවලින් තමන්ට කෙළින්ම පහර වදින නිසා එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් නම් මේවාට විරුද්ධයි. කෙසේ වුවත් මේ රටේ ඉදිරි ගමන ගැන සලකා රජය තේ කර්මාන්තය පිළිබඳව ඉතාමත් උනන්දුවෙන් කටයුතු කළ යුතුයි. මේ රටට වැඩිම ආදායමක් ලබා දෙන්නේ තේ කර්මාන්තයයි. නමුත් පසු ගිය අවුරුදු කීපය තුළ අපේ රටේ තේවල මිළ ලෝක වෙළෙඳ පොළෙහි ක්‍රම ක්‍රමයෙන් අඩු වී ගියා. එහෙත් මෙතෙක් කල් ඒ පිරිහීමට පිළියම් යෙදීම සඳහා වැඩ පිළිවෙළක් තිබුණේ නැහැ. අපේ තේ මිළ පහළ බැස්සේ කරුණු කීපයක් නිසා බව අප දන්නවා. එයින් ප්‍රධාන වන්නේ කලකට පෙරදී ඉන්දියාවේ තේ සඳහා අය කරන ලද තීරු ගාස්තු අඩු කිරීමයි. දනට අපේ රටේ තේ රාත්තලක් සඳහා ශත 35 ක තීරුවක් අය කරනවා. ඉන්දියාවේ තේවල තීරු ගාස්තුව ශත 11 කුත් දශම ගණනකින් අඩු කළ විට අපෙන් තේ මිළ දී ගත් රටවල් කීපයක්ම ඉන්දියාවේ තේ ගැනීමට පෙළඹුණා. නමුත් වර්තමාන මුදල් ඇමතිතුමා අපේ තේ තීරුව පිළිබඳව කිසියම් වැඩ පිළිවෙළක් ක්‍රියාවේ යොදවන්නට අදහස් කරන බව දැන ගන්නට ලැබීම බලවත් සතුටට හේතුවක්. අපේ තේ තීරුව ශත 10 කින් අඩු කළහොත් එය විශාල සහනයක් වෙන බව ගරු මුදල් ඇමතිතුමාට මතක් කරන්නට කැමතියි. නමුත් මෙසේ කිරීමෙන් ආණ්ඩුවට සැලකිය යුතු ආදායමක් නොලැබී යන බව අප දන්නවා. එසේ වුවද ඒ පාඩුව පියවා ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රමයක් තිබෙනවා. දනට නියම කර ඇති අක්කර බදු සීමාව අක්කර 50 දක්වා අඩු කොට ඒ බද්ද ක්‍රියාත්මක කළහොත්, තීරුව අඩු කිරීමෙන් සිදු වන පාඩුව මැකී

ගොස් ලාභයකුත් ඇති වන්නට පුළුවනි. වුවමනා නම් බදු මුදලේ වෙනසක් කිරීමටත් පුළුවනි. ඇත්තෙන්ම මැදරට සහ පහතරට අක්කර සියයෙන් වැඩි තේ වතු ඇත්තේ බොහොම ටිකයි. එම නිසා අක්අක්කර 50 න් ඉහළ තේ වතුවලින් ඉඩම් බද්දක් අය කිරීමට ක්‍රියා කළහොත් එයින් විශාල ආදායමක් ලැබෙනවා ඇති. මා කලින් කීවාක් මෙන් වුවමනා නම් බදු මුදල අඩු කරන්නට පුළුවනි. මෙය ක්‍රියාත්මක කළහොත් ශත 10 කින් අඩු කරන තේ තීරුව නිසා සිදු වන පාඩුව මගහැරී ආණ්ඩුවට ලාභයක්ද ලැබෙනවාට සැකයක් නැහැ. මා ඉල්ලා සිටිනව, මේ ගැන කල්පනා කරන්නය කියා.

ඊයේ සභාව විසිර යන අවසථාවෙදීත් මා ඇසුව ප්‍රශ්නයක්, තේ සම්බන්ධව. ඉරාකයෙ බලාපොරොත්තු නැති තත්ත්වයක් ඇති වීම නිසා අපේ පහත රට තේ වලට මරු පහරක් වැදී තිබෙනව. ගිය මාසෙ තේ කර්මාන්ත ශාලාවලට දළු සැපයූ පහත රට සුළු තේ වතු හිමියන්ට ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිදු වී තිබෙනව. ගිය මාසෙ ඔවුන් දුන් අමු දළුවලට මුදල් ලැබේද දන්නෙත් නැහැ. ඊයෙයි අදයි තේ වෙන්දේසිවල තේ ගැනීමට ඉල්ලුම් කළ කිසිවෙක් හිටියෙ නැහැ. සති කීපයක් යන තුරුම මෙම තත්ත්වය පවතීද එසේ නැති නම් මෙම තත්ත්වය තව දුරටත් ප්‍රපාතයට යාද කියන්න බැහැ. විශෙෂයෙන් මේ අවසථාවේදී ගරු ඉඩම් ඇමතිතුමා මෙහි සිටින නිසා මේ ගැන යමක් ප්‍රකාශ කරන්න ඕනැ. රජය මගින් මේ පිළිබඳව ඉක්මන් වැඩ පිළිවෙළක් ගන්න ඕනැ බවයි, එතුමට මතක් කරන්න තියෙන්නෙ. පහත රට සුළු තේ වතු හිමියන් විශාල ප්‍රමාණයකුත් තමුන්නාන්සෙ විසින් බිහි කරන ලද උස් බිම් ජනපදවල වෙසෙන්නන් රාශියකුත් තේ වලින් පමණක් තම ආර්ථික ක්‍රමය හැඩ ගස්වා ගෙන තියෙන බව අපි දන්නව. එම නිසා ඒ මගින් ඔවුන්ට මුදල් ලැබුණොත් පමණයි, වැඩ කටයුතු කර ගන්න හැකි වන්නෙ. තේ අලෙවිය විශාල ප්‍රපාතයකට වැටී තිබෙන නිසා මට හිතෙන්නෙ නැහැ ඔවුන්ගෙ කටයුතු සාර්ථකව කර ගන්න ලැබේවිය කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[සුමනපාල දහනායක මයා.]

කලකට ඉහතත් මේ විධියට තේ මිල පහත බැස්ස. රජයෙ තේ දෙපාර්තමේන්තුව මගින් එදා එක්තරා වැඩ පිළිවෙළක් අනුගමනය කළා. තේ රාත්තලක මිල 1.50 ට වඩා පහත බැස්ස විට 1.50 ගේ මට්ටම තියාගෙන ආණ්ඩුවෙන් සහනාධාර දීමෙ ක්‍රමයක් ඇති කළා. ඒ ක්‍රමය මේ අවස්ථාවෙදීත් ක්‍රියාවෙ යොදවන්නය කියා මා කියන්නෙ නැහැ. ඒ ක්‍රමයෙන් සෑහෙන අන්දමේ දූෂණ ක්‍රියා ඇති වුණු බව අපි දන්නව. නමුත් තාවකාලික වශයෙන් ඒ විධියෙ සහනාධාර ක්‍රමයක් පහත රට තේ නිපදවන්නන් වෙනුවෙන් ආරම්භ නොකළොත් එය රජය මගින් ඉටු කළයුතු යුතුකමක් පැහැර හැරිය වෙනව.

ගරු කථානායකතුමනි, මේ අවස්ථාවෙ සුදුසු නූනත් ගරු ඉඩම් ඇමතිතුමාගෙ අවධානය යොමු කරවන්න කැමතියි, ජනපද ඉඩම් සම්බන්ධව. අපි පිළිගන්නව තමුන්නාන්සෙ ඉදිරිපත් කළ උස් බිම් ජනපද ව්‍යාපාරය—විශෙෂයෙන් දෙණියාය ආසනයෙ ඇති කළ ව්‍යාපාරය—සෑහෙන දුරකට සාර්ථක වී තිබෙන බව. ඒ සම්බන්ධයෙන් තමුන්නාන්සෙට සෑහෙන හොඳ නමක් අපේ පළාතෙ ලැබී තියෙනව. හැබැයි, තමුන්නාන්සෙගෙ අමාත්‍යාංශයට අයිති රජයෙ වැවිලි මණ්ඩලය මගින් පාලනය කරන තේ කර්මාන්ත ශාලාව නිසා නම් තමුන්නාන්සෙගෙ හොඳ නම වැඩි කල් යන්න පෙර නරක් වෙන්න ඉඩ තියෙනව. ගරු මුදල් ඇමතිතුමාගෙ අය වැය ලේඛන කථාවෙ, සංයුක්ත මණ්ඩල පිළිබඳව සඳහන් කර ගෙන යන අවස්ථාවෙදී කිව, සමහර සංයුක්ත මණ්ඩලවලින් ලාබ තියෙන නමුත් සමහර ඒවායින් පාඩු සිදු වී තිබෙන බව. කිසි විස්තරයක් සපයා නැති සංයුක්ත මණ්ඩල දෙකක් ගැනද තුනක් ගැනද කොහේද සඳහන් කළා. ඒවායින් එකක් තමයි, රජයෙ වැවිලි සංයුක්ත මණ්ඩලයත්. මට පේන හැටියට, හිතුවක්කාර වැඩ පිළිවෙළක් තමයි, මෙම සංයුක්ත මණ්ඩලය කර ගෙන යන්නෙ.

දැරංගල තේ කර්මාන්ත ශාලාව විශාල මුදලක් වියදම් කර පිහිටෙව්වෙ ලොකු බලාපොරොත්තු දෙකක් උඩයි. ජනපදවාසීන් නිපදවන තේ දළුවලට සෑහෙන මිලක් ලබා දීමටත්, මොරවක්කෝරළය තුළ තිබෙන තේ කර්මාන්ත ශාලා ඒකාධිකාරය කඩා දමා සුළු තේ වතු හිමියන්ට මේ තේ කර්මාන්ත ශාලාවෙ මට්ටම උඩ සෑහෙන මිලක් ගෙවීමටත් යන පරමාර්ථ උඩයි, එය පිහිටෙව්වෙ. නමුත් අද මොකද වෙලා තියෙන්නෙ ? මෙතන පවතින වැරදි පාලනය නිසා, තේ නිපදවීම සම්බන්ධව, තේ කර්මාන්තය සම්බන්ධව දැනුමක් නැති මිනිසුන් මෙතනට පත් කරනු ලබන නිසා, මෙහි නිපදවන තේ දැන් විකුණන්න සිදු වෙලා තියෙන්නෙ මුළු මොරවක් කෝරළෙම තියෙන හැම කර්මාන්ත ශාලාවකම නිපදවන තේවලට වඩා අඩු මුදලකටයි. පිට ගම්වල සිට මේ ප්‍රදේශයට පැමිණි අය තමයි වැඩි වශයෙන්ම මේ ජනපදවල ජීවත් වෙන්නෙ. ඒ උදවියට ආදායමක් ලැබෙන එකම මාර්ගය තේ දළුයි. එයින් සාධාරණ මුදලක් නොලැබුණොත් ඒ උදවියට කර ගන්න දෙයක් නැතිව යනව. එතකොට තම තමන්ගෙ ගම් රට බලා පිටත් වෙන්නයි වෙන්නෙ. ඒකත් කරන්න බැරි තැනටයි වැටිල තියෙන්නෙ. තේ ජනපදවලට ඒ උදවිය ආවෙ තමන්ගෙ ගම් රටවල තිබුණු සුළු සුළු දේපොල ටිකත් විකුණලයි. ඒ නිසා ආපසු යන්න විධියක් නැහැ. තේ මිල ටිකක් බැස්සත් ඒ මිනිස්සු එකපාරටම උද්ඝෝෂණයක් ඇති කරන්නෙ නැහැ. අවශ්‍ය පහසුකම් සීයේට සියයක්ම ඉෂ්ටවෙලා නැති බවත් ඇත්තයි. ඒ වුණාට වැඩි පෙරළියක් ඇති වෙන්නෙ නැහැ. මා මේ අවස්ථාවේ ඉල්ලා සිටින්නෙ මේ ගැන කල්පනා කර බලා ඉතා ඉක්මනින් රජය මගින් වැඩ පිළිවෙළක් ගන්න ලෙසයි.

තේ සම්බන්ධව කියන අවස්ථාවේ විශේෂයෙන්ම සඳහන් කළ යුතු එක් කාරණයක් මතක් කරන්න බැරි වුණා. මට කියන්න තියෙන්නෙ පහත රට තේ අඩු මිලට විකිණීමට තවත් හේතුවක් තිබෙන බවයි. ඒ, තේවලට බාල තේ එකතු කිරීම නිසයි. එවැනි තත්ත්වයක් ඇති වෙන්නෙ. පෞද්ගලික වෙළෙන්දන් රතු නැටි සහ ෆයිබර් ආදිය එකතු කිරීම ජාවාරමක් හැටියට කරන නිසා හොඳ මිලක් ලැබෙන්නෙ නැහැ. ඒ නිසා පුළුවන් තරම් ඉක්මණින් පහත රට තේ වෙන් දේසියක් අරන් පිටරටවලට පිටත් කර යවා විකුණන වැඩ පිළිවෙළක් යොදන ලෙසත් ආරම්භයක් වශයෙන් පමණක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වත් ඒ පියවර ගන්න ලෙසත් ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනව. අපේ තේ වැඩි මිලක් දී ගන්නෙ නැත්නම් අපට පිට රටවලින් බඩු ගෙන්වන්නත් විධියක් නැති වන තත්ත්වයකට අපට මුහුණ පාන්න සිදු විය හැකි බව කියන්න සිද්ධ වෙලා තියෙනව. ඒ නිසා අපේ තේ ගන්නෙ නැති රටවලින් ගෙන්වන බඩුත් අපට ගන්න පුළුවන් වෙන්නෙ නැහැ. අපේ තේ වැඩි මිලට යම් රටක් ගන්නව නම් ඒ රටවල් සමග ගනුදෙනු කරන්න අප උත්සාහ කරන්න ඕනෑ. මේ කරුණු ගැන ගරු ඇමතිතුමාගේ විශේෂ අවධානය යොමු කරන්න කැමතියි. ඒ සමගම ආදායම් බදු ගැනත් වචන ස්වල්පයක් කථා කරන්න ඕනෑ.

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)
ගරු මන්ත්‍රීතුමා තව කොපමණ වේලාවක් කථා කරන්න බලාපොරොත්තු වෙන වද ?

සුමනපාල දහනායක මයා.
(திரு. ஸுமனபால தகநாயக்க)
(Mr. Sumanapala Dahanayake)
තවත් විනාඩි 15ක් පමණ මට වුවමනා කරනව.

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)
ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට වෙන් කළ කාලය දැන් අවසන් වේගනයි එන්නෙ.

සුමනපාල දහනායක මයා.
(திரு. ஸுமனபால தகநாயக்க)
(Mr. Sumanapala Dahanayake)
ගරු කථානායකතුමනි, මෙතෙක් මා කථා කළේ විනාඩි 25යි.

කථානායකතුමා
(சபாநாயகர்)
(Mr. Speaker)
ආණ්ඩු පක්ෂයට තවත් තියෙන්නෙ පැය තුන හමාරයි.

සුමනපාල දහනායක මයා.
(திரு. ஸுமனபால தகநாயக்க)
(Mr. Sumanapala Dahanayake)
ආදායම් බදු සහන රාශියක් ලැබී තිබෙන බව පෙනෙනව. ආදායම් බදු දෙපාර්තමේන්තුව කොයි තරම් දක්ෂ අන්දමින් සහ කාර්යක්ෂම අන්දමිනුත් වැඩ කරගෙන ගියත් තවමත් සෑහෙන පිරිසක් ආදායම් බද්දෙන් ගැළවිලා ඉන්න බව ගරු මුදල් ඇමතිතුමාට මතක් කර දෙන්න කැමතියි. ආදායම් බදු ගෙවිය යුතු තත්ත්වයෙන් ඉන්න විශාල පිරිසක් ආදායම් බදු නොගෙවා ඉන්නව. දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයෙත්, ගාලු දිස්ත්‍රික්කයෙත් ආදායම් බදු ගෙවන අය ඉන්නෙ හයසිය ගණනයි.

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
(கௌரவ கலாநிதி என். எம். பெரேரா)
(The Hon. Dr. N. M. Perera)
හය දහක් පමණ ඇති ගෙවන්න ඕනෑ අය.

සුමනපාල දහනායක මයා.
(திரு. ஸுமனபால தகநாயக்க)
(Mr. Sumanapala Dahanayake)
එහෙම ඇති කියලයි මාත් හිතන්නෙ. ඒ නිසා පොඩි අදහසක් ඉදිරිපත් කරන්න කැමතියි. දැන් ආදායම් බදු දෙපාර්තමේන්තුවේ ශාඛා කාර්යාල ඇති කරගෙන යනව. එහෙත් ආදායම් බදු ගෙවිය යුතු උදවිය පිළිබඳව විස්තර සොයන නිලධාරි කෙනෙක් නැහැ. ඒ නිසා ආදායම් බදු ගෙවිය යුතු බොහෝ දෙනෙකුට එයින් බේරෙන්න පුළුවන් වෙලා තියෙනව. අපට පසුගිය කාලයේ අත්දැකීම්වලින් පෙනී යනව, ඒ ප්‍රදේශයේ සිටින බොහෝ දෙනකුගේ විස්තර සපයා දෙන්න පුද්ගලයන් පත් කර නැති නිසා මේ විධියේ තත්ත්වයක් ඇති වී තිබෙන බව. විශෙෂයෙන් ඒ ප්‍රදේශවල විස්තර සපයා දෙන්නෙ පළාතේ සිටින දිසාපතිවරු නැත්නම් ආදායම් පාලකවරු. මේ අනුව කල්පනා කර බලා පුළුවන්කමක් තිබෙනවා නම් ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් නිලධාරීන් පත් කර යැවීම සුදුසුය කියා මම කල්පනා කරනව.

එකල්හි වේලාව අ. භා. 8 වූයෙන් කටයුතු අත්හිටුවා විවාදය කල් තබන ලදී.

එතැන් සිට විවාදය 1964 අගෝස්තු 12 වන බදාදා පවත්වනු ලැබේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කල් තැබීම

ஒத்திவைப்பு

ADJOURNMENT

යෝජනාව ඉදිරිපත් කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී: "මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය."—[ගරු සී. පී. ද සිල්වා]

ඩී. බී. ආර්. ගුණවර්ධන මයා.
(திரு. டீ. பி. ஆர். குணவர்தன)
(Mr. D. B. R. Gunawardena)

ගරු කථානායකතුමනි, මුදල් ඇමතිතුමාගේ දැනගැනීම පිණිස මේ කාරණය ඉදිරිපත් කරන්න කැමතියි. අප බොහොම කාලයක සිට වැයම් කළා, මේ ගරු සභාවේ සිටින මැති ඇමතිවරුන්ගේත්, ඔවුන්ගේ පවුල්වල උදවියගේ සහ කිට්ටු නෑදෑයන්ගේත්, රජයේ සේවයේ යෙදී සිටින උසස් නිලධාරීන්ගේත් — ගැසටඩ් ඕෆිසර්ස්ලා කියන කොටසගේ— සම්පූර්ණ වත්කම් ඉදිරිපත් කරන ලෙස කටයුතු යොදන්නය කියා. මම අවුරුදු 11ක පමණ කාලයක් තිස්සෙ යෝජනාවක් වශයෙන් ඒ කාරණය මේ ගරු සභාව ඉදිරියෙ තැබුව. ඒ කාරණය උඩ දීර්ඝ ලෙස සාකච්ඡාත් ඇ තිවුණා. නමුත් කොයි අවස්ථාවකදිවත් එම යෝජනාව සම්මත කරගෙන, තීරණයක් අරගෙන ක්‍රියාවේ යොදවන්නට මේ ගරු සභාව සූදානම් වුණේ නැහැ. තමුන්නාන්සේට මතක ඇති, එක්සත් ජාතික පක්ෂයේ මුදල් ඇමතිතුමා ඉන්න කාලයේදී ඒ යෝජනාව ගැන එතුමා සාකච්ඡා කරන විට රාත්‍රි හත වනතුරුම කථා කර කථාවෙන්ම එය ඉවත් කළ බව. ඒ ගැන තීරණයකට බැසීමට ඉඩ දුන්නෙ නැහැ. ඒ වාගේම ඊට පසුව තිබුණු ආණ්ඩුත් ඒ තත්ත්වයටම වැටුණා. විශෙෂයෙන්ම මෙම කාරණය ඉදිරිපත් කළේ රටේ බොහොම ප්‍රචාරයන් තිබෙනව, මැති ඇමතිවරු වුණාම, මන්ත්‍රීවරුන් වුණාම, උසස් නිලධාරීන් වුණාම ඒගොල්ලන්ගේ මුදල් තත්ත්වය, ඉඩකඩම්වල වටිනාකම බොහොම සීඝ්‍ර අන්දමින් වැඩි වෙනවාය කියා. මේ චෝදනාව මැති ඇමතිවරුන්ට පමණක් නොවෙයි, ඔවුන්ගේ පවුල්වල උදවියට, කිට්ටු නෑදෑයින්ට, එල්ල වෙනව. එමනිසා මේ කාරණය උඩ ගරු මුදල් ඇමතිතුමා මෙන්ම මේ රජය වැඩ පිළිවෙලක් ඉදිරිපත් කරනවාද? විශෙෂයෙන්ම මේ කාරණය මම ඉදිරිපත් කළේ චෝදනා ලැබිය යුත්තන්ට චෝදනා ලබා දීමටත්, අස්ථානයේ එබඳු චෝදනා එල්ලවන උදවිය එයින් නිදහස් කර ගැනීමටත් යන මේ කාරණා උදෙසායි. මෙය ඉතාමත්ම වැදගත් යෝජනාවක් නිසා ගරු මුදල් ඇමතිතුමාට මේ ප්‍රශ්නය ඉතා පහසුවෙන් විසඳන්නට වැඩ පිළිවෙලක් සකස් කරන්න පුළුවනිය කියා මම කල්පනා කරනව. යම්කිසි පෝරමයක් සකස් කර පළමුවෙන් එය මේ මන්ත්‍රී මණ්ඩලයේ මැති ඇමතිවරුන් විසිනුත් ඊළඟට සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයේ මන්ත්‍රීවරුන් විසිනුත් සම්පූර්ණ කර ඉදිරිපත් කරවා ගැනීමට වැඩ කටයුතු යොදනවා නම් ඉතාමත්ම හොඳයි. ඊළඟට, පිළිවෙලින් රජයේ උසස් නිලතලවල සිටින නිලධාරීන්ට, වෙනත් පුද්ගලයන්ට වත්කම් ප්‍රකාශන ඉදිරිපත් කරන ලෙස බල කළ හැකියි. මෙය ඉතාමත් ඉක්මණින් කළ යුතු දෙයක්. ආදායම් දෙපාර්තමේන්තුවෙන් මේ කටයුත්ත කර ගන්න බැහැ. අද බොහොම දෙනෙක් ආදායම් බදු නොගෙවා පැහැර හරිනව. එපමණක් නොවෙයි, ගෙවන්නට තිබෙන ආදායම් බදුවත් ගෙවන්නෙ නැහැ. ඒ සඳහා අවශ්‍ය පෝරම කොළවත් පුරවන්නෙ නැති අය සමහර විට මේ ගරු සභාවෙත් ඇති. එම නිසා මේ ගරු සභාවෙත්, සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයෙත් මන්ත්‍රීන් විසින් පුරවා ඉදිරිපත් කළ යුතුය කියා පෝරමයක් සකස් කළොත් හොඳ බව නැවතත් මතක් කරන්න කැමතියි. මේ කාරණය ගරු ඇමතිතුමා පිළිගන්නවා ඇත කියා අවසාන වශයෙන් මම බලාපොරොත්තු වෙනව.

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
(கௌரவ கலாநிதி என். எம். பெரேரா)
(The Hon. Dr. N. M. Perera)

It is not a question. It is not a matter for me alone. It is a matter that has to be considered by the Government as a whole. If I remember right, some time back there was a Bill but it lapsed due to Prorogation. I do not know; the question will have to be taken up by the Cabinet as to when we can introduce a Bill.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

The only point is that the proposal has always been welcomed by us. One has to remember that it requires a big organization. It is not merely a question of just having a form. You will require a few thousand officers. It will have to include all Members of Parliament, all local government officials, trade union officials and all manner of people. The number of people involved would be a few thousands and you require a separate organization because merely filling a form showing income is not enough unless there is someone to check up and see whether the information is true or not, and follow up subsequently to see whether there is a difference in one year as against another and how the difference has arisen. So a whole organization has to be set up for the purpose. It is not a question of just introducing a Bill for the purpose of saying that every person should send a return of wealth. It is more complicated than merely sending a form. It is a matter that the Government will have to look into.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව ප. ව. 8.7 ට 1964 ජූලි 30 වන දින සභා සම්මතිය අනුව, 1964 අගෝස්තු 12 වන බදාදා පූ. භා. 10 වන තෙක් කල් ගියේ ය.

சபையினது 1964 ஜூலை 30 ஆம் தேதிய தீர்மானத்திற்கிணங்க, பி. ப. 8.7 மணிக்கு, 1964, ஓகஸ்ட் 12 ஆம் தேதி புதன்கிழமை மு. ப. 10 மணி வரை சபை ஒத்திவைக்கப் பெற்றது.

Adjourned at 8.7 p.m. until 10 a.m. on Wednesday, 12th August, 1964, pursuant to the Resolution of the House of 30th July, 1964.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු

வினுக்களுக்கு எழுத்துமூல விடைகள்

WRITTEN ANSWERS TO QUESTIONS

කොළඹ, ලංකා බැංකුවේ ලිපිකරුවෙකු වන ඒ. ද එස්. වික්‍රමතුංග මහතාට ගාල්ලට ස්ථාන මාරුවක් දීම

திரு. ஏ. த எஸ். விக்கிரமதுங்க, இலிகிதர், இலங்கை வங்கி : காலிக்கு மாற்றம்

MR. A. DE S. WICKREMATUNGA, CLERK, BANK OF CEYLON: TRANSFER TO GALLE

22/64

ආචාර්ය ඩබ්ලිව්. දහනායක (ගාල්ල)

(கலாநிதி டப்ளியு. தகனுயக்க—காலி)

(Dr. W. Dahanayake—Galle)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කොළඹ, ලංකා බැංකුවේ ලිපිකරුවෙකු වන ඒ. ද එස්. වික්‍රමතුංග මහතාට, ඔහුගේ භාර්යාව සහ දරුවන් පදිංචිවී සිටින ගාල්ලට ස්ථාන මාරුවක් දීම ලංකා බැංකුවේ කළමනාකරු අසාධාරණ ලෙස ප්‍රතික්ෂේප කරන බව එතුමා දන්නවාද? (ආ) ගාල්ලේ තිබූ සුදුසු පුරප්පාඩුවක් ද්‍රවිඩ ජාතික පිටස්තර පුද්ගලයෙකු ගෙන් පුර වන ලද බවත් වික්‍රමතුංග මහතාගේ ඉල්ලීම ගැන නොසලකා හැර ඇති බවත් එතුමා දන්නවාද? (ඉ) එතුමා මෙම කාරණය ගැන පරීක්ෂාකර බලා යුක්තිය ඉටු කරනවාද?

நிதி அமைச்சரைக் கேட்ட வினு: (அ) கொழும்பிலுள்ள இலங்கை வங்கியில் இலிகிதராகக் கடமையாற்றும் திரு. ஏ. த எஸ். விக்கிரமதுங்கவிற்கு அவரது மனைவியும் பிள்ளைகளும் வசிக்குமிடமான காலிக்கு மாற்றமளிப்பதற்கு இலங்கை வங்கியின் முகாமையாளர் நியாயமற்ற முறையில் மறுக்கிருரென்பதை அவர் அறிவாரா? (ஆ) காலியில் அவருக்குப் பொருத்தமான இடமொன்று தமிழரான வெளியாளர் ஒருவருக்கு அளிக்கப்பட்டதென்பதையும் திரு. விக்கிரமதுங்கவினது கோரிக்கை புறக்கணிக்கப்பட்டதென்பதையும் அவர் அறிவாரா? (இ) இவ்விடயத்தை அவர் கவனித்து நீதி வழங்குவாரா?

asked the Minister of Finance: (*a*) Is he aware that the Manager of the Bank of Ceylon is unreasonably refusing to give Mr. A. de S. Wickrematunga, clerk of the Bank of Ceylon, Colombo, a transfer to Galle, where his wife and children live? (*b*) Is he aware that a suitable place at Galle was filled by an outsider, a Tamil national, and that Mr. Wickrematunga's claims were overlooked? (c) Will he examine this case and do justice?

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා (මුදල් ඇමති)

(கௌரவ கலாநிதி என். எம். பெரேரா—நிதி அமைச்சர்)

(The Hon. Dr. N. M. Perera—Minister of Finance)

(අ) කොළඹ, ලංකා බැංකුවේ ඒ. ද එස්. වික්‍රමතුංග මහතාට ගාල්ලට ස්ථාන මාරුවක් දීම අසාධාරණ ලෙස ප්‍රතික්ෂේප කර නැත. (ආ) වික්‍රමතුංග මහතා ඉල්ලුම් කළ පුරප්පාඩුව පිරවීම සඳහා ද්‍රවිඩ ජාතිකයෙක් නොයවන ලදී. ඒ ස්ථානයට ලංකා මුස්ලිම් ජාතිකයෙක් යවන ලදී. (ඉ) පැන නොනගී.

(அ) கொழும்பு, இலங்கை வங்கியிலுள்ள திரு. ஏ. டி. எஸ். விக்கிரமதுங்க அவர்கள் காலிக்கு வேலை மாற்றம் பெறுவதற்கு நியாயமற்ற முறையில் மறுக்கப்படவில்லை. (ஆ) திரு. விக்கிரமதுங்க காலியில் கேட்ட இடத்திற்கு ஒரு தமிழர் அனுப்பப்படவில்லை. இலங்கை முஸ்லிம் ஒருவர் அனுப்பப்பட்டார். (இ) இக்கேள்விக்கிடமில்லை.

(*a*) Mr. A. de S. Wickrematunga of the Bank of Ceylon, Colombo, has not been unreasonably refused a transfer to Galle. (*b*) A Tamil national was not sent to Galle to fill the place for which Mr. Wickrematunga applied. A Ceylon Muslim was sent. (c) Does not arise.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැසීගිය එම්. චාර්ල්ස් මුදලිරත්න මහතාගේ වැන්දඹු භාර්යාවට ගෙවිය යුතු වන්දි මුදල්

காலஞ்சென்ற திரு. எம். சாள்ஸ் முதலிரத்தின : கைம்பெண்ணுக்குரிய நட்ட ஈடு

LATE MR. M. CHARLES MUDALIRATNE : COMPENSATION PAYABLE TO WIDOW

86/64

ඩී. ජී. එච්. සිරිසේන මයා. (අකුරණ පළමුවන මන්ත්‍රී)

(திரு. டீ. ஜீ. எச். சிறிசேன—அக்குறணை முதலாம் அங்கத்தவர்)

(Mr. D. G. H. Sirisena—First Akurana)

සංස්කෘතික කටයුතු හා සමාජ සේවා ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) නැසීගිය එම්. චාර්ල්ස් මුදලිරත්න මහතාගේ වැන්දඹු භාර්යාවට වන්දි මුදල් ගෙවීම සම්බන්ධයෙන් අකුරණ පළමුවන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා 1963.9.17 වැනි දින මෙම සභාවේදී ප්‍රශ්නයක් ඇසූ බව එතුමා දන්නවාද ? (ආ) මේ කරුණ ගැන සොයා බලා යුක්තිය ඉටු කරන බවට, එවකට සිටි කම්කරු හා සමාජ සේවා ඇමති පොරොන්දු වූ බව එතුමා දන්නවාද ? (ඉ) ඈට වන්දි මුදල් ගෙවීමට එතුමා කටයුතු කරනවාද ?

கலாச்சார விவகார, சமூகசேவைகள் அமைச்சரைக் கேட்ட வினா : (அ) காலஞ்சென்ற திரு. எம். சாள்ஸ் முதலிரத்தினவினது கைம்பெண்ணிற்கு நட்ட ஈடு வழங்குவது சம்பந்தமாய் 17.9.1963 இல் அக்குறணை முதலாவது பாராளுமன்ற உறுப்பினர் இச்சபையில் வினவெழுப்பியதை அவர் அறிவாரா? (ஆ) அப்போதைய தொழில், சமூக சேவைகள் அமைச்சர் அவ்விடயம் பற்றிக் கவனித்து நிவாரணமளிப்பதாக வாக்குறுதியளித்தாரென்பதை அவர் அறிவாரா? (இ) அவருக்கு நட்ட ஈடு வழங்குவதற்கு அவர் நடவடிக்கை எடுப்பாரா?

asked the Minister of Cultural Affairs and Social Services : (*a*) Is he aware that the First Member of Parliament for Akurana raised a question in this House on 17.9.1963, regarding the payment of compensation to the widow of the late Mr. M. Charles Mudaliratne? (*b*) Is he aware that the then Minister of Labour and Social Services promised to look into this matter and do justice? (*c*) Will he take action to pay compensation to her?

ගරු ඩී. එස්. ගුණසේකර (සංස්කෘතික කටයුතු හා සමාජ සේවා ඇමති)

(கௌரவ டீ. எஸ். குணசேக்கர—கலாச்சார விவகார, சமூகசேவை அமைச்சர்)

(The Hon. D. S. Goonasekera—Minister of Cultural Affairs and Social Services)

(අ) ඔව්. (ආ) ඔව්. (ඉ) 60.3.25 වන දින පැවැත්වූ නඩු විභාගයේදී වන්දි ඉල්ලුම්පත්‍රය ඉල්ලා අස් කරගැනීමට ඉල්ලුම්කාරිය එකඟවූ නිසා මෙය පැන නගින්නේ නැත.

(அ) ஆம். (ஆ) ஆம். (இ) எற்படவில்லை—25. 3. 60-ல் நடந்த விசாரணையில் விண்ணப்பதாரர் தமது நட்ட ஈட்டு விண்ணப்பத்தை வாபஸ்பெற்றுக்கொண்டாராகையால் இவ் வினா எழவில்லை.

(*a*) Yes. (*b*) Yes. (*c*) Does not arise as the applicant had withdrawn the application for compensation at the inquiry held on 25.3.60.

මිනින්දෝරු දෙපාර්තමේන්තුව : රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

அளவைப் பகுதி : அரசகரும மொழிப் பிரயோகம்

SURVEY DEPARTMENT : IMPLEMENTATION OF OFFICIAL LANGUAGE

87/64

පී. බී. බාලසූරිය මයා. (ගලිගොමුව)

(திரு. பீ. பி. பாலசூரிய—கலிகொமுவ)

(Mr. P. B. Balasuriya—Galigomuwa)

ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) රජයේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහිලා මිනින්දෝරු දෙපාර්තමේන්තුව දැනට කොතෙක් දුරට ක්‍රියා කර තිබේද ? (ආ) සිංහලෙන් පිළියෙල කර ඉදිරිපත් කරනු ලබන සැලසුම් ප්‍රතික්ෂේප කිරීම මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්තියද ? (ඉ) නොඑසේ නම්, සිංහලෙන් පිළියෙල කරන ලද කෑගල්ලේ ගොඩපොල වත්තේ මැනුම් සැලසුම් ප්‍රතික්ෂේප කරන ලද්දේ මන්ද ? (ඊ) රජයේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට පටහැණිව ක්‍රියා කරන නිලධාරීන්ට විරුද්ධව එතුමා සුදුසු පිළිවෙළ ක්‍රියා කරනවාද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බාලසූරිය මයා.]

காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) அரசாங்கத்தின் அரசகரும மொழிக்கொள்கையை, நில அளவைத் திணைக்களம் இதுவரை எந்த அளவிற் செயற்படுத்தியுள்ளது? (ஆ) சிங்களத்தில் மாத்திரம் சமர்ப்பிக்கப்படுகின்ற மாதிரிப் படங்களை நிராகரிப்பது நில அளவைத் திணைக்களத்தின் கொள்கையா? (இ) அன்றேல், சிங்களத்தில் தயாரிக்கப்பட்ட கேகாலை, கொடப்பொலவத்தையின் நில அளவை மாதிரிப்படங்கள் நிராகரிக்கப்பட்டுள்ளதேன்? (ஈ) அரசாங்கத்தின் அரசகரும மொழிக்கொள்கையை மீறுகின்ற உத்தியோகத்தர்களுக்கெதிராக அவர் தகுந்த நடவடிக்கை எடுப்பாரா?

asked the Minister of Land, Irrigation and Power:—(*a*) What progress has so far been made by the Survey Department in the implementation of the official language policy of the Government? (*b*) Is it the policy of the Survey Department to reject the plans submitted purely in Sinhala? (*c*) If not, why have the survey plans of Godapolawatte in Kegalle, prepared in Sinhala, been rejected? (*d*) Will he take suitable action against the officers who contravene the official language policy of the Government?

ගරු සී. පී. ද සිල්වා (ඉඩම්, වාරිමාර්ග හා විදුලි බලය පිළිබඳ ඇමති හා සභා නායක)

(கௌரவ சீ. பீ. டி சில்வா—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும்)

(The Hon. C. P. de Silva—Minister of Land, Irrigation and Power and Leader of the House)

(අ) සතුටුදායක ප්‍රගතියක් මෙතෙක් සිදු වී ඇති අතර දැනට ප්‍රගතියේ පවතී. (ආ) නැත. (ඉ) ගොඩපොලවත්තේ පිඹුරු ප්‍රතික්ෂේප නොකරන ලද නමුත් ඒවා සිංහල හා ඉංග්‍රීසි යන ද්විභාෂාවෙන් නිකුත් කරන ලදී. (ඊ) මෙය පැන නගින්නේ නැත.

(அ) இதுவரை திருப்திகரமான முன்னேற்றங்கள் செய்யப்பட்டுள்ளன. மேலும் முன்னேற்றங்கள் செய்யப்பட்டு வருகின்றன. (ஆ) இல்லை. (இ) கொடப்பொல சம்பந்தமான மாதிரிப்படங்கள் நிராகரிக்கப்படவில்லை. ஆனால் இவை சிங்களம், ஆங்கிலம் ஆகிய இரு மொழிகளிலும் வினியோகிக்கப்பட்டுள்ளன. (ஈ) இக்கேள்வி எழவில்லை.

(*a*) Satisfactory progress has so far been made and is progressively being made. (*b*) No. (*c*) The plans of Godapolawatta were not rejected but were issued bilingually in Sinhala and English. (*d*) This does not arise.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ, ගාලු මුවදොර මහ ලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කලින් එවිය යුතුය.

1964

சந்தா பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம். தனிப்பிரதி சதம் 30. தபால்மூலம் 45 சதம். முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்.

1964

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00) Half rates for 6 months. Each part 30 cents, by post, 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

1964

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි " ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

இலங்கை, வாழைச்சேனை ஈஸ்ரேண் பேப்பர் மில்ஸ் கோப்பரேஷனால் உற்பத்தி செய்யப்பட்ட காகிதத்தில், இலங்கை அரசாங்க அச்சகத்திற் பதிப்பிக்கப்பெற்றது

Printed at the Government Press, Ceylon, on paper manufactured at the Eastern Paper Mills Corporation, Valaichchenai, Ceylon

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org